(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 6]

# පාර්ලිමේන්තුවේ
# න්‍යාය පුස්තකය

**2012 මැයි මස 22 වැනි අඟහරුවාදා ඇතුළුව එදින සිට**

**නිකුත් කළේ 2012 මැයි මස 11 වැනි සිකුරාදා**

---

## 2012 මැයි මස 22 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0993/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගෑස් සමාගම සීමාසහිත ෂෙල් සමාගමට විකුණනු ලැබූ දිනය කවරේද;

(ii) එලෙස විකුණනු ලැබූ කොටස්වල මිල සහ ප්‍රතිශතය කොපමණද;

(iii) ගෑස් සමාගම විකුණන අවස්ථාවේදී සිටි ජනාධිපතිවරයාගේ නම සහ බලයේ සිටි රජය කවරේද;

(iv) විකුණනු ලැබූ දිනයේ සිට නැවත මිලදී ගත් දිනය දක්වා කාලය තුළ රජයට ලැබුණු ලාභාංශ ප්‍රමාණය කොපමණද;

(v) ෂෙල් ටර්මිනල් සමාගම තුළ රජය සතු කොටස් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සීමාසහිත ෂෙල් සමාගම සතු කොටස් නැවත මිලදී ගැනීම සඳහා රජය විසින් ගෙවනු ලැබූ මිල කවරේද;

(ii) රජය විසින් නැවත මිලදී ගත් කොටස් ප්‍රතිශතය කොපමණද;

(iii) ඉහත සඳහන් නැවත මිලදී ගැනීම සිදු කරන ලද දිනය කවරේද;

(iv) මිල තක්සේරුව සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණි ක්‍රමය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1301/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල හා බෙලිඅත්ත මැතිවරණ කොට්ඨාස දෙකට යාබදව නළගම, විල්ලද්දර නම් වූ ප්‍රදේශයේ වර්ෂ දෙදහසක් තරම් පැරණි නාමයාල විල පිහිටා ඇති බවත්;

(ii) 2005 වර්ෂයේදී මෙම විල සහ අවට ඉඩම් පානීය ජල ව්‍යාපෘතියක් සඳහා රජයට පවරා ගත් බවත්;

(iii) එම ස්ථානයේ තංගල්ල, බෙලිඅත්ත ඒකාබද්ධ ජල යෝජනා ක්‍රමය නමින් ජල ව්‍යාපෘතියක් සඳහා 2005.10.05 දින මුල්ගල් තැබුවද, මේ දක්වා එහි ඉදිකිරීම් කටයුතු සිදු නොවී පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජල ව්‍යාපෘතිය මගින් ජලය සැපයීමට සැලසුම් කර තිබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එහි වැඩකටයුතු කඩිනමින් ආරම්භකොට ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එහි වැඩ ආරම්භ කරන දිනය කවරේද;

(iv) ඊට වැයවන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ජල යෝජනා ක්‍රමය නිසා ඉඩම් අහිමි වූ ජනතාවට ඉඩම් ලබා දීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකසන්නේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1621/'11

3.

ගරු අනුර දිසානායක මහතා,— සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මිහින් ලංකා ආයතනයේ වත්මන් ඉහළ නිලධාරී මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරනු ලබන අය කවුරුන්ද;

(ii) එම එක් එක් නිලධාරියාගේ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) එම නිලධාරීන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලබන වැටුප්, දීමනා හා අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිහින් ලංකා ආයතනයේ 2010 වර්ෂයේ ශේෂ පත්‍රය අනුව රුපියල් බිලියන 5.6ක වත්කම් හිඟයක් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපෑ හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1985/'11

4.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා සහ 2011 වර්ෂය තුළදී මත්පැන් අලෙවිසැල් ආරම්භ කිරීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල සීමාවේදී මත්පැන් බලපත්‍රලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) මත්පැන් අලෙවිකිරීම සඳහා බලපත්‍ර ලබා දීමේ දී අනුගමනය කරන ක්‍රියා පිළිවෙත කවරේද;

(iv) ඉහත අ (i)හි සඳහන් වර්ෂවල මත්පැන් අලෙවිසැල් බලපත්‍ර ලබා දීමෙන් රජය ලද ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මත්පැන් අලෙවි කිරීමේ බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් ඉදිරියේ දී බලපත්‍ර ලබා දිය යුතු යැයි තීරණය කර ඇති ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2000/'11

5.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිමල් පුංචිහේවා නමැති අයෙකු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ තනතුරක් දැරීම ආරම්භ කළ දිනය කවරේද;

(ii) ඔහුගේ උපන්දිනය කවදාද;

(iii) එම තැනැත්තාගේ වයස අවුරුදු 60 ඉකුත් වූ පසුවත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවය කිරීම සඳහා කැබිනට් මණ්ඩල අනුමතියක් ලබාදී තිබේද;

(iv) එසේ නම්, ඒ කවදාද;

(v) එවැනි අනුමතියක් ලබාදී නොමැති නම්, වයස අවුරුදු 60 ඉකුත් වූ දිනයේ සිට මේ දක්වා එම තැනැත්තා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවය කර ඇත්තේ අනීතිකව බව පිළිගන්නේද;

(vi) එසේ නම්, එම තැනැත්තා සම්බන්ධයෙන් ගන්නා ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2017/'11

6.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පූජා භූමි ආශ්‍රිතව අනවසරයෙන් ජීවත්වන පවුල් සඳහා ස්ථිර නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, කවර පූජාභූමි කේන්ද්‍රකර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2031/’11

7\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) විවිධ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයන්හි අනුබද්ධ ආයතන ලෙස හුවා දක්වමින් එම විශ්වවිද්‍යාල නාමයන් යටතේ ක්‍රියාත්මකවන පුද්ගලික අධ්‍යාපන ආයතන රැසක් දැනට ශ්‍රී ලංකාවේ පවතින බවත්;

(ii) රජයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමිවූ සිසුන් විශාල සංඛ්‍යාවක් එම අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීමට උත්සාහ කරන බවත්;

(iii) ඔවුන් අතර වත්පොහොසත්කම් නොමැති සාමාන්‍ය පවුල්වල දරුවන් ද සිටින බවත්;

(iv) එයින් සමහර අධ්‍යාපන ආයතන හුදෙක් මුදල් උපයා ගැනීමේ අරමුණින් පමණක් පවත්වාගෙන යන බවත්;

(v) සමහර ආයතන මගින් කිසිදු පිළිගැනීමක් නොමැති සහතික නිකුත් කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දැනට ශ්‍රී ලංකාව තුළ විවිධ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල නාමයන් යටතේ ක්‍රියාත්මකවන පුද්ගලික අධ්‍යාපන ආයතන පිළිබඳ සංගණනයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එවැනි අධ්‍යාපන ආයතන පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය ගුණාත්මකභාවය හා තත්ත්වය පරීක්ෂාකර විධිමත් ලියාපදිංචියක් ලබාගැනීම අනිවාර්ය කෙරෙන වැඩ පිළිවෙළක් සැකසීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2109/’11

8\.

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල විසින් සීමාසහිත ගලදාරි හෝටල් ලංකා සමාගම, සීමාසහිත ලාෆ්ස් ගෑස් සමාගම සහ සීමාසහිත සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් සමාගම යන සමාගම්වල ලබාගෙන ඇති කොටස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කොටස් ප්‍රමාණයන් මිලදී ගත් දිනයන් කවරේද;

(iii) ඉහත කී කොටස් ගත් මිල කවරේද;

(iv) එම කොටස් මිලට ගත්තේ කවර පුද්ගලයන්ගෙන්ද;

(v) ඉහත කී කොටස් මිලට ගැනීමෙන් පසු විකුණන ලද්දේ නම්, එම එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද්දේ කවර පුද්ගලයින් හටද;

(vi) ඉහත කී එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද මිල කවරේද; සහ

(vii) මෙම ගනුදෙනුවලට සම්බන්ධවූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2156/’11

9\.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ, කිරිමැටිතැන්න ප්‍රදේශයේ පිහිටි පිඟන් ගඩොල් කර්මාන්තශාලාව වර්ෂයක පමණ කාලයක සිට වසා දමා ඇති බවත්;

(ii) එම කර්මාන්තශාලාවෙන් ප්‍රදේශයේ තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවකට රැකියා සපයා තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ආයතනය වසා දැමීමට හේතු කවරේද;

(ii) එම ආයතනය වසා දැමීමේදී සේවය කළ නිලධාරීන්ට හා කම්කරුවන්ට වන්දි මුදල් ගෙවනු ලැබුවේද;

(iii) නොඑසේ නම්, ඊට පදනම් වූ කරුණු කවරේද;

(iv) ප්‍රදේශයේ ජනතාවගේ හා රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා එම කර්මාන්තශාලාව නැවත ආරම්භ කරන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා සැලසුමක් සකසා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1650/’11

10\.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස, අතුරලිය ප්‍රාදේශීය සභාවේ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අතුරලිය සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1740/’11

11\.

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 ජූලි මාසයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) සමස්ත සීනි පරිභෝජනය සහ ඒක පුද්ගල සීනි පරිභෝජනය කොපමණද;

(ii) සමස්ත දේශීය සීනි නිෂ්පාදනය සහ ඒක පුද්ගල සීනි නිෂ්පාදනය කොපමණද;

(iii) ආනයනය කළ සීනි ප්‍රමාණය කොපමණද;

(iv) ආනයනය කළ සීනි ප්‍රමාණයේ වටිනාකම කොපමණද; සහ

(v) සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කරමින්, රජය විසින් සීනි සඳහා ලබා දී ඇති තථ්‍ය සහනාධාර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 සහ 2011 වර්ෂ සඳහා ශ්‍රී ලංකාව තුළ සීනි කිලෝවක නිෂ්පාදන වියදම කොපමණද;

(ii) ආනයනය කරන ලද හා දේශීයව නිෂ්පාදනය කරන ලද සීනි කිලෝවක් සඳහා පනවා ඇති සියලුම බදු (ඍජු සහ වක්‍ර) කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1986/'11

12.
ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රජය සතු පෞද්ගලික සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම්වල නම් සහ ඒවා අදාළ වන අමාත්‍යාංශය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් සමාගම්වල ශ්‍රී ලංකා රජය සතු කොටස්වල ප්‍රතිශතය සහ පෞද්ගලික අංශය විසින් ආයෝජනය කර ඇති කොටස්වල ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පෞද්ගලික ආයෝජකයින්ගේ නම් සහ ලිපිනයන් එක් එක් සමාගම අනුව කවරේද;

(vi) එම එක් එක් සමාගම 2009 සහ 2010 වර්ෂවලදී ලබා ඇති ශුද්ධ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1651/'11

13.
ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලම්පන්න ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්, හිරමඩලගම මධ්‍යම බෙහෙත් ශාලාව වසා දමා ඇති බවත්;

(ii) එම නිසා ප්‍රදේශයේ ජනතාවට දුෂ්කරතා රැසකට මුහුණපෑමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර, මනා තත්ත්වයෙන් තිබියදීත් එම බෙහෙත් ශාලාව වසා දැමීමට හේතු වූ කරුණු කවරේද;

(ii) එම බෙහෙත් ශාලාව කඩිනමින් විවෘත කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1741/'11

14.

ගරු රවී කරුණානායක මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 ජූලි මාසයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) සමස්ත පරිප්පු පරිභෝජනය සහ ඒක පුද්ගල පරිප්පු පරිභෝජනය කොපමණද;

(ii) සමස්ත දේශීය පරිප්පු නිෂ්පාදනය සහ ඒක පුද්ගල පරිප්පු නිෂ්පාදනය කොපමණද;

(iii) ආනයනය කළ පරිප්පු ප්‍රමාණය කොපමණද;

(iv) ආනයනය කළ පරිප්පු ප්‍රමාණයේ වටිනාකම කොපමණද; සහ

(v) සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කරමින් රජය විසින් පරිප්පු ආනයනකරුවන්ට ලබා දී ඇති තථ්‍ය සහනාධාර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 සහ 2011 වර්ෂ සඳහා ශ්‍රී ලංකාව තුළ පරිප්පු කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන වියදම කොපමණද;

(ii) පරිප්පු ආනයනයේදී සහ දේශීය පරිප්පු නිෂ්පාදනයේදී පනවා ඇති සියලුම බදු (සෘජු සහ වක්‍ර) කවරේද?

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1987/'11

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂය වන විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තිබූ සියලුම විශ්වවිද්‍යාල සහ ඒවාට අයත් ආයතනවලට ආරක්ෂක සේවාවන් සැපයීමේ කාර්යය පවරා තිබූ පෞද්ගලික ආරක්ෂක සේවා සැපයුම් ආයතන කවරේද;

(ii) ඉහත එක් එක් ආරක්ෂක ආයතන විසින් ආරක්ෂාව සපයනු ලබන විශ්වවිද්‍යාල සහ ඒවාට අයත් ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2010 වර්ෂය වනවිට එක් එක් විශ්වවිද්‍යාලයෙහි සේවයේ යොදවා සිටි ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව සහ මේ වන විට යොදවා ඇති ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එක් ආරක්ෂක නිලධාරියෙකු සඳහා 2010 වර්ෂයේදී ගෙවන ලද මුදලත් මේ වනවිට ගෙවන මුදලත් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත එක් එක් ආයතනය විසින් මාසිකව ආරක්ෂාව සඳහා වැයකරන මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2012 අප්‍රේල් 18 දිනැති අංක 1754/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.05.10 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය

*2.

සමාජ සේවා අමාත්‍යතුමා,— වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ නියෝග,— 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 17 වැනි සහ 18 වැනි වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 34 වැනි වගන්තිය යටතේ සමාජ සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 මාර්තු 16 දිනැති අංක 1750 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.05.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

පරිසර අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියෝග,— 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 23ව වැනි වගන්තිය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 29 දිනැති අංක 1738/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.05.11 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 3 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 3 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,000,000,000<br>රු. 1,700,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |

| | | | |
|---|---|---|---|
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 4,838,000,000 සිට<br>රු. 5,037,000,000 දක්වා | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 500,000,000 සිට<br>රු. 800,000,000 දක්වා | |

(මෙම නියමය වලංගු වන්නේ 2011.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2012.05.09 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 01002 "අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 7,500,000<br>රු. 12,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2011.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2012.05.09 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 42 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 42 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 25002 "වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා අත්තිකාරම් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.<br>රු. | 4,600,000<br>4,750,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.<br>රු. | 4,600,000<br>4,450,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2011.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2012.05.09 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 43 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 43 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 28502 "කෘෂිකාර්මික ගොවිපල නඩත්තු හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුම් - කෘෂිකාර්මික දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 300,000,000 රු. 355,000,000 | සිට දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 270,000,000 රු. 292,000,000 | සිට දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2011.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2012.05.09 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 44 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 44 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31002 "රජයේ කර්මාන්ත ශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම, රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 120,000,000 රු. 172,000,000 | සිට දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 10,000,000 රු. 31,000,000 | සිට දක්වා |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2011.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2012.05.09 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 45 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 45 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31003 "රජයේ කර්මාන්ත ශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්තශාලාව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000 සිට<br>රු. 345,000,000 දක්වා | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2011.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2012.05.09 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7),— 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 46 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 46 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය ප්‍රචාරණය හා අලෙවිය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,900,000,000 සිට රු. 2,300,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 500,000,000 සිට රු. 900,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2011.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2012.05.09 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 8),— 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(මෙම නියමයන් වලංගු වන්නේ 2011.12.31 වැනි දින දක්වා පමණි.)

## උපලේඛනය
## 2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2010 අංක 20 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2011 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා සංශෝධනය කිරීමේ උපලේඛනය.

| අනුක්‍රමික අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | ii රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | iii රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | iv රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 10301 | 48,670,000 | 238,670,000 | 17,600,000 | 117,600,000 | 200,000,000 | 560,000,000 | 1 |
| 2 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 10601 | - | - | - | - | 10,000,000 | 13,000,000 | 2 |
| 3 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 00501 | 1,256,000 | 1,800,000 | - | - | - | - | 4 |
| 4 | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | 1,686,297,000 | 1,496,297,000 | 1,100,000,000 | 1,000,000,000 | - | - | 5 |
| 5 | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය | 12701 | 27,475,000 | 11,475,000 | 8,500,000 | 2,000,000 | - | - | 6 |
| 6 | තැපැල් දෙපාර්තමේන්තුව | 30801 | - | - | 525,000,000 | 480,000,000 | - | - | 7 |
| 7 | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 17901 | - | - | - | - | 2,000,000 | 20,000,000 | 8 |
| 8 | කම්කරු දෙපාර්තමේන්තුව | 22101 | - | - | - | - | 160,000,000 | 240,754,151.36 | 9 |
| 9 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 32001 | 141,300,000 | 170,000,000 | - | - | - | - | 10 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 11801 | - | - | 8,500,000 | 7,900,000 | - | - | 11 |
| 11 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 15201 | - | - | 7,000,000 | 5,000,000 | - | - | 12 |
| 12 | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 18101 | 1,000,000 | 17,000,000 | - | - | 2,000,000 | 55,500,000 | 13 |
| 13 | විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු) | 00301 | - | - | - | - | 2,000,000 | 5,700,000 | 14 |
| 14 | සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 17601 | - | - | 3,300,000 | 2,008,661 | - | - | 15 |
| 15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ | 25501 | - | - | 34,000,000 | 32,800,000 | 180,000,000 | 190,000,000 | 16 |
| 16 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | 25601 | - | - | 64,000,000 | 57,500,000 | - | - | 17 |
| 17 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල | 27901 | - | - | 32,500,000 | 29,000,000 | - | - | 18 |
| 18 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වවුනියාව | 26601 | - | - | 7,500,000 | 6,700,000 | - | - | 19 |
| 19 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව | 26901 | - | - | - | - | 67,000,000 | 89,000,000 | 20 |
| 20 | ප්‍රවාහන අමාත්‍යාංශය | 11401 | - | - | 4,500,000 | 3,500,000 | - | - | 21 |
| 21 | රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 17301 | - | - | - | - | 2,500,000 | 6,535,000 | 22 |
| 22 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය | 18201 | - | - | - | - | 2,000,000 | 6,000,000 | 23 |
| 23 | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | 14201 | 23,550,000 | 23,050,000 | 12,000,000 | 1,400,000 | 80,000,000 | 26,000,000 | 24 |
| 24 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 20801 | - | - | 5,900,000 | 5,700,000 | - | - | 25 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 25 | සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය | 18001 | - | - | - | - | 2,000,000 | 5,800,000 | 26 |
| 26 | පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය | 18401 | - | - | - | - | 2,000,000 | 3,700,000 | 28 |
| 27 | සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය | 17701 | 1,000,000 | 1,500,000 | 300,000 | 10,900,000 | 2,000,000 | 73,000,000 | 29 |
| 28 | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | 10201 | - | - | 11,000,000 | 8,000,000 | - | - | 30 |
| 29 | තක්සේරු දෙපාර්තමේන්තුව | 25101 | - | - | - | - | 28,000,000 | 60,000,000 | 31 |
| 30 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 23801 | - | - | 1,200,000 | 1,100,000 | 8,000,000 | 9,125,000 | 32 |
| 31 | ජාතික ක්‍රම සම්පාදන දොපාර්තමේන්තුව | 23701 | 7,065,000 | 4,000,000 | - | - | - | - | 33 |
| 32 | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය | 17801 | - | - | - | - | 2,000,000 | 2,750,000 | 34 |
| 33 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | 17101 | - | - | 4,900,000 | 2,800,000 | - | - | 35 |
| 34 | මැතිවරණ දොපාර්තමේන්තුව | 02001 | - | - | 16,000,000 | 13,000,000 | - | - | 36 |
| 35 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 13501 | - | - | 3,200,000 | 3,164,317 | - | - | 37 |
| 36 | තැපැල් සේවා අමාත්‍යාංශය | 10801 | - | - | 2,400,000 | 2,300,000 | - | - | 38 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 37 | වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය | 11701 | - | - | - | - | 25,000,000 | 27,000,000 | 39 |
| 38 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 01301 | - | - | 292,000 | 0.00 | - | - | 40 |
| 39 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 14501 | - | - | 4,000,000 | 3,825,000 | - | - | 41 |
| | එකතුව | | 1,937,613,000 | 1,963,792,000 | 1,873,592,000 | 1,796,197,978 | 776,500,000 | 1,393,864,151.36 | |

අ/ක. මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2012 අප්‍රේල් 18 දින
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*15.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*16.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— “2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*19.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

20.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

21.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2012 මැයි මස 23 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0995/’10

1.

ගරු රවී කරුණානායක මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නීතියෙන් වරදකරුවන් බවට පත්වූ පුද්ගලයන්ට සමාවදීම සඳහා ජනාධිපතිතුමාට බලතල තිබේද;

(ii) එසේ නම්, පසුගිය වර්ෂ තුනක කාලසීමාව තුළ, එලෙස ජනාධිපතිතුමා විසින් සමාව ලබාදුන් පුද්ගලයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ එම පුද්ගලයන් නිදහස් කිරීමට යොදාගත් පදනම කුමක්ද;

(iv) එසේ නිදහස ලබාදුන් අවස්ථාව වනවිට එම එක් එක් පුද්ගලයා කොපමණ කාලයක් සිර දඬුවම් විඳ තිබුණේද;

(v) පසුගිය වර්ෂ තුනක කාලය තුළදී ජනාධිපතිතුමා විසින් සමාව ලබාදී නිදහස්කර යැවූ දේශපාලඥයින් හෝ ඔවුන්ගේ ඥාතීන්ගේ නම් කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1320/'11

2\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම - කල්පිටිය පාරේ, ආලන්කුඩා ප්‍රදේශයෙහි පිහිටි ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ සැලසුම් අංක 2396 යටතේ ලියාපදිංචි කොට ඇති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් ඉඩම් අක්කර හාරසියයක් පමණ ව්‍යාජ ඔප්පු සකසා බාර් රීෆ් රිසෝට්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් හිමි කරගෙන ඇති බවත්;

(ii) මේ වනවිට මෙම ඉඩමෙහි ආලන්කුඩා නමින් සංචාරක හෝටලයක් ඉදිවෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනය විසින් රජයට අයත් ඉඩම් ව්‍යාජ ඔප්පු සකසාගෙන හිමිකාරත්වය ලබා ගන්නා තෙක් ඒ පිළිබඳව රජයේ නිලධාරීන් සොයා නොබැලීමට හේතු කවරේද;

(ii) මෙම ව්‍යාජ ඉඩම් ගණුදෙනුව පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා රජය සතු ඉඩම් නැවත ලබා ගැනීමට පියවර ගන්නේද;

(iii) විධිමත් පරීක්ෂණයක් සිදු කිරීම ආරම්භ කරන දිනය කවරේද;

(iv) ඊට සම්බන්ධ වරදකරුවන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කරන්නේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1735/'11

3\.

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා ලද විදේශීය සිසුන් සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලය හා එක් එක් පාඨමාලාව අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් පීඨයට බඳවා ගත් එම සිසුන් සංඛ්‍යාව ඒ ඒ පීඨයට 2011 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගත් සම්පූර්ණ සිසුන් සංඛ්‍යාවෙන් කවර ප්‍රතිශතයක්ද;

(iii) එම විදේශීය සිසුන් අයත් රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදේශීය සිසුන් ලියාපදිංචි වී ඇති එක් එක් උපාධි පාඨමාලාව වෙනුවෙන් අය කරනු ලැබූ ගාස්තු කවරේද;

(ii) එමගින් ඒ ඒ විශ්වවිද්‍යාලය වෙත ලැබුනු ආදායම කොපමණද;

(iii) එම මුදල් වැය කරනු ලැබූ කාර්යයන් කවරේද;

(iv) එම මුදල් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත ලබා දෙනු ලැබුවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1988/'11

4\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පොලිස් කොමිසම මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) නොඑසේ නම්, එය අක්‍රිය වූ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එකී කොමිසම සඳහා ගොඩනැගිලි පහසුකම් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ස්ථානයේ ලිපිනය කුමක්ද;

(iii) එම ගොඩනැගිල්ලේ හිමිකරු කවුරුන්ද;

(iv) එම ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගෙන තිබේ නම්, එහි මාසික කුලිය කොපමණද;

(v) ජලය, විදුලිය, දුරකථන සහ අනෙකුත් පහසුකම් සඳහා මාසිකව ගෙවනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ජාතික පොලිස් කොමිසමේ සේවය කරන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ වේතන වෙනුවෙන් මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

(iii) ජාතික පොලිස් කොමිසම අක්‍රිය වූ දා සිට මේ දක්වා ඒ වෙනුවෙන් වැයකරන ලද මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1996/'11

5\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේනික සපුෂ්ප ශාක විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් සිංහරාජ ලෝක උරුම වන භූමියෙන් වාර්තාවන සපුෂ්ප ශාක සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට ආවේනික ශාක ගණ සංඛ්‍යාව කොපමණද;

(iv) එයින් සිංහරාජ වන භූමියෙන් වාර්තාවන ශාක ගණ සංඛ්‍යාව කොපමණද;

(v) සිංහරාජ වන භූමියෙන් වාර්තාවන ශ්‍රී ලංකාවට ආවේනික සත්ත්ව විශේෂ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සිංහරාජ ලෝක උරුම වන රක්ෂිතයට පවරා ගැනීමට යෝජිත වනාන්තර භූමියක් හරහා ඉළුඹකන්දේ සිට සූරියකන්දට නව මාර්ගයක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) එකී මාර්ගයේ දුර ප්‍රමාණය කොපමණද;

(iii) එම මාර්ගය ඉදිකිරීම නිසා සිංහරාජ වන රක්ෂිතයේ ශාක සහ සත්ත්ව ප්‍රජාවට අහිතකර බලපෑමක් වන බව පිළිගන්නේද;

(iv) එකී මාර්ගය ඉදිකිරීම වැළැක්වීම සඳහා දැනට ගෙන ඇති පියවර කවරේද;

(v) ඉහත මාර්ගය ඉදිකිරීම නිසා දැනට සිදුවී ඇති හානිය අවම කිරීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2015/'11

6.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග නිසා 2010 වර්ෂයේදී, සිදුවූ පුද්ගල මරණ සංඛ්‍යාව කොපමණද;

(ii) එම වර්ෂය තුළ දී දුම්රිය අනතුරු හේතුවෙන් ආබාධිත වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මෙම මරණ හා අනතුරු වලක්වාලීම සඳහා ගතහැකි පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2157/'11

7.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි, රංවල රජයේ රෝහල වැසී යාමේ තර්ජනයට ලක්ව ඇති බවත්;

(ii) එම රෝහලේ වෛද්‍යවරුන්ගේ සහ සෙසු කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ හිඟයක් පවතින බවත්;

(iii) දැනට එහි සේවය කරනු ලබන්නේ එක් වෛද්‍යවරයෙක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම රෝහලේ ප්‍රතිකාර ලබන රෝගීන් සංඛ්‍යාවේ සාමාන්‍යය නේවාසික හා බාහිර වශයෙන් කොපමණද;

(ii) එම රෝහලට අනුමත වෛද්‍යවරු සහ සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) රංවල රජයේ රෝහල වත්මන් තත්ත්වයට පත්වීමට හේතු කවරේද;

(iv) එම රෝහල සඳහා අවශ්‍ය වෛද්‍යවරු සහ කාර්ය මණ්ඩලය කඩිනමින් ලබා දීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඊට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2262/'12

8.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය අවසාන වනවිට ශ්‍රී ලංකාවේ වාර්තා වූ හදවත් රෝගීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) හදවත් සැත්කම් සිදුකරන රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම රෝහල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් රෝහල්වලින් හදවත් සැත්කම් සිදු කරගැනීමේ අපේක්ෂාවෙන් පොරොත්තු ලේඛනගතව සිටින රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝගීන් පොරොත්තු ලේඛනවලට ඇතුළත්ව ඇති වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2267/’12

9.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට ක්‍රීඩා ගම්මානය පිහිටුවීමට තෝරා ගෙන ඇති ප්‍රදේශය කවරේද;

(ii) එම ක්‍රීඩා ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා අවතැන්වන පවුල් සංඛ්‍යාව, අහිමිවන වැව් සංඛ්‍යාව හා කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) අවතැන්වන ගොවි පවුල් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1652/’11

10.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කවල වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව සේවයේ නිරතවන පාසල් අනධ්‍යයන සේවකයින්ගේ සේවය මෙතෙක් ස්ථිර කර නොමැති බවත්;

(ii) වර්ෂ 2005 සහ 2008 වර්ෂවලදී බඳවා ගෙන ඇති මෙම පිරිස මේ දක්වා සුළු දෛනික වැටුපකට සේවය කරනු ලබන බවත්;

(iii) එම තත්ත්වය යටතේ ඔවුන් ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම අනධ්‍යයන සේවක පිරිස ස්ථිර කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබියදීත් ඔවුන්ගේ සේවය ස්ථිර නොකිරීමට හේතු කවරේද;

(ii) එම හේතු මගහරවා ඔවුන් ස්ථිර සේවක පිරිසට අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1742/'11

11.

ගරු රවි කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 ජූලි මාසයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී හා එක් එක් මාසයේදී,

(i) මුළු සහල් පරිභෝජනය සහ ඒක පුද්ගල සහල් පරිභෝජනය කොපමණද;

(ii) සමස්ත දේශීය සහල් නිෂ්පාදනය සහ ඒක පුද්ගල සහල් නිෂ්පාදනය යල සහ මහ කන්නවලදී, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ආනයනය කළ සහල් ප්‍රමාණය කොපමණද;

(iv) ආනයනය කළ සහල් ප්‍රමාණයේ වටිනාකම කොපමණද; සහ

(v) සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කරමින් සහල් ආනයනකරුවන්ට සහ වී වගාකරුවන්ට රජය විසින් ලබා දී ඇති සැබෑ සහනාධාර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 සහ 2011 වර්ෂවලදී ශ්‍රී ලංකාව තුළ සහල් කිලෝවක නිෂ්පාදන වියදම කොපමණද;

(ii) වී වගාවේ නියුතු පවුල් සංඛ්‍යාව කොපමණද; සහ

(iii) ආනයනය කළ සහ දේශීයව නිෂ්පාදිත සහල් කිලෝවක් සඳහා පනවා ඇති සියලුම බදු (ඍජු සහ වක්‍ර) කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2008/'11

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 වර්ෂයේදී පාකිස්තානු ක්‍රිකට් කණ්ඩායම ශ්‍රී ලංකාවට පැමිණි දිනය හා ශ්‍රී ලංකාවෙන් පිටවූ දිනය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සංචාරයේදී ප්‍රවාහන කටයුතු සඳහා කිසියම් ආයතනයකින් හෝ ආයතනවලින් වාහන ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ලබා ගත් එම වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම සංචාරයේදී ප්‍රවාහන සේවා සැපයීම සඳහා ආයතන තෝරා ගත් ක්‍රමවේදය කවරේද;

(ii) ඒ සඳහා මිල ගණන් කැඳවීමක් කර තිබේද;

(iii) එසේ නම්, මිල ගණන් කැඳවන ලද ආයතනවලට පරිබාහිරව වෙනත් ආයතන ප්‍රවාහන කටයුතු සඳහා යොදාගෙන තිබේද;

(iv) එසේ නම්, එම ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1653/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්ඩකුලම සහ කදුරුගස්වැව යන ගම්මානවලට පානීය ජල පහසුකම් ලබාදීම සඳහා මීට වර්ෂ කිහිපයකට පෙර ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) එම ප්‍රජා ජල ව්‍යාපෘතිය,

(i) ඉදිකිරීම ආරම්භ කළ දිනය කවරේද;

(ii) ඉදිකිරීම අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) නිමකිරීම සඳහා වැය කිරීමට අපේක්ෂිත මුළු මුදල කොපමණද;

(iv) ඉදිකිරීම සඳහා විදේශීය අරමුදල් යොදා ගනු ලැබුවේ නම්, එම අරමුදල් ලබා දුන් ආයතන හෝ ආයතනය කවරේද;

(v) දේශීය අරමුදල් සපයාගන්නා ලද්දේ නම්, ඒ සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වන විට ඉදිකිරීම් කටයුතු නවතා දමා ඇති ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු කඩිනමින් අවසන් කර ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරාලීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1743/'11

14.

ගරු රවි කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 ජූලි මාසයේ සිට මේ දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂයේදී, එක් එක් මාසයේදී,

(i) සමස්ත ටින් මාළු පරිභෝජනය සහ ඒක පුද්ගල ටින් මාළු පරිභෝජනය කොපමණද;

(ii) සමස්ත දේශීය ටින් මාළු නිෂ්පාදනය සහ ඒක පුද්ගල ටින් මාළු නිෂ්පාදනය කොපමණද;

(iii) ආනයනය කළ ටින් මාළු ප්‍රමාණය කොපමණද;

(iv) ආනයනය කළ ටින් මාළු ප්‍රමාණයේ වටිනාකම කොපමණද; සහ

(v) සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කරමින් ටින් මාළු සඳහා රජය විසින් ලබා දී ඇති තථ්‍ය සහනාධාර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ටින් මාළු ආනයනය සඳහා පනවා ඇති සියලුම බදු (ඍජු සහ වක්‍ර) කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2009/'11

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, රන්මිහිතැන්න සිනමා ගම්මානය ඉදිකර ඇති භූමියේ අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එය විවෘත කරන ලද දිනය කවරේද;

(iii) විවෘත කළ දින සිට අද දක්වා එම සිනමා ගම්මානය සිනමාපට සහ ටෙලි නාට්‍ය රූපගත කිරීමට භාවිතා කරන ලද එක් එක් අවස්ථාවේදී එම ආයතනය වෙත ලැබුණු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රන්මිහිතැන්න සිනමා ගම්මානයේ රූ ගත කරන ලද ටෙලි නාට්‍ය හෝ සිනමාපට කවරේද;

(ii) එම එක් එක් නිර්මාණයේ අධ්‍යක්ෂ, නිෂ්පාදක හෝ නිෂ්පාදනයට සම්බන්ධවූ සමාගම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 මැයි මස 24 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1063/'11

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) චීනය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියා සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සහයෝගීතාව සඳහාවූ ජපාන බැංකුව සහ යුරෝපා සංගමය යනාදී රටවල් සහ ආයතන විසින් පසුගිය වර්ෂ 15 තුළ ලබාදී ඇති ණය හෝ ප්‍රදාන වෙනුවෙන් එකී ණය මුදල් හෝ ප්‍රදානයන් ගෙවා නිමවෙන දිනය වන විට ගෙවිය යුතු සමස්ත මුදල් ප්‍රමාණය ඇ.එ.ජ. ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එකී ණය මුදල් ආපසු ගෙවීමේ සාමාන්‍ය කාලසීමාව එක් එක් රට හෝ ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1322/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, කරන්දෙණිය මැතිවරණ බල ප්‍රදේශයේ පිහිටි, අනුරුද්ධගම ජනඋදාන ගම්මානය 1999 වර්ෂයේදී ජනතා අයිතියට පැවරූ බවත්;

(ii) මෙම ගම්මානයේ නිවාස බහුතරයක හිමිකරුවන් මේ දක්වා එම නිවාසවල පදිංචිවී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඔවුන් එම නිවාසවල පදිංචි නොවීමට හේතුව කවරේද?

(ඇ) (i) අනුරුද්ධගම ජනඋදාන ගම්මානයේ නිවාස පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා, ප්‍රදේශයේ නිවාස නොමැති දිළිඳු පවුල් සඳහා අත්හැර දමා ඇති නිවාස ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1448/'11

3.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජනාධිපතිතුමා යටතේ දැනට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව,

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1997/'11

4.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2004.07.22 දිනැති අංක PS/CS/26/2004 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව සිංහරාජ ලෝක උරුම වන භූමියට යාව, එහි සිට කිලෝමීටර් 1/2 ක දුර ප්‍රමාණය තුළ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් සියලුම වනාන්තර ඉඩම් 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22 (1) (ඊ) සහ 44(එ) වගන්ති අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරීම සඳහා නිර්දේශ කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව කටයුතු කර තිබේද;

(ii) එකී අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව හෙක්ටයාර් 2508.4ක වනාන්තර බිම් ප්‍රමාණයක් සිංහරාජයට අලුතින් එකතු කිරීමට නියමිතව තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2020/'11

5.

ගරු දයාසිරි ජයසේකර මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේදී පවත්වන ලද බන්ධනාගාර ජේලර් - දෙවැනි පංතිය සහ සුබසාධක නිලධාරී - දෙවැනි පංතිය තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තනතුරු සඳහා වන පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එකී පුරප්පාඩු සඳහා උක්ත තරග විභාගයේ ප්‍රතිපල මත මේ වන විට බඳවා ගැනීම් සිදුකර තිබේද;

(iv) එසේ නම්, බඳවා ගත් අවම ලකුණු සීමාව කවරේද;

(v) ඉහත පරිදි බඳවාගත් අයගේ නම්, ලිපිනයන් සහ ලබාගත් ලකුණු ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එකී තරග විභාගයේ ප්‍රතිපල පදනමට අමතරව වෙනත් පිරිස් බඳවා ගෙන තිබේ නම්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(vii) එසේ බඳවා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2181/'11

6.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොවිජන සේවා හා වන ජීවී අමාත්‍යාංශය යටතේ ඇති යම් ආයතනයක් මගින් මෙතෙක් හීලෑ කර ඇති වන අලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඉදිරියේදී හීලෑ කිරීමට හඳුනා ගෙන ඇති වන අලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අලි - මිනිස් ගැටුම් මර්ධනය කිරීමට අමාත්‍යාංශය විසින් දැනට ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

(ii) වන අලි හීලෑ කිරීමට සහ අලි - මිනිස් ගැටුම් වැළැක්වීම සඳහා සේවයේ යොදවාගෙන ඇති නිලධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2268/'12

7.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාව තුළ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කෙරෙන වාරි යෝජනාක්‍රම සංඛ්‍යාව කොපමණද?

(ආ) (i) වර්ෂ 2005 සිට 2010 දක්වා වාරි පුනරුත්ථාපනය යටතේ වැව් නඩත්තු කිරීම සඳහා එම දෙපාර්තමේන්තුව වැයකර ඇති මුදල එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ අනුව එක් එක් වර්ෂය සඳහා ප්‍රමාණවත් මුදලක් වැය කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1468/'11

8.

ගරු අජිත් කුමාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පරිසර අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1654/'11

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවට අයත් ගහ පළාත එච්. එම්. පී. බණ්ඩා අනුස්මරණ පුස්තකාලය දැනට වර්ෂයක පමණ කාලයක සිට වසා දමා ඇති බවත්;

(ii) එම පුස්තකාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් වහලය, දොර ජනෙල් සහ විදුලි රැහැන් පද්ධතිය දැඩි සේ විනාශ වී ඇති බවත්;

(iii) පුස්තකාලය වසා දැමීම නිසා දහසකට අධික පාඨකයින් පිරිසකට පොත පත කියවීමට ඇති අවස්ථාව අහිමිවී ඇති බවත් ;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කඩිනමින් එම පුස්තකාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කොට පාඨකයින්ගේ අයිතියට පවරාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1744/'11

10.

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින්, ඛනිජ තෙල් ආනයනය කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය කවරේද;

(ii) ඉහත කී ක්‍රියාවලිය අනුමත කරන නිලධාරියා කවරෙක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 ජූනි මස අග සිට ජූලි මස මැද දක්වා වූ කාල පරිච්ඡේදය තුළ තත්ත්වයෙන් බාල පෙට්‍රල් ආනයනය කිරීමට අවසර ලබාදීම;

(ii) තත්ත්වයෙන් බාල පෙට්‍රල් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේදී සිදු කරන ලද මූලික තත්ත්ව පාලන පරීක්ෂණයේ නියමයන් සම්පූර්ණ කිරීම; සහ

(iii) ඉන් අනතුරුව, අපේක්ෂිත මට්ටම්වලට ගුණාත්මක තත්ත්වය නොමැති බව තහවුරු කරමින් එම තත්ත්වය වෙනස් කිරීම;

සිදුවූයේ කෙසේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) තත්ත්වයෙන් බාල පෙට්‍රල් භාවිතා කිරීම නිසා හානියට පත් වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම වංචාවට සම්බන්ධ වූ පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) ඉහත කී වංචාව හේතු කොටගෙන බදු ගෙවන්නාට දැරීමට සිදු වූ පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2004/'11

11.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2005 සිට 2008 දක්වා සහ 2011.01.01 දින සිට 2011.09.01 දින දක්වා කාල සීමාව තුළදී කලුතර දිස්ත්‍රික්කය තුළ ලබා දෙන ලද මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2010 වර්ෂය සඳහා කලුතර දිස්ත්‍රික්කය තුළ මත්පැන් බලපත්‍ර ලබාදුන් තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2021/'11

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට සිටින ත්‍රිවිධ හමුදා රණවිරු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) 2011 අයවැය යෝජනාවක්වූ රණවිරු පවුලක උපදින තුන්වන දරුවාට රුපියල් ලක්ෂයක දීමනාවක් ලබා දීමේ යෝජනාව යටතේ මේ වන විට එම දීමනා ලබා දීමට හඳුනාගෙන ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර තෙවන දරුවකු හිමිව සිටි රණවිරු පවුල් වෙත එම ප්‍රතිලාභ ලබා දෙන්නේද;

(iv) මේ වන විට එකී දීමනාව ලබා දී නොමැති නම්, එය ලබා දීම ආරම්භ කරන දිනය කවරේද;

(v) එම දීමනාව ලබාදීම කොපමණ කාලයක් දක්වා ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1655/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පන්විල, අලවතුගිරිගම පිහිටි මහනුවර රාජධානි යුගයට අයත් පුරාණ විහාරස්ථානයේ පුරාවස්තු වර්ෂ ගණනාවක සිට විනාශ වෙමින් පවතින බවත්;

(ii) පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිලධාරීන් එම පුරා වස්තු ආරක්ෂා කිරීමට පියවර ගන්නා බවට ප්‍රකාශ කර වර්ෂ ගණනාවක් ගතවී ඇතත් මේ දක්වා ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම විහාරස්ථානය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පරීක්ෂාකර තිබියදීත් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොකිරීමට හේතු කවරේද;

(ii) එම විහාරස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු ඉදිරියේදී ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1745/'11

14.

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටි 2011 ක්‍රිකට් ලෝක කුසලාන ලේකම් කාර්යාලය සඳහා පත්කරන ලද ලේකම්වරයාගේ නම කුමක්ද;

(ii) එම පත්කිරීම කරන ලද්දේ කවරෙකු විසින්ද;

(iii) එම තනතුරට පත්කිරීම සඳහා වෙනත් පුද්ගලයන් සලකා බලනු ලැබුවේද;

(iv) එසේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ක්‍රිකට් ලෝක කුසලාන ලේකම් කාර්යාලයේ ලේකම් තනතුරකට පවරා ඇති බලතල කවරේද;

(ii) එම තනතුරට පවරා දී තිබූ බලතල ඔහු විසින් නිසි ලෙස ක්‍රියාත්මක කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2022/'11

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, ගනේවත්ත පොතුවාගොන්න මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) කාපට් ඇතිරීම හෝ වෙනත් ආකාරයකින් ප්‍රතිසංස්කරණය කරනු ලබන එම මාර්ගයේ පළල හා දුර ප්‍රමාණය කොපමණද;

(iii) එම මාර්ගයට අදාළ ඇස්තමේන්තුව අනුව ඉදිකළ යුතු පාලම් සහ බෝක්කු සංඛ්‍යාව කොපමණද;

(iv) පොතුවාගොන්න මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා ඉඩම් අත්පත් කරගෙන ඇත්නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව ලබා දීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළේද;

(ii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම ටෙන්ඩරය ලබා දුන් අයගේ නම සහ ලිපිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට පෙර පැවති පළල කොපමණද;

(ii) මාර්ගය සාදා නිම කළ පසු ඒ සඳහා වියදම් වූ සමස්ත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 මැයි මස 25 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1064/'11

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2009, 2010 වර්ෂවලදී සහ 2011 වර්ෂයේ මේ දක්වා ලැබී ඇති සමස්ත ණය සහ ප්‍රදානයන්ගේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් අයුරින් ලැබුණු ණය සහ ප්‍රදානයන් යොදගනු ලැබූ ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් අයුරින් ලබාගත් එක් එක් ණය මුදලට අදාළව,

(i) සියල්ල ඇතුළත් සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

(ii) ණය කාලසීමාව කොපමණද;

(iii) ණය කාලසීමාව අවසානයේදී ගෙවා ඇති සමස්ත පොලිය සහ ණය ගාස්තුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1167/'11

2.

ගරු අනුර දිසානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2009 වර්ෂයේදී අයි. ඕ. සී. (IOC) නමැති ඉන්දියානු සමාගමට බදු නිදහස් පදනමින් ඉන්ධන පිරවුම් හල් 100 ක් ලබා දී තිබේද;

(ii) එම ඉන්ධන පිරවුම්හල්වලින් රජයට බදු ගෙවිය යුතු වන්නේද;

(iii) එසේ නම්, 2006, 2007, 2008 සහ 2009 වර්ෂවලදී රජයට ගෙවන ලද බදු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉන්ධන පිරවුම්හල්වලින් ගෙවීම පැහැර හරින ලද බදු රජයට ගෙවන ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අයි. ඕ. සී. සමාගම වෙත දන්වා තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම සමාගම බදු ගෙවිය යුතු නැති බව ආයෝජන මණ්ඩල සභාපතිවරයා විසින්ම නැවත අදාළ සමාගමට දන්වා තිබේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) එවැනි දැනුම්දීමක් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයි. ඕ. සී. සමාගම රජයට ගෙවිය යුතු බදු නොගෙවා පැහැර හැරීමට එරෙහිව ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1327/'11

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, පොත්තපිටිය මාර්ගයේ, මැණික්දිවෙල සිට තිස්මඩ දක්වා කොටස ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අතරමග නවතා දමා වර්ෂයක පමණ කාලයක් ගතවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) ඉහත පරිදි ප්‍රතිපාදන වෙන් කර තිබේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු නවතා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් ආරම්භකර ප්‍රදේශයේ ජනතාවගේ ගමනාගමන පහසුකම් සලසාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1776/'11

4.

ගරු අජිත් කුමාර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් පරිහරණය කරනු ලබන නිල කැබ් රථය සඳහා 2006 වර්ෂයේ සිට මේ දක්වා වැයවූ,

(i) ඉන්ධන වියදම;

(ii) නඩත්තු වියදම;

(iii) රියදුරු වැටුප් හා දීමනා සඳහා වැය වූ මුදල;

කොපමණද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය සභාවට අයත් 'මහජන පොළ' සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් මහජන පොළ වෙතින් 2006 වර්ෂයේ සිට මේ දක්වා ලැබූ වාර්ෂික ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) ප්‍රාදේශීය සභා අරමුදලින් එම පෙර පාසල් වෙනුවෙන් 2006 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ප්‍රදේශීය සභාවට අයත් පුස්තකාල සංඛ්‍යාව කොපමණද;

(v) ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1998/'11

5.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) නිමල් පුංචිහේවා නමැති අයෙකු,

(i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති ලෙස කටයුතු කරමින් වැටුපක් ලබන බවත්;

(ii) ඊට අමතරව ඔහු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අතිරේක ලේකම් (නීති) ලෙස කටයුතු කරමින්ද වැටුපක් ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නිමල් පුංචිහේවා යන අයගේ වයස අවුරුදු 60 ඉක්මවා තිබේද;

(ii) රජයේ තනතුරු 2ක් එකවර දැරීම සඳහා නිමල් පුංචිහේවා යන අයට කැබිනට් මණ්ඩල අනුමතියක් ලැබී තිබේද;

(iii) නොඑසේ නම්, එම තැනැත්තා සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2027/'11

6.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්තමානයේ අවිධිමත් හා අනියම් ක්‍රම මගින් කාන්තාවන් හා කුඩා ළමුන් ගෘහ සේවය, ළමුන් රැකබලා ගැනීම හා ගෙවතු නඩත්තුව ආදී රැකියා සඳහා යොදවන බවත්;

(ii) එසේ සේවයේ යෙදෙන කුඩා ළමුන් හා කාන්තාවන් බොහෝවිට නොයෙකුත් වද හිංසාවලට භාජනය වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි ළමුන් සහ කාන්තාවන් වද හිංසාවලට ලක්වීම තුරන් කිරීම සඳහාත්, සේවක හා සේව්‍ය යන දෙපාර්ශ්වයටම යහපතක් වීම සඳහාත්, ඉහත සඳහන් රැකියා අපේක්ෂිත අයට ලියාපදිංචි විය හැකි විධිමත් ක්‍රමවේදයක් සහිත ආයතනයක් පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) පිහිටුවන ලද එවැනි ආයතනයක ලියාපදිංචි පුද්ගලයින් පමණක් ඉහත (අ) (i) හි සඳහන් රැකියා සඳහා විධිමත්ව ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2033/'11

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රන්ටැඹේ පිහිටි ශිෂ්‍යභට පුහුණු කඳවුරු ආරම්භ කළ දිනය කවරේද;

(ii) මේ වන විට එම කඳවුරේ පහසුකම් සකසා ඇති ශිෂ්‍යභට බණ්ඩ සංඛ්‍යාව කොපමණද;

(iii) එම කඳවුරේ එක් වරකදී නේවාසික පුහුණුව ලැබිය හැකි ශිෂ්‍ය භටයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම සංඛ්‍යාව ඉක්මවූ සිසුන් සංඛ්‍යාවක් සහභාගි කර පුහුණු කඳවුරු පවත්වා තිබේද;

(v) ශිෂ්‍ය භට පුහුණුව ලැබිය හැකි සිසුන්ගේ අවම වයස් සීමාව කොපමණද;

(vi) එම වයස් සීමාවට අඩු වයස්වල සිසුන් එම කඳවුරේ පුහුණුව ලබා තිබේද;

(vii) එසේ නම්, එම සිසුන් සහභාගි කරගත් කඳවුරු භාරව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1656/'11

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කලුතර දිස්ත්‍රික්කයේ, ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටි ඇඳුරාගල වතුයායට අයත් කොටගල වැවිලි සමාගමේ තේ සහ රබර් කර්මාන්තශාලා පරිශ්‍ර ගොඩනැගිලි වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන අතහැර දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම කර්මාන්තශාලාව නැවත විවෘත කර ප්‍රදේශයේ ජනතාවට සහනයක් සැලසීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, එය වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(iii) එසේ කටයුතු කරන්නේ නම්, ඒ කුමන කටයුත්තක් සඳහාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1747/'11

9.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැසිනෝ ව්‍යාපාර සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක් ලෙස මෙම රජය පිළිගන්නේද;

(ii) නොඑසේ නම්, කැසිනෝ ව්‍යාපාරයට අදාළ කටයුතු නීතිගත කිරීමට සහ ඒවායින් බදු අය කිරීමට හේතු කවරේද;

(iii) කැසිනෝ ව්‍යාපාරය තුළින් රටට ලැබෙන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1999/'11

10.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවය කරන නිමල් පුංචිහේවා නමැති අය මාසිකව ලබන වැටුප සහ අනෙකුත් දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔහු ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ලබාදුන් නිලරථයක් භාවිතා කරන්නේද;

(iii) එම තැනැත්තා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවය කිරීමට අමතරව වෙනත් රජයේ රැකියාවකද යෙදෙන බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත හෙළිදරව් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම තැනැත්තා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සේවය කිරීම වෙනුවෙන් රුපියල් අසූ දහසක (රු. 80,000/-) වැටුපක් ලබන බවත්;

(ii) එම තැනැත්තා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ රථයක්ද නිල රථයක් ලෙස භාවිතා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2035/'11

11.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහජන නියෝජිතයින් නොවන පුද්ගලයින්ගේ ආරක්ෂාව සඳහා රජයේ ආරක්ෂක නිලධාරීන් යොදවා තිබේද;

(ii) එසේ ආරක්ෂාව සළසා ඇති පුද්ගලයින්ගේ නම් සහ අනෙකුත් තොරතුරු කවරේද;

(iii) ඔවුන්ගේ ආරක්‍ෂාවට යොදවා ඇති නිලධාරීන් පොලිස් නිලධාරීන් ද, ඇමති ආරක්‍ෂක අංශයේ නිලධාරීන් ද, නැතහොත් හමුදා නිලධාරීන් ද;

(iv) ඉහත පරිදි ආරක්ෂාව සලසා ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන එක් එක් පුද්ගලයාට ලබා දී ඇති පසුපෙළ රථ (Backup vehicles) සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කිසියම් පුද්ගලයෙකු සඳහා ප්‍රභූ ආරක්‍ෂාව ලබා දිය යුතු බවට තීරණය කරන බලධාරියා කවුරුන්ද;

(ii) එම ආරක්‍ෂාව ලබාදීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2269/'12

12.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය තුළ සමෘද්ධි මුද්දර දීමනාව වෙනුවෙන් වැය කරන ලද මුලු මුදල කොපමණද;

(ii) එම වර්ෂයේම සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වූ පුනරාවර්තන වියදම් කොපමණද;

(iii) ඉහත සඳහන් පුනරාවර්තන වියදම්වලට සාපේක්ෂව සමෘද්ධි මුද්දර දීමනාව වෙනුවෙන් වඩා වැඩි මුදලක් වෙන් කිරීම සුදුසු බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1657/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2005-2006 අධ්‍යයන වර්ෂයේ සිට 2010-2011 අධ්‍යයන වර්ෂය දක්වා රජයේ විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2009-2010 සහ 2010-2011 අධ්‍යයන වර්ෂවලදී වෛද්‍ය පීඨ සඳහා බඳවා ගන්නා ලද ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2009-2010 අධ්‍යයන වර්ෂයට සාපේක්‍ෂව 2010-2011 අධ්‍යයන වර්ෂයේදී වෛද්‍ය පීඨ සඳහා බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාවෙහි අඩුවීමක් තිබේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1748/'11

14.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රජය චීනය හා සම්බන්ධ වී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතිවල නම් කවරේද;

(iii) එක් එක් ව්‍යාපෘතියේ සමස්ත වටිනාකමට සාපේක්ෂව චීන ආධාර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එක් එක් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදාළ චීන සමාගම විසින් මෙහි සේවයේ යෙදවීමට ඉල්ලා තිබූ චීන ජාතික ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) චීන ජාතික ශ්‍රමිකයන් සේවයේ යෙදවීමට අදාළව චීන සමාගම් විසින් කරන ලද ඉල්ලීම්වලට එකඟත්වය ලබා දෙනු ලැබුවේද;

(iii) එසේ නම්, එම ඉල්ලීම්වලට එකඟත්වය ලබාදීම සාධාරණීකරණය කරන ආකාරය සහ එසේ එකඟත්වය ලබා දීමට තදින් බලපෑ හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2036/'11

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරීන් විදේශගතවීම වෙනුවෙන් 2008 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනය විසින් වාර්ෂිකව වියදම් කර ඇති මුදල;

(ii) ඉහත එක් එක් වර්ෂයේදී නිලධාරීන් විදේශගත වූ එක් එක් අවස්ථාවේදී වියදම් කළ මුදල;

(iii) එම එක් එක් අවස්ථාවේදී නිලධාරීන් විදේශගත වී සිටි දින ගණන;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලධාරීන්ගේ ඉහත සඳහන් විදේශගතවීම් හේතුවෙන් ක්‍රිකට් ක්‍රීඩාවට අත් වූ යහපත් හෝ අයහපත් ප්‍රතිඵල කවරේද;

(ii) විදේශගත වූ නිලධාරීන්ගේ ගමන් වියදම්, නවාතැන් ගත් ස්ථාන සඳහා කළ වියදම් සහ අනෙකුත් වියදම් එක් එක් නිලධාරියාට අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිලධාරීන්ගේ සංචාර විස්තර සටහන් පත් ඉදිරිපත් කරන්නේද;

(iv) එකී නිලධාරීන්ගේ මාසික වැටුප් සහ වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 ජුනි මස 05 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0449/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වාණිජ බැංකු සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය කවරේද;

(ii) පෞද්ගලික බැංකුවල කොටස් රජය මිලදී ගනිමින් සිටින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සේවක භාරකාර අරමුදල මගින් හෝ වෙනත් රාජ්‍ය ආයතනයක් මගින් මේ වනවිට පෞද්ගලික බැංකුවලින් රජය මිලදී ගෙන ඇති මුළු කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) එම එක් එක් බැංකුවෙන් මිලදීගත් කොටස්වල ප්‍රතිශතය සහ ඒ සඳහා වැය කළ සම්පූර්ණ මුදල එම මිලදීගැනීම සිදු කළ දිනයේ සිට එක් එක් වර්ෂයේදී, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොටස්වල මිල පහත වැටුනහොත් කොටස් මිලදීගැනීමේ අවදානම දරන්නේ කවරෙක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1115/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීම සඳහා ගුරු උපදේශකවරු විශාල සේවාවක් ඉටු කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ගුරු උපදේශකවරුන් බඳවා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) ඔවුන්ට හිමි වරප්‍රසාද සහ දීමනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සේවා තෘප්තිමත්භාවය ඇතිකර ගුරු උපදේශකයින්ගෙන් වඩාත් ඵලදායී සේවාවක් ලබා ගැනීම සඳහා ගුරු උපදේශක සේවාවක් ඇති කිරීමටත්;

(ii) ඒ තුළින් ඔවුන්ගේ සේවාවේ සුරක්ෂිතතාවය ඇති කිරීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1562/'11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය සේවය සඳහා තරඟ විභාග පැවැත්වීමකින් තොරව සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ යටතේ බඳවා ගන්නා සංඛ්‍යාව කොපමණද;

(iii) එම පිරිස බඳවා ගැනීමේදී සලකා බලනු ලබන අවම සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ තරඟ විභාග සඳහා ඉදිරිපත් ව වැඩි ලකුණු ලැබූ දහස් සංඛ්‍යාවක් මේ වන විටත් රැකියා නොලබා සිටිය දී තරඟ විභාග පැවැත්වීමකින් තොරව ඉහත සඳහන් පරිදි සිදුකරනු ලබන බඳවා ගැනීම් හේතුවෙන් විභාගවලට මුහුණදුන් පිරිසට බලවත් අසාධාරණයක් සිදුවන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, තරඟ විභාග සඳහා ඉදිරිපත් වී සමත්ව සිටින පිරිසට රැකියා ලබාදීමට සාධාරණ වැඩ පිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1859/'11

4.

ගරු සිවශක්ති ආනන්දන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වවුනියාව නගර සභාවට අයත් ගවමස් හා එළුමස් වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වෙළඳසැල් පිහිටා ඇති ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පූන්තෝට්ටම්, කුරුමන්කාඩු හා වවුනියාව පොළ අසල පිහිටි ගවමස් වෙළඳ සැල් හා කුරුමන්කාඩු හා වවුනියාව පොළ අසල පිහිටි එළුමස් වෙළඳසැල් බදුදීමේදී ටෙන්ඩර් කැඳවීමක් හෝ ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමක් සිදු කළේද;

(ii) 2009, 2010 සහ 2011 වර්ෂවලදී එම එක් එක් වෙළඳසැල බදු දුන් මුදල හා බදුගත් පාර්ශ්වයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2011.06.29 දින පැවැති නගර සභා රැස්වීම් වාර්තා අනුව වවුනියාව පොළ අසල පිහිටි ගවමස් වෙළඳසැල එස්. කේ. කාදර් නැමැති අයට රු. 859,711.05කට හා එළුමස් වෙළඳසැල කේ. කේ. මස්තාන් නමැති අයට රු. 79,315.50කට ටෙන්ඩර් කැඳවීමකින් තොරව අඩු මුදලකට ලබා දී ඇති බවත්;

(ii) එමගින් සභාවට ඉහත වර්ෂ තුනට අදාළව රුපියල් කෝටියක පමණ අලාභයක් සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, ඊට වගකිවයුත්තන්ගෙන් එම මුදල් අයකර ගැනීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1978/'11

5.

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්ටැම්මණ්ඩිය ග්‍රාම නිලධාරී වසමේ පදිංචි ඩී. එම්. පියදාස, ඩී. එම්. ගුණදාස, ආර්. එම්. අමරදාස, ටී. ඒ. සරත්, එම්. පී. ගුණපාල, ඩී. එම්. රත්නසිරි, ඩී. එම්. සරත්, ජේ. එම්. ප්‍රේමලතා සහ එච්. එම්. ගුණසේකර යන අය සමෘද්ධි සහන ලැබූ අඩු ආදායම්ලාභීන් බවත්;

(ii) මේ වනවිට ඔවුන්ගේ සමෘද්ධි සහනාධාරය කපා හැර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සමෘද්ධි සහනාධාරය අහිමි වීම නිසා ඉතා අසරණභාවයට පත්ව සිටින මෙම පිරිසට නැවත සමෘද්ධි සහනාධාරය ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1989/'11

6.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වාවකච්චේරි නගර සභා ප්‍රදේශය තුළ පාසල් 12කට අයත් වැසිකිළිවල අපද්‍රව්‍ය ඉවත් කිරීමට වාවකච්චේරිය නගර සභාව අපොහොසත් වී ඇති බවත්;

(ii) එම තත්ත්වය පිළිබඳව අදාළ පාසල්වල පරිපාලනය විසින් නගර සභාවට දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ගැටලුකාරී තත්ත්වය විසඳීම සඳහා වාවකච්චේරි නගර සභාවට අවශ්‍ය උපදෙස් ලබා දී, එම පාසල්වලට නගර සභාවෙන් ලබාදිය හැකි සියලු සම්පත් නිසියාකාරව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2025/'11

7.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ප්‍රථම උපාධිය සහ පශ්චාත් උපාධිය හැදෑරීමට ඇතුළත් කරගෙන ඇති ශ්‍රී ලාංකික නොවන ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ප්‍රථම උපාධිය හා පශ්චාත් උපාධිය හැදෑරීමට ඇතුළත් වූ ඉහත ශිෂ්‍ය සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලය සහ උපාධි පාඨමාලාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ප්‍රථම උපාධිය හා පශ්චාත් උපාධිය හැදෑරීමට ඇතුළත් වූ ශ්‍රී ලාංකික නොවන සිසුන්ගෙන් ලැබුණු ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කර ගන්නා ශ්‍රී ලාංකික නොවන ශිෂ්‍යයින් සඳහා "නායකත්ව සහ පෞරුෂ වර්ධන" පුහුණු වැඩසටහන පවත්වා තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී එම සිසුන් සඳහා ඉහත පුහුණු වැඩසටහන පැවැත්වීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2057/'11

8.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ දෙක තුළදී සේවක අර්ථසාධක අරමුදල විසින් කොළඹ කොටස් වෙළඳපොලේ සිදුකරන ලද සියලුම ලැයිස්තුගත කොටස් මිලදීගැනීම් හා විකිණීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් ගනුදෙනුව සඳහා වගකීම දැරූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

(iii) තැරැව්කරු ගාස්තු ද ඇතුළුව එක් එක් ගනුදෙනුවට අදාළ පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් වර්ෂ දෙකක කාල පරිච්ඡේදය සඳහා එක් එක් කොටස් තැරැව්කාර සමාගමට ගෙවන ලද තැරැව්කාර ගාස්තු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් එක් මිලදී ගැනීමට හෝ විකිණීමට සති දෙකකට පෙර සහ මිලදී ගැනීමෙන් හෝ විකිණීමෙන් සති දෙකකට පසු ඉහත (අ) (i) හි සඳහන් එක් එක් කොටසෙහි ඇවුරුම් මිල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2087/'11

9.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අප රටේ බෞද්ධාගාමික පූජනීය සිද්ධස්ථාන සුරක්ෂිත කිරීම උදෙසා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

(ii) වර්ෂ 2005 - 2010 අතර කාල සීමාව තුළදී එම ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් කර තිබුනේද;

(iii) එම කාල සීමාව තුළ ඒ සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2102/'11

10.

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකාවේ දැනට සිටින වැඩ බලන විදුහල්පතිවරුන් ස්ථිර සේවයේ පිහිටුවීම සම්බන්ධයෙන් මේ දක්වා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(ii) වැඩබලන විදුහල්පතිවරුන් ලෙස ඔවුන් සේවය කර ඇති කාල සීමාව සඳහා ඔවුන්ට හිඟ වැටුප් ගෙවීමට තිබේ නම්, එම මුදල කොපමණද;

(iii) එම හිඟ වැටුප් ගෙවනු ලබන දිනය කවරේද;

(iv) වැඩබලන විදුහල්පතිවරුන් අතර කාන්තා නියෝජනයේ ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2112/'11

11.

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල භාරව කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරියාගේ නම සහ තනතුර කවරේද;

(ii) ඉහත කී නිලධාරියාගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) එකී නිලධාරියාගේ මහ බැංකුවේ සේවා කාලය කොපමණද;

(iv) මහ බැංකුවේ ආයෝජන කමිටුවේ එක් එක් සාමාජිකයාගේ නම, තනතුර සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(v) ඉහත (iv) හි සඳහන් එක් එක් නිලධාරියාගේ මහ බැංකුවේ සේවා කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1551/'11

12.

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දියන් ආධාර මත 2010 වසරේදී ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකා දුම්රිය මාර්ග නවීකරණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය හා අවසන් කරන ලද දිනය කවරේද;

(ii) ඉහත ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු මුදල හා ව්‍යාපෘතිය අවසන් වන විට වැය කොට තිබූ මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතියෙහි ශ්‍රමය වෙනුවෙන් දරන ලද පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ව්‍යාපෘතියේ සේවය කළ දේශීය හා විදේශීය ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට විදේශීය ශ්‍රමිකයන් ගෙන එන ලද සමාගම හෝ රට විසින් එම ශ්‍රමිකයන් හට ලබා දුන් තනතුරු නාමයන් කවරේද;

(iii) ශ්‍රී ලංකා දුම්රිය මාර්ග නවීකරණ ව්‍යාපෘතියේ ශ්‍රමිකයන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත ගෙවන ලද දායක මුදල්වල වටිනාකම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1590/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන යටතේ කුඹුක්කන, ඔක්කම්පිටිය, බුත්තල සහ සෙල්ලකතරගම යන මාර්ග කාපට් කර සකස් කළ බවත්;

(ii) එම මාර්ගවලින් කිහිපයක් මේ වනවිට ගිලා බැස ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම එක් එක් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) එම ප්‍රතිපාදන සපයන ලද දේශීය හෝ විදේශීය ආයතනය හෝ ආයතන කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ග සංවර්ධන කටයුතු භාරදුන් කොන්ත්‍රාත්කරු/කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(ii) එම කටයුතු අධීක්ෂණය කරන ලද ආයතනය කවරේද;

(iii) එම මාර්ගයන්හි අබලන්ව ඇති ස්ථාන එම කොන්ත්‍රාත්කරුවන් මගින් නැවත ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1867/'11

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් සංස්ථාව 2011.06.31 දිනට ලබා ගෙන ඇති දිගු කාලීන හා කෙටි කාලීන, දේශීය හා විදේශීය ණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2007 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් ණය අයිතමය යටතේ ලබාගෙන ඇති ණය ප්‍රමාණයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එකී ණය ප්‍රමාණයන් ලබා ගැනීමට හේතු වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් ණය ප්‍රමාණයන් ලබා ගෙන ඇති පොලී අනුපාතිකයන් කවරේද;

(v) ලබා ගත් එම ණය මුදල්වලින් මේ වන විට ගෙවා ඇති ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2088/'11

15\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අප රටේ ක්‍රිස්තියානි සහ කතෝලික සිද්ධස්ථාන සුරක්ෂිත කිරීම උදෙසා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

(ii) වර්ෂ 2005 - 2010 අතර කාල සීමාව තුළදී එම ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් කර තිබුණේද;

(iii) එම කාල සීමාව තුළ ඒ සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ජූනි මස 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0686/'10

1\.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010 සැප්තැම්බර් 01 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව මගින් වෙන්දේසි කරනලද ශ්‍රී ලංකා රජයේ රන් සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) එසේ වෙන්දේසි කරන ලද රත්තරන්වල වටිනාකම එක්සත් ජනපද ඩොලර්වලින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජය විසින් රත්තරන් මිලදී ගැනීමට ගෙවූ මිල ගණන් කවරේද;

(iv) රාජසන්තක කරනලද රත්තරන් ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ රන් සංචිතවලට එක් කරනු ලැබුවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයට අයත් රත්තරන් ප්‍රමාණයක් පසුගිය වසර දෙක තුළ විකුණනු ලැබුවේද;

(ii) එසේ නම්, එම රත්තරන්වල අලෙවි මිල කවරේද;

(iii) එම රත්තරන් විකිණීම ටෙන්ඩර් කැඳවීමක් හෝ වෙන්දේසි කිරීමක් මගින් සිදුකරන ලද්දේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1116/'11

2\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගුරු සේවයේ යෙදී සිටිය දී විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ තරඟ විභාගයට ඉදිරිපත් වී, සමත් වීමෙන් පසු විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය වූ විදුහල්පතිවරුන් කලින් සේවයට වඩා පහළ වැටුපක් ලබන බවත්;

(ii) එම හේතුව නිසා ඔවුන් දැඩි මානසික හා ආර්ථික අපහසුතාවයන්ට මුහුණ පා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැඩි කැපවීමකින් පාසල් කළමනාකරණ කටයුතුවල නියුක්තව සිටින එම පිරිස මීට පෙර ගුරු සේවයේ දී ලැබූ වැටුප් තලයට වැඩි වැටුප් තලයක පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වන විට ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iii) නොඑසේ නම්, එවැනි ක්‍රමවේදයක් සකසනු ලබන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1563/'11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2010 මැයි මස සිට මේ දක්වා කැලණිතිස්ස ද්විත්ව බලාගාරයේ ලාභය හෝ අලාභය කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) අලාභ ලැබීමක් සිදුවූයේ නම්,

(i) එයට හේතුව කවරේද;

(ii) එම අලාභය දරනු ලබන අය කවුරුන්ද;

(iii) ඒ සඳහා වගකිව යුත්තේ කවුරුන්ද;

(iv) එම අලාභය ජනතාවට දැරීමට සිදු වූයේ නම්, ඒ සඳහා සහනයක් ජනතාවට ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1861/'11

4.

ගරු සිවශක්ති ආනන්දන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඩෙංගු මර්දනය සඳහා උතුරු පළාත් ආණ්ඩුකාරවරයා විසින් වවුනියාව නගර සභාවට 2009 වර්ෂයේදී වෙන්කරන ලද මුදල කොපමණද;

(ii) එම මුදල් වියදම් කිරීමට අදාළ ගිණුම් වාර්තා හා විස්තර මෙතෙක් නගර සභාවට ඉදිරිපත් නොකිරීමට හේතුව කවරේද;

(iii) එම ගිණුම් වාර්තා හා විස්තර නගර සභාවට ඉදිරිපත් කරවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2001/'11

5.

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බුත්තල නගරයේ ඉදිකර ඇති නව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පිහිටි වෙළඳ කුටි 17න් යිවර සංස්ථාවට වෙන්කළ අංක 11 දරන වෙළඳ කුටිය හැරුණු කොට, අංක 4 සිට 17 දක්වා වෙළඳ කුටි සියල්ලම ටෙන්ඩර් කැඳවා එක් වෙළඳ කුටියක් රුපියල් ලක්ෂ 20ක පමණ මුදලකට ලබාදුන් බවත්;

(ii) අංක 1, 2 සහ 3 යන වෙළඳ කුටි සභාවේ අනාගත අවශ්‍යතාවයන් සඳහා යෙදවීම පිණිස ටෙන්ඩර් මගින් ලබා නොදීමට මාසික සභා රැස්වීමේදී තීරණයකට එළැඹි බවත්;

(iii) පසුව එම වෙළඳකුටි තුන වෙනුවෙන් තම හිතවතුන් ඉදිරිපත් කළ එක් වෙළඳසැලකට රුපියල් ලක්ෂ 10ක් වැනි අවම වටිනාකමින් යුත් ටෙන්ඩර්පත් පිළිගෙන ඇති බවත්;

(iv) විනිවිදබවින් තොරව සිදුකරන ලද ඉහත ටෙන්ඩර් කැඳවීම තුළින් එම ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමිවී ඇති බවත්;

(v) එම අයථා ටෙන්ඩර් කැඳවීම තුළින් විශාල මූල්‍ය වංචාවක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ටෙන්ඩර් කැඳවීම සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2089/'11

6.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අප රටේ හින්දු ආගමික පූජනීය සිද්ධස්ථාන සුරක්ෂා කිරීම උදෙසා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

(ii) එම කටයුතු වෙනුවෙන් වර්ෂ 2005-2010 අතර කාලය තුළ වැය කරන ලද මුදල් ප්‍රමාණයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් වූයේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2103/'11

7.

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 සිට 2010 දක්වා අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට ඉදිරිපත් වූ පාසල් අයදුම්කරුවන්ගෙන්,

(i) එම විභාගයේ විෂයයන් 8ම සමත් සිසුන් සංඛ්‍යාව;

(ii) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය අනුව එම විභාගය සමත් සිසුන් සංඛ්‍යාව;

(iii) ගණිතය, මව් භාෂාව, ඉංග්‍රීසි සහ විද්‍යාව යන විෂයයන් අසමත් වූ සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා වාර්ෂිකව, දිස්ත්‍රික් පදනමින්, වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) රජයේ පාසල්වල ගණිතය, මව් භාෂාව, ඉංග්‍රීසි සහ විද්‍යාව යන විෂයයන් ඉගැන්වීම සඳහා සිටින ගුරුවරු සංඛ්‍යාව දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සිංහල මාධ්‍ය හැරුණු කොට ඉංග්‍රීසි මාධ්‍ය ද භාවිතාකරන ජාතික හා පළාත් සභා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල එක් එක් විෂය ඉගැන්වීමට සිටින ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0691/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භ වූ දින සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු පිහිටුවීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම එක් එක් බැංකුවේ ප්‍රධාන ශාඛාව යටතේ ක්‍රියාත්මක වන බැංකු ශාඛා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත බැංකුවල ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය කොපමණද;

(iv) අද වන විට වාණිජ බැංකුවලට අවශ්‍ය වන කොටස් ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත බැංකු අතරින් ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ තිබෙන කවර හෝ බැංකුවක් විදේශීය බැංකුවක් මිලදී ගැනීමට මුදල් ගෙවා තිබේද;

(ii) එසේ නම්, එම බැංකුවේ නම සහ එම බැංකුව මගින් අනුමත කර ඇති මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වාණිජ නොවන බැංකු සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන වාණිජ නොවන බැංකු සංඛ්‍යාව කවරේද;

(iii) එම බැංකුවල කොටස් ප්‍රාග්ධනය කොපමණද;

(iv) යම්කිසි වාණිජ හෝ වාණිජ නොවන බැංකුවක් බංකොළොත් තත්ත්වයට පත්වී තිබේද;

(v) එසේ නම්, එම බැංකුවල සහ ඒවායේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1634/'11

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, කිතලගම බටහිර ග්‍රාම නිලධාරී වසමට අයත්, බදුලු කුඹුරුයායේ ඇළ මාර්ග හා අමුණු නිසි ලෙස ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා කුඹුරු අක්කර 150 ක් පමණ පුරන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කුඹුරුයායට අයත් වාරි පද්ධතිය කඩිනමින් ප්‍රතිසංස්කරණය කරන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු නිමකරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1659/'11

10.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂය වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් පදනමින් සිටි සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, තනතුරු, අදාළ වැටුප් සහ ලබා දෙන වෙනත් පහසුකම් කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සේවකයින් අතුරින් 2011 වර්ෂයේදී ප්‍රසාද දීමනා ගෙවා ඇති සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ තනතුරු කවරේද;

(iii) එක් එක් සේවකයාට ලබාදුන් ප්‍රසාද දීමනා මුදල කොපමණද;

(iv) ඒ වෙනුවෙන් දරන ලද මුළු වියදම කොපමණද;

(v) ඒ සඳහා මුදල් ලබා ගත් මාර්ගය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2090/'11

11.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අප රටේ ඉස්ලාම් ආගමික සිද්ධස්ථාන සුරක්ෂා කිරීම උදෙසා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

(ii) එම කටයුතු වෙනුවෙන් වර්ෂ 2005-2010 අතර කාලය තුළ වැය කරන ලද මුදල් ප්‍රමාණයන් වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් වූයේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2105/'11

12.

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ළමුන් විවිධ ශ්‍රේණිවලදී පාසල් හැරයන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ පාසල් හැරයාමේ අනුපාතිකය කොපමණද;

(ii) එසේ පාසල් හැරයන සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පස්වැනි ශ්‍රේණියේදී පාසල් හැරයාමේ අනුපාතිකය කොපමණද;

(iv) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු පාසල් හැරයාමේ අනුපාතිකය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය සිසුන් අතර පාසල් හැරයාමේ ප්‍රතිශතයන් වෙන් වෙන් වශයෙන් කවරේද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ ළමුන් පාසල් හැර යාමට හේතු කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ ළමුන්ගේ පාසල් පැමිණීම දිරි ගැන්වීම සඳහා දැනට ක්‍රියාත්මක වැඩසටහන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1552/'11

13.

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීමේදී ශ්‍රම පිරිවැය කොපමණද යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ඉදිකිරීම් ව්‍යාපෘතියේ සේවයේ නියුතු වූ විදේශීය හා දේශීය ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විදේශීය ශ්‍රමිකයින් ශ්‍රී ලංකාවට රැගෙන ආ රට හෝ සමාගම මගින් එම ශ්‍රමිකයන්ට ලබා දුන් තනතුරු නාමයන් කවරේද;

(iii) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය ඉදිකිරීම් ව්‍යාපෘතියේ යෙදුණු ශ්‍රමිකයින් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ගෙවූ දායක මුදල්වල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1870/'11

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ අන්තර්ජාල හරහා ඇමතුම් අංශයේ (VOIP) දිනක ආදායම හා මාසික ආදායම කොපමණද;

(ii) එම අංශය මේ වන විට වසා දමා තිබේද;

(iii) එසේ නම්, වසා දමන ලද දිනය කවරේද;

(iv) එම අංශය වසා දැමීමට හේතු කවරේද;

(v) වසා දමන අවස්ථාවේ දී එම අංශය ලැබූ ලාභය හෝ අලාභය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2091/'11

15.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ශ්‍රී ලන්කන් ගුවන් සේවය සාර්ථක තත්ත්වයකින් ක්‍රියාත්මක වන්නේද;

(ii) වර්ෂ 2005-2010 අතර කාල සීමාව තුළ එම ගුවන් සේවය සාර්ථක ක්‍රියාකාරීත්වයක් පෙන්වා තිබේද;

(iii) ඉහත කාල සීමාවේදී ශ්‍රී ලන්කන් ගුවන් සේවය ලබා ඇති ප්‍රගතිය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ජූනි මස 07 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0768/’10

1.

ගරු රවී කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2006 සිට 2010 දක්වා කාලය තුළ එක් එක් වර්ෂයේදී දේශීය විශ්වවිද්‍යාලවලට බඳවා ගත් විදේශ සිසුන් සංඛ්‍යාව ඔවුන් අයත් රටවල් අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඔවුන් බඳවාගෙන ඇති අධ්‍යයන අංශ කවරේද;

(iii) ඉහත කී ශිෂ්‍යයන්ගෙන් වාර්ෂිකව ශ්‍රී ලංකාවට ලැබුන විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දේශීය විශ්වවිද්‍යාලවලට වැඩි වශයෙන් විදේශ සිසුන් ආකර්ෂණය කරගැනීම සඳහා විකල්ප වැඩ සටහනක් හඳුන්වා දෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දේශීය විශ්වවිද්‍යාල පද්ධතියට විදේශ සිසුන් බඳවා ගැනීම හේතුවෙන්, විශ්වවිද්‍යාලයකට ඇතුළත්වීමේ අවස්ථාව අහිමිවූ දේශීය සිසුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම ගැටලුව විසඳන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1120/’11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ධර්මාචාර්ය විභාගය සමත්ව මේ වනවිට දහම් පාසල්වල ඉගැන්වීමේ කටයුතුවල නිරතව සිටින ගුරු පිරිසට රජයේ ගුරු පත්වීම් ලබා දීමට අදාළව කැබිනට් පත්‍රිකා දෙකක් අනුමත කරගෙන තිබේද;

(ii) එම ගුරු පිරිසට 2600 වැනි සම්බුද්ධත්ව ජයන්ති වර්ෂය තුළදී රජයේ ගුරු පත්වීම් ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1664/'11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ අග භාගයේදී සහ 2011 වර්ෂයේ මුල් කාල සීමාවේදී ලංකා සතොස ආයතනය විසින් ඉන්දියාවෙන් ආනයනය කරන ලද කුකුල් මස් ප්‍රමාණය කොපමණද;

(ii) ආනයනය කරන ලද එක් මස් කිලෝවක් සඳහා ඉන්දියාවට ගෙවන ලද මුදල කොපමණද;

(iii) එම කුකුල් මස් ගබඩා කළ ස්ථාන කවරේද;

(iv) ගබඩා කළ ස්ථානයන්ගෙන් පරිභෝජනය සඳහා කුකුල් මස් නිදහස් කළ දිනය, ප්‍රමාණය සහ ලබාගත් ආයතන එක් එක් ගබඩාවලට අදාළව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) 2011 වර්ෂයේ ජූනි මස වන විට ඉහත කුකුල් මස් තොගවලින් ගබඩාවල ඉතිරිවී තිබූ ප්‍රමාණය කොපමණද;

(vi) එම ඉතිරි තොග සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1862/'11

4.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඇල්කඩුව වැවිලි සමාගමට අයත් වතු සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) සේවකයින් බඳවා ගැනීම, ඉවත් කිරීම හා සේවය දීර්ඝ කිරීමේ පූර්ණ බලතල එම සමාගමේ පරිපාලනය සතුවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත වැවිලි සමාගමේ වත්මන් සභාපතිවරයා වැවිලි ක්ෂේත්‍රය තුළ දූෂණ හා වංචා සිදු කළ අයෙකු බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම දූෂණ හා වංචා සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(ii) එම පරීක්ෂණයේ ප්‍රගතිය කවරේද;

(iii) එම පරීක්ෂණයෙන් එම සභාපතිවරයා වරදකරුවකු වුවහොත් ගන්නා ක්‍රියාමාර්ගය කවරේද;

(iv) එම සභාපතිවරයා ඉදිරිපත් කරන ඇල්කඩුව වැවිලි සමාගමේ ගිණුම් වාර්තා පිළිගත හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත සමාගමේ 2007-2010 වර්ෂ තුළ ලාභ ලැබූ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) අලාභ ලැබුවේ නම්, එම අලාභය කොපමණද;

(iii) දූෂණ සහ අක්‍රමිකතා ඊට හේතු වූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) (i) එම සමාගම සඳහා කෝප් වාර්තාවක නිර්දේශයක් පරිදි ආශ්‍රිත මෙහෙයුම් කාර්යාලයක් ඉදිකර තිබේද;

(ii) එය ඉදිකිරීමට හේතුව කවරේද;

(iii) ඒ සඳහා වැයවූ මුදල කොපමණද;

(iv) එම කාර්යාලයේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

2092/'11

5.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අද වන විට ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය සම්පූර්ණයෙන්ම අඩාළ වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2005 සිට 2010 දක්වා කාල සීමාවේදී ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම උදෙසා වැය කරන මුදල් ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය ශක්තිමත් කිරීමට ගන්නා වූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2107/'11

6.

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන දෙමළ මාධ්‍යයෙන් පමණක් අධ්‍යාපන කටයුතු කරන වතුකරයේ නොවන පාසල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව;

(ii) එම දෙමළ මාධ්‍ය පාසල් අතර පවතින ජාතික පාසල්, පළාත් පාසල්, නවෝදා හා ඉසුරු පාසල් සංඛ්‍යාව; සහ

(iii) ප්‍රාථමික හා ද්විතීයික පාසල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ද්විතීයික පාසල් 1000 ව්‍යාපෘතියට අයත් වතුකරයේ නොවන දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ක්‍රියාත්මක රජයේ ද්‍රවිඩ පාසල්වල ළමුන්ගේ පාසල් හැරයාමේ අනුපාතය කොපමණද;

(ii) පසුගිය වර්ෂ 5 තුළ වැසී ගිය රජයේ දෙමළ පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1553/'11

7.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලාව ප්‍රතිසංස්කරණය සහ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කළ දිනය කවරේද;

(iii) ඇස්තමේන්තු කළ මුළු පිරිවැය සහ ව්‍යාපෘතියේ වැඩ අවසන් වනවිට වැය වූ සැබෑ පිරිවැය කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ ශ්‍රමය සඳහා දරන ලද පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ සේවයේ යෙදුනු දේශීය හා විදේශීය ශ්‍රමික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විදේශීය ශ්‍රමිකයින් ශ්‍රී ලංකාවට ගෙන්වන ලද රට හෝ සමාගම මගින් එම විදේශීය ශ්‍රමිකයින්ට ලබාදුන් තනතුරු නාමයන් කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතියෙහි ශ්‍රමිකයන් වෙනුවෙන් ගෙවනලද සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත ගෙවූ දායක මුදල්වල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1635/'11

8\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, තිබොල්කැටිය ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් පාලනය වන, "පනහඩුව" වැවේ පිටවාන ගිලා බැසීම හේතුවෙන් කුඹුරු අක්කර හැටක පමණ ප්‍රමාණයක් විනාශ වී යාමේ තර්ජනයකට ලක්ව ඇති බැවින් ප්‍රදේශයේ ගොවි ජනතාව ගැටලු රාශියකට මුහුණ පා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැවේ පිටවාන කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1871/'11

9\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය ටෙලිකොම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(ii) එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේ නම්, ඒ සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ටෙන්ඩර් පටිපාටිය අනුව අඩුම මිල ගණන් යටතේ ඉල්ලුම් පත් යොමු කළ අයගේ නම සහ ලිපිනය කවරේද;

(iv) එකී ටෙන්ඩරය ලබා දුන් පුද්ගලයාගේ හෝ ආයතනයේ නම සහ ටෙන්ඩරය ලබා දුන් මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට එකී ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා දරන ලද සමස්ත පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2093/'11

10.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වත්මන් වන අලිගහනය කොපමණද;

(ii) වන අලි සංරක්ෂණය වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග තුළින් ලබා ඇති ප්‍රථිඵල කවරේද;

(iv) වන අලි සංරක්ෂණය වෙනුවෙන් වර්ෂ 2005-2010 අතර කාලය තුළ වෙන් කර ඇති මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2113/'11

11.

ගරු රෝසි සේනානායක මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ සිටින වීදි දරුවන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව,

(i) සියලු දරුවන්ගේ ආරක්ෂාව සහ රැකවරණය සම්පූර්ණයෙන්ම සහතික කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියට අනුබද්ධිත පොලිස් ළමා කාර්යාංශයක් පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එය පිහිටුවා ඇති දිස්ත්‍රික්කය කුමක්ද;

(iii) දරුවන්ට පමණක් වෙන්වූ අධිකරණ පද්ධතියක් මේ වන විට ආරම්භකර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව වයස අවුරුදු පහ දක්වා දරුවන්ට කිරි මිලදී ගැනීම සඳහා ලබා දෙන රුපියල් 200ක මාසික දීමනාව වෙනුවට වර්තමානයේ රුපියල් 60ක දීමනාවක් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම දීමනාව ලබා දීම ආරම්භ කළ වර්ෂය කුමක්ද;

(iii) එමගින් ප්‍රතිලාභ ලබන ළමුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ දක්වා ඇති පරිදි පෝෂණ මල්ලට අමතරව සමෘද්ධිලාභී මව්වරුන් දරුවකු බිහිකිරීමේදී දරුවාට අවශ්‍ය දෑ අඩංගු තිළිණ පාර්සලයක් ලබා දෙන්නේද;

(ii) එම තිළිණ පාර්සලය හිමිවූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1554/'11

12.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විහාරමහා දේවී උද්‍යානය අසල ඉදිකර ඇති චීන සංස්කෘතික මධ්‍යස්ථානය 2002 - 2004 කාල සීමාව තුළදී ගරු රනිල් වික්‍රමසිංහ මහතාගේ අග්‍රාමාත්‍යධූරය යටතේ චීන රජයෙන් ශ්‍රී ලංකා රජයට ලැබුණු ත්‍යාගයක්ද;

(ii) එය පූර්ණ ප්‍රදානයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) චීන සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ වූ දිනය සහ අවසන් වූ දිනය කවරේද;

(ii) ඉහත ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ මුළු පිරිවැය සහ එය අවසන් කිරීමේදී දැරීමට සිදු වූ පිරිවැය කොපමණද;

(iii) එම ව්‍යාපෘතියෙහි ශ්‍රමය සඳහා වැයවූ පිරිවැය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ව්‍යාපෘතියේ සේවයේ යෙදවූ දේශීය සහ විදේශීය සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී ව්‍යාපෘතියේ විදේශික ශ්‍රමිකයන්ට, ඔවුන් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබූ සමාගම හෝ රට විසින් ලබා දී තිබූ තනතුරු නාමයන් කවරේද;

(iii) චීන සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ සේවකයන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ගෙවන ලද දායක මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1636/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුනාමියෙන් විනාශ වූ ගාල්ල මහමෝදර රෝහල යළි ගොඩනැගීම සඳහා රුපියල් මිලියන 3000 ක විදේශ ආධාර මුදලක් ලැබී වර්ෂ පහකට වැඩි කාලයක් ගත වී ඇති බවත්;

(ii) මේ දක්වා එහි ඉදිකිරීම් කටයුතු අත්තිවාරමට පමණක් සීමා වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම රෝහල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුට රජයේ බදු සහන ලබා දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රෝහල ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 3000 ක මුදල ලබා දුන් රට කුමක්ද;

(ii) කොන්ත්‍රාත්කරු විසින් එම මුදල් ලබාගෙන රෝහල් ගොඩනැගිල්ල ඉදිනොකිරීම පිළිබඳව සොයා බැලීමට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පරීක්ෂණයක් සිදු කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එහි ප්‍රතිඵලය කවරේද;

(iv) පරීක්ෂණයක් සිදු නොකළේ නම්, ඊට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නැවතත් විදේශීය ණය මුදලක් ලබා ගෙන මෙහි ඉදිකිරීම් කටයුතු කිරීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එම ණය මුදල කොපමණද;

(iii) එම ණය මුදල ලබා ගන්නා ආයතනය සහ රට කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1902/'11

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ නිරුවත් වෙරළ තීර ඇති කිරීමට කටයුතු සූදානම් කර තිබේද;

(ii) නිරුවත් වෙරළ තීර ඇති කරන්නේ නම්, ඒ සඳහා වෙන් කිරීමට අපේක්ෂිත වෙරළ තීරයන් කවරේද;

(iii) නිරුවත් වෙරළ තීර ඇති කිරීමට හේතු කවරේද;

(iv) එම වෙරළ තීරයන් ඇති කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2094/'11

15.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබාගැනීම උදෙසා ගත් ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම එක් එක් ක්‍රියාමාර්ගය සඳහා වියදම් වූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිපාදනයන් ලබා ගත් ආකාරයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ජූනි මස 08 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0771/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ කටයුතු වෙනුවෙන් මුදල් සැපයීම සඳහා පසුගිය වර්ෂ 6 තුළ රජය මුදල් ණයට ලබාගෙන තිබේද;

(ii) 2011, 2012, 2013, 2014 හා 2015 යන වර්ෂවලට අදාළව ප්‍රක්ෂේපිත සමස්ත ණය ආපසු ගෙවීමේ ප්‍රමාණය ප්‍රාග්ධන හා පොලී පිරිවැය වශයෙන් කොපමණද;

(iii) 2003, 2004 හා 2005 යන වර්ෂවල සමස්ත ණය ආපසු ගෙවීමේ ප්‍රමාණය ප්‍රාග්ධන හා පොලී පිරිවැය වශයෙන් කොපමණද;

(iv) 2008, 2009 හා 2010 යන වර්ෂවල ගෙවුම් ශේෂ හිඟය කොපමණද;

(v) 2011, 2012, 2013 හා 2014 යන වර්ෂ සඳහා ගණන් බලා ඇති ගෙවුම් ශේෂ හිඟය හෝ ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1157/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධිකරණ තීන්දුවක් මත ලංකා මැරයින් සර්විස් ආයතනයේ කොටස් රජයට පැවරුණ බව දන්නේද;

(ii) එම ආයතනය දැනට පවත්වා ගෙන යනු ලබන නම කවරේද;

(iii) එම ආයතනය සතු කොටස් මේ වන විට වෙනත් ආයතනවලට අලෙවි කර තිබේද;

(iv) එසේ නම්, එම ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට මාගම්පුර වරායට පැමිණෙන නැව්වලට තෙල් සැපයීම සඳහා ඉදිකරමින් පවතින තෙල් ටැංකි සංඛ්‍යාව කොපමණද;

(ii) එම තෙල් ටැංකි විදේශීය සමාගමකට හෝ සමාගම්වලට බදුදීමට සැලසුමක් තිබේද;

(iii) එසේ නම්, බදු දීමට අපේක්ෂිත සමාගම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1666/'11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව සතුව පවතින වර්තමාන රත්‍රන් සංචිතය කොපමණද;

(ii) 2005 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව සතුව තිබූ රත්‍රන් සංචිත ප්‍රමාණයන් වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2011 වර්ෂය තුළ තිබූ රත්‍රන් සංචිතයෙන් කොටසක් විකුණා ඇමුවේද;

(iv) එසේ නම්, විකුණූ රත්‍රන් ප්‍රමාණය කොපමණද;

(v) එලෙස රත්‍රන් විකිණීමට හේතු කවරේද;

(vi) එම රත්‍රන් මිලදී ගත් රට හෝ පුද්ගලයින් කවරේද;

(vii) රත්‍රන් විකිණීමෙන් ලද මුදල කොපමණද;

(viii) එම මුදල් කවර කාර්යයක් සඳහා භාවිතා කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2024/'11

4\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාර්ගවල කාපට් ඇතිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2011 වර්ෂය තුළ ලබා දී ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(ii) එම මුදල් යොදා සකස් කොට ඇති මාර්ග කවරේද;

(iii) එකී එක් එක් මාර්ගයේ කාපට් අතුරා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(iv) එම කාපට් ඇතිරීම සඳහා භාවිතා කළ කාපට් මිශ්‍රණ කියුබ් ගණන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ග කාපට් ඇතිරීම සිදුකළ කොන්ත්‍රාත් සමාගම හෝ සමාගම් කවරේද;

(ii) එකී එක් එක් සමාගම වෙත එම කොන්ත්‍රාත් ලබා දීමට අදාළව ගිවිසුම් අත්සන් කර තිබේද;

(iii) එසේ නම්, එම ගිවිසුම් සභාගත කරන්නේද;

(iv) ගිවිසුම් අත්සන්කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත කොන්ත්‍රාත් ලබා දීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළේද;

(ii) එසේ නොමැති නම්, කොන්ත්‍රාත් ලබාදීම සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iii) ඉහත කී ව්‍යාපෘතිවලදී සිදුවිය හැකි අක්‍රමිකතා වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2095/'11

5\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ වර්ෂ 30 ක් පුරා පැවති යුද්ධය නිමා කිරීමට ත්‍රිවිධ හමුදාව හා සමානව ශ්‍රී ලංකා පොලීසියද විශාල මෙහෙවරක් ඉටුකළ බවත්;

(ii) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ වැටුප් හා ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ වැටුප් අතර වෙනසක් පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) මෙම පොලිස් නිලධාරීන්ගේ වැටුප් ත්‍රිවිධ හමුදාවේ සමාන තනතුරු දරන නිලධාරීන්ගේ වැටුපට සමානව ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2110/'11

6.

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පිහිටි වාණිජ බැංකුවල, සේවක අර්ථසාධක අරමුදල මගින් හිමිකාරීත්වය දරන කොටස් හිමිකමේ වටිනාකම, එම එක් එක් බැංකුව අනුව කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් සමාගමේ කොටස් ප්‍රමාණයන් මිලදීගත් දිනයන් කවරේද;

(iii) එම එක් එක් සමාගමේ කොටස් හිමිකම මිලදීගනු ලැබුවේ කවර පුද්ගලයකු සහ/හෝ පුද්ගලයින්ගෙන්ද;

(iv) එම එක් එක් කොටස් ප්‍රමාණය මිලදීගනු ලැබූ වටිනාකම කවරේද;

(v) ඉහත සඳහන් අයුරින් මිලදීගත් කොටස් පසුව විකුණා ඇත්නම්, එම කොටස් විකිණූ මිල කවරේද සහ එම කොටස් විකුණනු ලැබුවේ කවර පුද්ගලයන්ටද;

(vi) එලෙස කොටස් හිමිකාරීත්වය දරන එක් එක් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා රජය සහ/හෝ සේවක අර්ථසාධක අරමුදල හෝ විසින් නම් කළ අයගේ නම්, තනතුරු සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1602/'11

7.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශිකයන් විසින් ශ්‍රී ලංකාවේ ඉඩම් හා ගොඩනැගිලි මිලටගැනීමේදී 100% ක බද්දක් පැනවීම සඳහා වූ පනත හඳුන්වාදුන් දිනය කවරේද;

(ii) එබඳු නීතියක් හඳුන්වාදීමේ අරමුණ කුමක්ද;

(iii) ඉහත කී පනතේ විධිවිධාන යටතේ එහි ආරම්භයේ සිට මේ දක්වා එම බද්ද ගෙවා ඇති විදේශීය සමාගම්/පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) වාර්ෂික පදනමින් ඔවුන් මේ දක්වා ගෙවා ඇති මුදල කොපමණද;

(v) ඉහත කී බද්ද ගෙවීමෙන් නිදහස්කර ඇති සමාගම්/විදේශීය පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1637/'11

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලුතර දිස්ත්‍රික්කයේ, අගලවත්ත ප්‍රදේශයේ, මදුරාවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ, නිවි වැටල් වතු රෝහලේ ගොඩනැගිලි අබලන් වී ඇති බවත් ;

(ii) රෝහල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිලධාරීන් විසින් ඇස්තමේන්තු සකස්කර ඇති බවත්;

(iii) මෙම රෝහලේ අත්‍යාවශ්‍ය බෙහෙත් වර්ග පවා නොමැති වීමෙන් ප්‍රදේශයේ ජනතාව දැඩි දුෂ්කරතාවන්ට මුහුණපාන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත තත්ත්වය මඟ හැරවීම සඳහා රෝහල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1903/'11

9.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාවේ (CSN) අයිතිය රජය හෝ රජය අනුබද්ධ ආයතනයක් සතුවන්නේද;

(ii) එහි අයිතිය පෞද්ගලික ආයතනයක් සතු නම්, එම ආයතනයේ හිමිකරු හෝ හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාවේ විකාශන කටයුතු ආරම්භ කළ දිනය හෝ ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

(ii) එම නාලිකාව ආරම්භ කිරීමට වෙන් කළ තරංග පරාසයන් (frequency range) කවරේද;

(iii) කාල්ටන් ක්‍රීඩා නාලිකාවට විකාශන අයිතිය ලබා දෙන ලද්දේ කවර කාලසීමාවක් සඳහාද;

(iv) එම නාලිකාව ආරම්භ කිරීමට අනුමතිය ලබා දුන් ලේඛන සහ විකාශන අයිතිය ලබා දීමට අදාළ ගිවිසුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) එම නාලිකාව ආරම්භ කිරීම සඳහා ගෙවන ලද මුදල කොපමණද;

(ii) එම ගෙවීමට අදාළ ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2096/'11

10.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන වැඩ පිළිවෙළට අනුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ගව සම්පත වර්ධනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ගවයින් සඳහා වෙන් කර ඇති තෘණ බිම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තෘණ බිම් අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ග්‍රාමීය මට්ටමේ කුඩා පරිමාණ ගොවීන්ට තම ගවයින් ඇති කිරීමට තෘණ භූමි වෙන්කර දෙන්නේද;

(iv) කුඩා පරිමාණයෙන් ග්‍රාමීය මට්ටමින් කිරි ගවයින් ඇති කරන ගොවීන්ගේ සුභ සිද්ධිය සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2111/'11

11.
ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා රජය විසින් සහ එහි කවර හෝ නියෝජිත ආයතනයක් විසින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ හිමිකාරීත්වය දරනු ලබන මූල්‍ය සහ/හෝ අරමුදල් කළමනාකරණ සමාගම්වල නම් කවරේද;

(ii) මෙම එක් එක් සමාගමෙහි නිකුත්කළ ප්‍රාග්ධනය කවරේද;

(iii) අවසන්වරට නිකුත් වූ අදාළ සහතික කරන ලද ශේෂ පත්‍රයන්හි සඳහන් පරිදි මෙම එක් එක් සමාගමෙහි සමස්ත වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත කී සමාගම්වල පවතින අධ්‍යක්ෂ මණ්ඩල කීපයෙහි සිටින එක් එක් සාමාජිකයාගේ නම, තනතුර සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1638/'11

12.
ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රදේශයේ, කටුපිළදඬුව අධිබල විදුලි යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් කටයුතු වර්ෂ කිහිපයක සිට නවතා දමා ඇති බවත්;

(ii) එම ප්‍රදේශයේ ගම්මානවලට ප්‍රමාණවත් විදුලි ධාරිතාවක් නොලැබෙන බැවින් ප්‍රදේශවාසීන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම විදුලි යෝජනා ක්‍රමයේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1705/'11

13.
ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලොව පුරා පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල හෝ මහ කොමසාරිස් කාර්යාලවල සේවයේ නියුතු, තානාපතිවරු හෝ මහ කොමසාරිස්වරුන්ගේ නම්, ඔවුන් සේවයේ නියුතු රට අනුව කවරේද;

(ii) කිසියම් තානාපතිවරයෙකු හෝ මහ කොමසාරිස්වරයෙකු විසින් සිය ප්‍රධාන කාර්යාලයේ සිට වෙනත් රටවල් ද ආවරණය කරමින් සේවය කරන්නේ නම් එම රටවල නම් කවරේද;

(iii) විදේශ දූත සේවාවෙන් පත්කර ඇති තානාපතිවරුන්ගේ / මහ කොමසාරිස්වරුන්ගේ සේවා පළපුරුද්ද කවරේද;

(iv) දේශපාලන පදනමින් තනතුරට පත්කර ඇති තානාපතිවරුන්ගේ / මහ කොමසාරිස්වරුන්ගේ සේවා පළපුරුද්ද හෝ සුදුසුකම් කවරේද;

(v) ශ්‍රී ලංකාව වෙනුවෙන් පසුගිය වසර පහක කාලය එක් එක් තානාපති කාර්යාලය විසින් ඉටුකරන ලද වැදගත් කාර්යයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවෙන් ඉහත සඳහන් එක් එක් තානාපති කාර්යාලයට හෝ මහ කොමසාරිස් කාර්යාලයට පත්කර යවන ලද කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කවරේද;

(ii) ඉහත සඳහන් එක් එක් තානාපති කර්යාලයේ හෝ මහ කොමසාරිස් කාර්යාලයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් වාර්ෂිකව දරන ලද පිරිවැය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1904/'11

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෙලිකොප්ටර් යානා මිලදී ගැනීමට කටයුතු යොදා තිබුනේද;

(ii) එසේ නම්, මිලදී ගනු ලැබූ හෙලිකොප්ටර් සංඛ්‍යාව එක් එක් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් යානාවක් මිලදී ගැනීම සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) හෙලිකොප්ටර් යානා මිළදීගත් රට කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම හෙලිකොප්ටර් යානා මිලදී ගත් පදනම කවරේද;

(ii) ණය හෝ ණය ආධාර පදනම යටතේ ලබා ගත්තේ නම්, එය ගෙවා අවසන් කළ යුතු කාල සීමාව කවරේද;

(iii) එම ගනුදෙනුවට අදාළ සියලු ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2097/'11

15.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1999 වර්ෂයේ රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ 2005 වර්ෂයේ රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ වැඩසටහන යටතේ රාජ්‍ය සේවයට බඳවා ගන්නා ලද උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ බඳවාගැනීම් උසස්වීම් ක්‍රමයක් සහිත නිශ්චිත බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියක් යටතේ සිදුකරනු ලැබුවේද;

(iii) ඉහත පරිදි බඳවා ගත් මුළු උපාධිධාරීන් අතරින් විධිමත් ක්‍රියා පටිපාටියකට අනුව උසස්වීම් ලබාගැනීමට හැකිවූ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) රාජ්‍ය සේවයට පිවිසෙන කාර්යාල කාර්ය සහායකවරයෙකුටද මාණ්ඩලික ශ්‍රේණියකට පත්වී විශ්‍රාමයාමට හැකි උසස්වීම් ක්‍රියා පටිපාටියක් පවතින රාජ්‍ය සේවයට බඳවා ගත් උපාධිධාරීන්ට ද නිශ්චිත පටිපාටියක් අනුව උසස්වීම් ලබාදීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 8/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/'10

2.

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/'10

3.

ගරු රවි කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/'10

4.

ගරු රවි කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'10

5.

ගරු රවි කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම

සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

7.

ගරු රවී කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

9.

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා "තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

11.

ගරු රවී කරුණානායක මහතා,— "විශේෂ නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" නමින් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

12.

ගරු රවි කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

13.

ගරු රවි කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

14.

ගරු රවි කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ත වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

15.

ගරු රවි කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

16.

ගරු රවි කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

17.

ගරු රවි කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

18.

ගරු රවි කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර

ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

19.

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

20.

ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

21.

ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

22.

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

23.

ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

24.

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

25.

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

26.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය

තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

27.

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යැයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතුයැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

28.

ගරු රවී කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

29.

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවීව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

30.

ගරු රවී කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

31.

ගරු රවී කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/'10

32.

ගරු අජිත් කුමාර මහතා,— ශ්‍රී ලංකාවේ වටිනා ස්වභාවික සම්පත් හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම වටිනා ස්වාභාවික සම්පත් ලෙස සැලකෙන සිංහරාජ වනාන්තරය, කන්නෙලිය රක්ෂිත වනාන්තරය, රූමස්සල කන්ද, කොග්ගල ඔය දූපත් හා කඩොලාන පද්ධතිය, රමිසා තෙත් බිමක් වන මාදු ගඟ හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත් විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'10

33.

ගරු අජිත් කුමාර මහතා,— ගාලු කොටුව හා ඒ ආශ්‍රිත ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම හා නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම,— සංචාරක කර්මාන්තයේ ඉතා වැදගත් මධ්‍යස්ථානයක් වූ ද, ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු වූ ද, ලෝක උරුමයක් ලෙස සැලකෙන ගාලු කොටුපවුර, ගාලු කොටුව ඇතුළත හා ගාලු කොටුව ආශ්‍රිතව ඇති ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන හා ජන සහභාගීත්වය ඇතිව

විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කරමින් අප රටට මෙම ඓතිහාසික උරුමයේ නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'10

34.

ගරු තිලංග සුමතිපාල මහතා,— මාධ්‍ය නිදහස හා තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළම තොරතුරු දැනගැනීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කර ඇති හෙයින් ද, තාක්ෂණය දියුණු වෙමින් පවතින ලෝකයක සත්‍ය සැඟවීමට හෝ වසන් කිරීමට අවස්ථාවක් නොමැති හෙයින් ද, ප්‍රජාතාන්ත්‍රික රටක සියලු පුරවැසියන්ට නිදහස් මාධ්‍ය තුළින් දැනුම හා අවබෝධය ලබාගැනීමේ අවකාශය ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'10

35.

ගරු තිලංග සුමතිපාල මහතා,—ක්‍රීඩාව තුළින් නිරෝගීමත් සමාජයක් නිර්මාණය කිරීම,— ළමා අවධියේදීම දරුවන් ක්‍රීඩාවට යොමු කිරීම තුළින් නිරෝගීමත් සමාජයක් බිහිකිරීමටත්, සහජ කුසලතා ඇති දරුවන් ජාත්‍යන්තර තලයට යොමු කිරීමටත්, ලොව සුපතල ක්‍රීඩකයින් බිහි කර රටට කීර්තියක් ලබා ගැනීමටත් හැකිවන පරිදි ජාති භේදයෙන් පන්ති භේදයෙන් තොරවූ සාධාරණ ක්‍රම වේදයක් රාජ්‍ය මට්ටමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

36.

ගරු රවී කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

37.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

38.

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'10

39.

ගරු රවී කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'10

40.

ගරු රවි කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'10

41.

ගරු රවි කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

42.

ගරු රවි කරුණානායක මහතා,— මුළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මුළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/'10

43.

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සාමවිනිසුරු පත්වීම් ලබා දීම,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් මුදල් සහ වරප්‍රසාද අපේක්ෂාවෙන් තොරව ඔවුන්ගෙන් සමාජයට ඉටුවිය යුතු සමාජ වගකීමක් ලෙස සලකා විශේෂයෙන් ග්‍රාමීය ජනතාවට විශාල සේවාවක් ඉටු කරනු ලබන බැවින් එම සේවාවට ගරු කිරීමක් ලෙස ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සියලුම දෙනාට සාමවිනිසුරු පදවි ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/'10

44.

ගරු බුද්ධික පතිරණ මහතා,— සාමවිනිසුරු තනතුරු ලබා දීමේ දී විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— මුළු මහත් සමාජයම පොදුවේ පිළිගනු ලබන සහ සමාජයට විශාල සේවාවක් සපයනු ලබන තනතුරක් වන සාමවිනිසුරු තනතුරු ලබා දීමේදී ඒ සඳහා සුදුසු නිර්නායක පදනම් කොට ගෙන එම තනතුරු ලබා නොදීම නිසා එම තනතුරෙහි ගෞරවය හා පොදු පිළිගැනීම ක්‍රමයෙන් හීන වන බැවින් ඒ සඳහා පොදුවේ පිළිගත හැකි නිර්නායක පදනම් කර ගන්නා වූ ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'10

45.

ගරු බුද්ධික පතිරණ මහතා,— සුනාමි ඛේදවාචකයෙන් ඇතිවූ ගැටලු විසඳීම,— සුනාමි ඛේදවාචකය හේතුවෙන් කුමන හෝ ආකාරයේ ගැටලුවකට මුහුණ දී මේ වන තෙක් නොවිසඳී පවතින ගැටලු තිබේ නම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස මට්ටමින් සොයා බලා ඔවුන් මුහුණ දී ඇති හා දැනටත් මුහුණ දෙනු ලබන ගැටලු අවම කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/'10

46.

ගරු බුද්ධික පතිරණ මහතා,— ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ රැකියා උත්පාදන ක්ෂේත්‍ර තුළ විවිධ නිෂ්පාදන කටයුතු කරන දසලක්ෂයකට ආසන්න ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා දේශපාලන බල අධිකාරිය ඒ සඳහා සබැඳි සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ද සහාය ලබා ගනිමින් විධිමත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට එය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/'10

47.

ගරු බුද්ධික පතිරණ මහතා,—වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායි කටයුතු සඳහා යොදා ගැනීම,—කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල ඵලදායී කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත් ,ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

48.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'10

49.

ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදී සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'10

50.

ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'10

51.

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන්

අනිවාර්යයෙන්ම වන්ද්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

52.

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම—, අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

53.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

54.

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි භව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

55.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයිනගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

56.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

57.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්,

නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

58.

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

59.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

60.

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

61.

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/'10

62.

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දුරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/'10

63.

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යයනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඩුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/'10

64.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/'10

65.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/'10

66.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/'10

67.

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/'10

68.

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/'10

69.

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,—පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

70.

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

71.

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම ,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/'10

72.

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/'10

73.

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,—පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 104/'10

74.

ගරු. (අල්හාජ්) ඒ.එච්.එම්. අස්වර් මහතා,— තල් ගස් වගාව දිරිමත් කිරීම,— "කප්පගතරු" යන නමින් හැඳින්වෙන පොදු ජනතාවට ඉමහත් ප්‍රයෝජනවත් වන තල් ගස් වගාව දිරිමත්

කිරීමෙන් තල් ආශ්‍රිත නිෂ්පදන ප්‍රවර්ධනයට සියලු පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

75.

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

76.

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'10

77.

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'10

78.

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

79.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

80.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ

ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

81.

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

82.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

83.

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

84.

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'10

85.

ගරු රුවන් රණතුංග මහතා,— අතුරු බෙදීම් තහනම් නිකුත්කර ඇති රජයේ දීමනා පත්‍ර ඉඩම්වල අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම,— ජය භූමි, ස්වර්ණ භූමි, රත්න භූමි ආදී රජයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ගේ ඉඩම්වල අතුරු බෙදීම් තහනම් වුවත්, මුල් ඉඩම්ලාභීන්ගේ දෙවන පරම්පරාවේ අයිතිය තහවුරු කිරීමටත්, ඔවුන්ගේ ගේ දොර වතුපිටිවල සංවර්ධන කටයුතු කිරීමටත් අතුරු බෙදීම් අවශ්‍යතා පැන නැගුණු විට, පළාත් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් සහ ජනාධිපති ලේකම් කාර්යාලය හරහා දැනට ක්‍රියාත්මක වන දීර්ඝ ක්‍රියාවලිය අවම කොට අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීමට අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

86.

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස

තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

87.

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

88.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'11

89.

ගරු රුවන් රණතුංග මහතා,— රාජ්‍ය බැංකුවල පොලී ගෙවීම සහ පොලී අයකිරීම අතර පවතින පරතරය අඩු කිරීම,— රාජ්‍ය බැංකුවල සාමාන්‍ය ඉතුරුම් තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 4 % සිට 4.5 % දක්වාද ස්ථාවර තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 8 % පමණ ද වන අතර බැංකු විසින් නිවාස, ව්‍යාපාරික සහ කෘෂිකාර්මික වැනි ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතය 12 % සිට 13 % ක් ද පමණ වන බැවින් ජනතාවට සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට අතදීම සඳහාත් ඔවුන් දිරිගැන්වීම සඳහාත් මෙම අයකරන පොලිය සහ ගෙවන පොලිය අතර පවතින පරතරය අඩුකිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'11

90.

ගරු රුවන් රණතුංග මහතා,— උපාධිධාරී ග්‍රාම නිලධාරීන් අගැයීම සඳහා දීමනාවක් ලබා දීම,— රාජ්‍ය සේවය ගම් මට්ටමින් ජනතාවට ලබා දීම සඳහා සේවය කරන ග්‍රාම නිලධාරීන් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් පසුව තරඟ විභාග ලකුණු මත බඳවා ගෙන ඇතත්, දැනට සේවයේ යෙදී සිටින ග්‍රාම නිලධාරීන් අතුරින් 30 % ක් 40 % ක් පමණ පිරිසක් උපාධි සුදුසුකම් ලබා ඇති අතර එයට කිසිදු සැලකිල්ලක් මෙතෙක් දක්වා නැති බැවින් උපාධි සුදුසුකම අගැයීම සඳහා උපාධිධාරී ග්‍රාම නිලධාරීන්ට වැටුප් වැඩිවීමක් හෝ දීමනාවක් ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'11

91.

ගරු රුවන් රණතුංග මහතා,— ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත් සහ වාර සඟරාවල බුද්ධ රූපය පළ කිරීම තහනම් කිරීම,— දෛනික පුවත්පත්වල සහ වාර සඟරාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප කිසිදු පාලනයකින් තොරව අසීමිතව මුද්‍රණය කෙරෙන අතර එම පත්‍රිකා විවිධ භාණ්ඩ දවටන සහ වෙනත් අයෝග්‍ය කටයුතු සඳහා භාවිතා කිරීම බුදුරජාණන්වහන්සේට අගෞරවයක් වන බැවින් 2600 වැනි සම්බුද්ධ ජයන්තිය සැමරීම ද සැලකිල්ලට ගෙන මින් ඉදිරියට ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත්, වාර සඟරා සහ වෙනත් පත්‍රිකාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප පළ කිරීම තහනම් කිරීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.126/'11

92.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ත්‍රිභාෂා ශ්‍රී ලංකාවක් සඳහා "සහෝදර පාසල් වැඩසටහනක්" ස්ථාපනය කිරීම,— ත්‍රිභාෂා ශ්‍රී ලංකාවක් සඳහා වන දස අවුරුදු ජාතික සැලැස්මක් ඇති කිරීම ජාතික ඒකාබද්ධතාව සහ සමාජ සංහිඳියාව සඳහා ඉතා වැදගත් ක්‍රියා මාර්ගයක් බැවින්, කෙටි කාලීන නිරාවරණ වැඩ සටහන් යටතේ ශිෂ්‍යයන් සහ ගුරුවරුන් හුවමාරුව සඳහා "සහෝදර පාසල් වැඩසටහනක්" මගින් බහුතරයක් සිංහල භාෂාව කථා කරන ප්‍රදේශවල තිබෙන එක් එක් පාසල්, දෙමළ මාධ්‍ය පාසල් සමග සම්බන්ධ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'11

93.

ගරු රවි කරුණානායක මහතා,— ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය නැවත නම් කිරීම,— නිදහස් අධ්‍යාපනයේ පියා වන දිවංගත ගරු (ආචාර්ය) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාට ගෞරවයක් වශයෙන් ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය එතුමාගේ නමින් නැවත නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.128/'11

94.

ගරු අජිත් කුමාර මහතා,— පූර්ව ළමා විය අධ්‍යාපනය පිළිබඳව ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම,— අප රට තුළ දරුවන්ගේ අධ්‍යාපනයේ ඉතා වැදගත් අවස්ථාවක් වන පූර්ව ළමා විය අධ්‍යාපනය ලබා දීම (පෙර පාසල් අධ්‍යාපනය) පිළිබඳව ජාතික වැඩපිළිවෙළක් සකස් කළ යුතු අතර පෙර පාසල් පාලිකාවන්ට විධිමත් පුහුණුවක් හා බඳවා ගැනීමේ ක්‍රමයක් සමගින් වැටුප් ක්‍රමයක් ද සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.129/'11

95.

ගරු අජිත් කුමාර මහතා,— ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික ස්ථාන පිළිබඳ නිබන්ධනයක් සකස් කිරීම,— ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික, පුරා විද්‍යාත්මක හා සංස්කෘතිකමය වශයෙන් වටිනා ස්ථාන සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදුකර ඒ පිළිබඳව ශාස්ත්‍රීය වශයෙන් වටිනාකමක් ඇති නිබන්ධනයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/'11

96.

ගරු රවි කරුණානායක මහතා,— මැතිවරණ ක්‍රියාවලිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම,— මැතිවරණ ක්‍රියා පටිපාටිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ස්ථිර පදනමකින් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/'11

97.

ගරු රවි කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදලින් සහ සේවක භාරකාර අරමුදලින් කඩිනමින් මුදල් ගෙවීම,— සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය දරන සියලුම සාමාජිකයින්ට ගෙවිය යුතු මුදල් ක්‍රියාකාරී සේවයෙන් විශ්‍රාම ගෙන එක් මසක් ගතවීමෙන් අනතුරුව ගෙවීම සඳහා විධිවිධාන සැළසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/'11

98.

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය මාධ්‍යවල අපක්ෂපාතීත්වය තහවුරු කිරීම,— රාජ්‍ය මාධ්‍ය ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට පමණක්ම හිමි වූ තනි අයිතිවාසිකමක්වන නිසාත්, රජයේ මාධ්‍ය නිරන්තරවම දේශපාලනීකරණයට ලක්වීමක් සිදුවී තිබෙන නිසාත් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි

වී සිටින සියලුම දේශපාලන පක්ෂවලට රාජ්‍ය මාධ්‍ය තුළින් සමාන ලෙස සැලකීම සහ සමාන ලෙස අවස්ථාවන් ලබාදීම තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/'11

99.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය සේවයේ භාෂා ප්‍රවීණත්වයේ අවශ්‍යතාව,— වර්ෂ 2025 වන විට සියලුම රජයේ සේවකයන්ට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම වැඩ කටයුතු කිරීමට, ලිපි හුවමාරු කර ගැනීමට සහ කථා කිරීමට හැකි වීම රජය විසින් අනිවාර්ය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/'11

100.

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කරදීම,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා වෙත, දළ ජාතික නිෂ්පාදිතයෙන් 1% කට සමාන වූ විමධ්‍යගත අයවැය මුදලක් වාර්ෂිකව වෙන්කළ යුතු බවත් එම වෙන්කිරීමෙන්, 50% ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් උපයෝගීකර ගැනීමටත් ශේෂය රජයේ නිර්ණායක මත පදනම්ව තම ඡන්ද දායකයින් වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ අභිමතය පරිදි කවර හෝ පදනමකින් උපයෝගී කර ගැනීම සඳහාත් හිමිකම් ලබා දිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'11

101.

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'11

102.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.140/'11

103.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පොල් කර්මාන්තයෙහි සහ පොල් සම්පත්වල සංවර්ධනය හා ප්‍රවර්ධනය විධිමත් කිරීම,— වාණිජමය නිෂ්පාදන අතර ඉතා වැදගත් ස්ථානයක් පොල්වලට හිමි වන හෙයින් පොල් සම්පත් සහ ඒවායේ පරිසරය තිරසාරව පවත්වා ගන්නා අතරම දළ දේශීය නිෂ්පාදිතයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙන ලෙස පොල් කර්මාන්තය සහ පොල් සම්පත්වල සංවර්ධනය විධිමත් කොට ප්‍රවර්ධනය කිරීම උදෙසා අර්ථාන්විත පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.141/'11

104.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කිතුල් කර්මාන්තය නගා සිටුවීම උදෙසා කිතුල් වගා කිරීම වැඩි කිරීම,— ග්‍රාමීය කර්මාන්ත කෙරෙහි කිතුල් මගින් සිදු කරනා සුවිශාල දායකත්වය හේතු කොට ගෙන ග්‍රාමීය කර්මාන්ත සහ ග්‍රාමීය ප්‍රජාව නගා සිටුවීම පිණිස වගාවන් තුළ කිතුල් ගහනය වැඩි කිරීම සඳහා වන අපගේ දිරිය සැලසුමට අනුගතව නව කිතුල් වගාවන් සංඛ්‍යාව වැඩි කිරීම උදෙසා නිසි ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.142/'11

105.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් සුරක්ෂිත කිරීම,— තිරසාර ජාතික සංවර්ධනයක් සහ ස්වකීය ජනතාවගේ සහ ආර්ථිකයේ යහ පැවැත්ම උදෙසා, වසර 2020 වන විට ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් තහවුරු කිරීම පිණිස පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.143/'11

106.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කිරීම— කජු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකැසුම, අලෙවි කිරීම සහ වගා කිරීමට ආධාර කිරීම සහ එමගින් ප්‍රධාන පෙළේ, තත්වයෙන් උසස් සහ වටිනාකම එකතු කළ කජු නිෂ්පාදකයකු සහ අපනයනකරුවකු බවට පත්වීම සඳහා ශ්‍රී ලංකාවට සහාය ලබා දීම පිණිස කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.144/'11

107.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය කිරීම,— අම්පාර දිස්ත්‍රික්කයේ අභාවයට යන සම්ප්‍රදායික කර්මාන්ත වන අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය, කුඹල් කර්මාන්තය, තල් කොළ හා පන් ගස්වලින් පෙට්ටි, වට්ටි හා පැදුරු වියීම, කොහු කර්මාන්තය හා වේවැල් කර්මාන්තය යනාදිය සංවර්ධනය කර, එම ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථාවන් උදාකර දීමෙන් ඔවුන්ගේ ආදායම නංවාලීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.146/'11

108.

ගරු තිලංග සුමතිපාල මහතා,— ආයුධ වෙළඳාම සඳහා විධිමත් පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීම,—ජාත්‍යන්තර වශයෙන්, කිසිදු පාලනයකින් තොරව ආයුධ වෙළඳාම ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව වැනි රටවලට ආයුධ ගලා ඒම සහ එම රටවල් තුළ අවිධිමත් ලෙස ආයුධ සංසරණයවීම, ජනසමාජයේ නිදහසට ඉමහත් බාධකයක් ද ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බලයට පත් රජයකට තර්ජනයක් හා බලපෑමක් මෙන්ම රට තුළ මත්ද්‍රව්‍ය සහ ගණිකා වෘත්තිය වැනි නීති විරෝධී ක්‍රියාකාරකම් පුළුල් වීම සඳහා හේතුවක්ද වී ඇත. ඉහත තත්ත්වය වළක්වාලමින් විනයගරුක, නීතිගරුක සහ සදාචාර සම්පන්න සමාජයක් ජනිත කිරීම මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි අපේක්ෂාවක් වන බැවින් ද, වර්තමාන ලෝකයේ බලාපොරොත්තුව අවි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම මගින් සමාජ අරගල අවම කර සමාජ සුභ සාධනය සහතික කිරීම වන බැවින් ද, මෙම විෂමාචාරයන් පිටුදැකීම සඳහා ජාත්‍යන්තර ගිවිසුම්වලට හා ප්‍රඥප්තිවලට අදාළව දේශීය නීති පද්ධතියක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.147/'11

109.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— රට ඉඳි වගාව හඳුන්වාදීමේ හැකියාව විමසා බැලීම සඳහා පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම,— රට ඉඳි ශාඛය (ෆීනික්ස් ඩැක්ටිලිෆෙරා) අප රටේ වගා කිරීම සම්බන්ධයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩිහි සිදු කරන ලද අත්හදා බැලීමක් සාර්ථක බව පෙනී ගොස් ඇති හෙයින්, අප රටේ ජනතාවට අපේම පොළවේ වවන ලද මෙම රසවත් පළතුරු භුක්ති විඳීමට අවස්ථාව සලසනු පිණිස, රට ඉඳි වගාව හඳුන්වා දීමේ

හැකියාව විමසා බලන පුළුල් අධ්‍යයනයක් සිදු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'11

110.

ගරු රවි කරුණානායක මහතා,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීම,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.152/'11

111.

ගරු රවි කරුණානායක මහතා,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීම,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.153/'11

112.

ගරු රවි කරුණානායක මහතා,— මහ නගර සභාවලට රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා හඳුන්වා දීම,— 2013 ජනවාරි මස 01 වැනි දින වන විට සෑම මහ නගර සභාවකම රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා පිහිටුවීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'11

113.

ගරු රවි කරුණානායක මහතා,— හිමිකම් පනත සම්මත කිරීම,— මානව අභිමානය, සමානාත්මතාව සහ නිදහස යන ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් තහවුරු කරන දකුණු අප්‍රිකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන හිමිකම් පනත හා සමානව රටේ සියලු ජනතාවගේ හිමිකම් සහතික කරමින් එම පනතේ නිශ්චිතව දැක්වෙන සීමාවන්ට යටත්ව රාජ්‍යය විසින් ඒවා ගරු කළ යුතු, ආරක්ෂා කළ යුතු, ප්‍රවර්ධනය කළ යුතු හා ඉටුකර දිය යුතු බවට විධිවිධාන සලස්වන පනතක් ශ්‍රී ලංකාවේ සම්මත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/'11

114.

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශේෂ දීමනා ගෙවීම,— රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් අනුමත කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවහොත් හැර කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කිසිදු විශේෂ දීමනාවක් නොගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2012 ජුනි මස 19 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0773/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2010.06.29 දින නිකුත් කරන ලද මූල්‍ය කළමනාකරණ වාර්තාවට අනුව, ශ්‍රේලයින් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගමට රුපියල් මිලියන 400 ක බැංකු ඇපකරයක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බැංකු ඇපකරය ලබා දීමට හේතු කවරේද;

(ii) එමගින් ලැබුනු ප්‍රතිලාභය කවරේද;

(iii) එම වගකීම නිදහස් කරනු ලබන දිනය කවරේද;

(iv) සමූපකාර තොග වෙළඳ සංස්ථාව, රාජ්‍ය වෙළඳ සමාගම හෝ රාජ්‍ය වෙළඳ සමූපකාර තොග සමාගම වෙත ලබා දී ඇති රුපියල් මිලියන 4200 ක බැංකු ඇපකරය නිදහස් කර නොමැති වීමට හේතු කවරේද;

(v) ඉහත කී ඇපකරය පැවතීම හේතුවෙන් ලැබෙන ප්‍රතිලාභය කවරේද;

(vi) ලංකා විදුලිබල මණ්ඩලයේ ණය ප්‍රමාණය තවදුරටත් වැඩි කරමින් ලංකා විදුලිබල මණ්ඩලය හා ආශ්‍රිත ව්‍යාපෘති සඳහා රුපියල් බිලියන 120 ක බැංකු ඇපකරයක් ලබා දී තිබේද;

(vii) මෙම තත්ත්වය නිවැරදි කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(viii) රජය විසින් මහජන බැංකුවේ විශ්‍රාම අරමුදලෙන් මුදල් ලබා ගැනීමට හේතු කවරේද;

යන්න ඉහත සඳහන් වාර්තාවට අනුව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1158/’11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන අධ්‍යාපන කලාපයට අයත්, මුලටියන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන මාර/අතපත්තුකන්ද කණිෂ්ඨ විද්‍යාලයේ ගුරු නිවාසයේ වහලයේ ලී දිරා ගොස්, දොර ජනෙල් සහ බිත්ති දැඩි සේ අබලන් තත්ත්වයට පත් වී ඇති බවත්;

(ii) එවැනි අබලන් ගුරු නිවාසයක් පැවතීම එම පාසලේ දරුවන්ගේ කටයුතුවලට අවදානමක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අවදානම් සහිත ඉහත ගුරු නිවාසය ඉවත් කර නව ගුරු නිවසක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන් කොට තිබේද;

(iii) වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) ගුරු නිවාසයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

(v) ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1691/’11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුව රාජ්‍ය හා පෞද්ගලික සේවා ආයතන සමඟ එකඟ වී ඇති සේවා ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම් ඇති කරගත් ආයතන කවරේද;

(iii) එම ගිවිසුම් ඇතිකර ගැනීමට හේතු කවරේද;

(iv) එක් එක් ආයතනයට අදාළව ඇති කර ගත් සේවා ගිවිසුම් ආරම්භ වූ දින සහ අවසාන වන දින කවරේද;

(v) එම ගිවිසුම් ඇති කර ගැනීම සඳහා අනුමතිය ලබාදුන් අය කවුරුන්ද;

(vi) එම ගිවිසුම් යටතේ තැපැල් දෙපාර්තමේන්තුවට ලැබෙන ලාභය හෝ පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2099/'11

4\.
ගරු ගයන්ත කරුණාතිලක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආරක්ෂක හමුදාවල සේවය කරන රණවිරුවන්හට ඔවුන්ගේ තුන්වැනි දරුවා ඉපදුන විට රුපියල් ලක්ෂයක දීමනාවක් ලබා දීමට 2011 අයවැයෙන් කළ යෝජනාව ක්‍රියාත්මක කරන ක්‍රමවේදය කවරේද;

(ii) එම දීමනාව ලබා දෙනු ලබන ආරක්ෂක හමුදා නිලයන් කවරේද;

(iii) එය ලබා දීමේදී සක්‍රිය සේවය සැලකිල්ලට ගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1639/'11

5\.
ගරු බුද්ධික පතිරණ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල, මයිලගස්තැන්නේ පිහිටි රජයේ ආහාර ගබඩා සංකීර්ණයක් ලෙස ප්‍රයෝජනයට ගත් ගොඩනැගිල්ල වසා දමා ඇති බවත්;

(ii) රජයේ වාහන විශාල සංඛ්‍යාවක් එම ගොඩනැගිලි භූමියෙහි දිරාපත් වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පරිදි රජයේ සම්පත් විනාශවීමට ඉඩ හැරීම ජාතික අපරාධයක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම ආහාර ගබඩා සංකීර්ණය සහ අදාළ අනෙකුත් සම්පත් කඩිනමින්, ඵලදායී කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම් , එම කටයුතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1706/'11

6\.
ගරු රවී කරුණානායක මහතා,— පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ කාර්යභාරය කවරේද;

(ii) අමාත්‍යාංශයේ සේවයේ නියුතු එහි කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට රට තුළ ධාවනයට යොදාගන්නා මුළු පුද්ගලික බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) නිසි ලියාපදිංචිවීමකින් අනතුරුව ධාවනය වන පුද්ගලික බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iii) නිසි ලියාපදිංචිවීමකින් තොරව ධාවනය වන පුද්ගලික බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) 2000, 2003 සහ 2006 යන වර්ෂ වලදී ධාවනය කරවන ලද පුද්ගලික බස්රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ අටක කාලය තුළ පුද්ගලික බස් ගාස්තු සංශෝධනය වූ අවස්ථා කවරේද;

(ii) ඉකුත් කාලසීමාව තුළ අනුමත කරන ලද බස් ගාස්තු වැඩිවීම් කවරේද;

යන්න වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1905/'11

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ අගෝස්තු මාසයේදී ඉඩම් රජයේ භුක්තියට පවරා ගැනීම සම්බන්ධව අති විශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ගැසට් පත්‍රය නිකුත් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ගැසට් පත්‍රය යටතේ රජය වෙත පවරා ගැනීමට යෝජිත ඉඩම් කවරේද;

(ii) එම ඉඩම් අයිතිකරුවන්ගේ නම්, ලිපිනයන් සහ එක් එක් ඉඩම් හිමියාගෙන් පවරා ගනු ලබන භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී ඉඩම් රජයට පවරා ගැනීමේ ගැසට් පත්‍රය නිකුත් කිරීමට පෙර එම ඉඩම්වල තිබූ දේපලවලට හානි සිදු කර තිබේද;

(iv) එසේ නම්, හානිකරන අවස්ථාව වන විට එකී දේපලවල වටිනාකම් තක්සේරු කිරීමක් සිදු කළේද;

(v) එම දේපල කඩා බිඳ දැමීම සඳහා අනුමතිය ලබා දුන් බලධාරියා කවුරුන්ද;

(vi) එවැනි අනුමතියක් ලබාදීම සඳහා ඔහුට ඇති බලතල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1707/'11

8.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මුළු ජනගහනය කොපමණද;

(ii) වයස අවුරුදු 18 වැඩි ජනගහනය කොපමණද; සහ

(iii) වයස අවුරුදු 18 වැඩි ජනගහනය අතරින් ලියාපදිංචි ඡන්ද දායකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) ඡන්ද බලය අහිමි කරන ලද සහ අඛණ්ඩව ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ඡන්ද දායකයන් විශාල සංඛ්‍යාවක් සිටින බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඡන්දහිමි නාම ලේඛනය යාවත්කාලීන කිරීම වර්ෂයේ ජූනි මස පළමුවැනි දින සිට ජූලි මස තිස්එක් වැනි දින තෙක් කාලයට සීමා කරනු වෙනුවට එය වර්ෂය පුරා සිදුකිරීමට අවස්ථාව සැලසිය හැකිද;

(ii) ඡන්දය ප්‍රකාශ කිරීම අනිවාර්යෙන්ම සිදුකළ යුතු කටයුත්තක් බවට පත්කිරීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1815/'11

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි දිගිලි ඇළ හරහා ඉදිකර ඇති කනමීයගල ලෑලි පාලම දිරාපත්වීම හේතුවෙන් එය භාවිතා කරන ජනතාව දැඩි අනතුරුදායක තත්වයකට මුහුණ දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ස්ථානයේ නව පාලමක් ඉදිකිරීමට සැලසුම්කර තිබේද;

(ii) මේ වනවිට ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1906/'11

10.

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේ සිට ලංකා ඛනිජ වැලි සමාගම විසින් ඛනිජ සම්පත් කැණීම සඳහා ටෙන්ඩර් ලබා දුන් ආයතනවල නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එම සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම ටෙන්ඩර් ලබා දීම අනුමත කළ බලධාරියා හෝ බලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2009, 2010 සහ 2011 වර්ෂවල ලංකා ඛනිජ වැලි සමාගමේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ අයගේ නම, ලිපිනය සහ එම තනතුරට අදාළ සුදුසුකම් කවරේද;

(ii) වර්ෂ 2009 සිට 2011 දක්වා ලංකා ඛනිජ වැලි සමාගම ලැබූ ලාභය හෝ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 ජූනි මස 20 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1065/'11

1.

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ආයෝජන මණ්ඩල පනතේ 16 සහ 17 වගන්ති යටතේ 2009, 2010 සහ 2011 වර්ෂයේ මේ දක්වා පිහිටුවන ලද කර්මාන්තශාලා තුළින් අපේක්‍ෂා කළ මුළු රැකියා සංඛ්‍යාව කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අලුතින් පිහිටුවන ලද ආයෝජන මණ්ඩල සමාගම්හි වාර්ෂික අපනයන ශක්‍යතාවයේ ප්‍රමාණය කවරේද;

(ii) ආයෝජනයන් සිදු කළ ප්‍රධාන රටවල් මොනවාද;

(iii) බදු ගෙවීමට නියමිත දිනයේ සිට ඉහත කී ආයෝජනවලින් අපේක්ෂිත බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1329/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත, ගම්මුල්ල, හීං ඇළ පාලම ඉදිකිරීම සඳහා මීට වර්ෂ කිහිපයකට පෙර මුල් ගල් තැබූ බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාලම ඉදිකිරීම සඳහා,

(i) ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(iv) විදේශ ආධාර ලැබුනේ නම්, එය ප්‍රදානය කළ රට සහ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම පාලමෙහි ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පාලමේ ඉදිකිරීමේ කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(iv) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2037/'11

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝල තාප විදුලි බලාගාරය සඳහා ගල්අඟුරු සැපයීමේ කොන්ත්‍රාත්තුව ලබා දී ඇති සමාගමේ නම කුමක්ද;

(ii) එම කොන්ත්‍රාත්තුව ලබාදීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ අනෙකුත් ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය පත් කළ තාක්‍ෂණ ඇගයීම් කමිටු නිර්දේශය ගල්අඟුරු සපයනු ලබන ඉහත සමාගම වෙත ලබා දී තිබේද;

(ii) එම ඇගයීම් සහතිකය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගල්අඟුරු සැපයීමේ ගිවිසුම ආරම්භවන දිනය සහ බලපවත්නා කාල සීමාව කවරේද;

(ii) එම ගිවිසුම ආරම්භක අවස්ථාවේ සිට 2011 ඔක්තෝබර් මාසය දක්වා සපයා ඇති ගල්අඟුරු මෙට්‍රික් ටොන් සංඛ්‍යාව කොපමණද;

(iii) එකී කාලසීමාව සඳහා සත්‍ය වශයෙන් අවශ්‍ය වූ ගල්අඟුරු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1570/'11

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලය මගින් පාලනය වන මාර/කළුබෝවිටියන මහ විද්‍යාලයේ ගොඩනැගිලි කිහිපයක් දැඩි ලෙස අබලන්ව ඇති බවත්;

(ii) එම පාසලේ සිසු දරුවන් එම අබලන් ගොඩනැගිලි තුළ දැඩි අවදානම් තත්වයක් යටතේ අධ්‍යාපන කටයුතුවල යෙදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඊට අවශ්‍ය ප්‍රතිපාදන මේ වන විට වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) ප්‍රතිපාදන වෙන්කර තිබේ නම්, එහි අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1749/'11

5.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුරකථන සංවාදවලට රහසිගතව සවන්දීම දැනට ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල කටයුත්තක්ද;

(ii) රහසිගතව දුරකථන සංවාදවලට සවන්දීම අතීතයේදී සිදුකර තිබේද;

(iii) එසේ නම්, එම කාලපරිච්ඡේදය කවරේද;

(iv) වගකීම් ඉටුකිරීම විමර්ෂණයට ලක් කෙරෙන විදුලි සංදේශ සමාගම්වල නම් කවරේද;

(v) පුද්ගලයකුගේ මූලික අයිතිවාසිකම්වලට බලපෑමක් ඇති කරන දුරකථන සංවාදවලට රහසිගතව සවන්දීම සඳහා අවසරදීමට හැකි බලධාරියා කවරෙක්ද;

(vi) සිය දුරකථන මාර්ග රහසිගතව ශ්‍රවනය කිරීමට ලක් වූ දේශපාලඥයින්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2039/’11

6.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශීය ටෙලිනාට්‍ය මෙරට රූපවාහිනී නාලිකාවක විකාශය කිරීමේ දී එහි එක් කොටසක් සඳහා රජය අයකර ගන්නා මුදල කොපමණද;

(ii) එම අයකිරීමේ ක්‍රමය ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) ආරම්භක දිනයේ සිට මේ දක්වා එක් එක් රූපවාහිනී නාලිකාව මගින් රජය වෙත ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එයින් ලද සමස්ත ආදායම කොපමණද;

(v) එම මුදල් යොදවන ලද කටයුතු කවරේද;

(vi) අද වනවිට ඉහත අ (i) හි අයකිරීම ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1750/’11

7.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිසි ක්‍රියා පිළිවෙත අනුගමනය කිරීමකින් තොරව ත්‍රිවිධ හමුදා හැරගිය පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් හමුදාව හැර යාමට හේතු වූ කරුණු කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

(iv) එවැනි සේවය හැර යෑම් යළි ඇති නොවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ තුනක කාලය තුළ එක් එක් වර්ෂයේදී ත්‍රිවිධ හමුදාව සඳහා වැය වූ මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1816/’11

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත්, දේවාලගම, නැගෙනහිර ගල්දැට්ට, පුහුල්හේන පාලම ගංවතුර හේතුවෙන් කැඩී බිඳී ගොස් වර්ෂ කිහිපයක් ගත වී ඇති බවත්;

(ii) එම නිසා ප්‍රදේශයේ ජනතාව දැඩි දුෂ්කරතාවන්ට මුහුණපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) පාලමේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගංවතුරෙන් හානි වූ ගල්දැට්ට, පුහුල්හේන පාලම නිසි ප්‍රමිතියකින් තොරව ඉදිකර තිබූ බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2040/'11

9.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එළවළු හා පලතුරු ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් ඇසුරුම් භාවිතා කිරීම අනිවාර්ය කරන ලද දිනය කවරේද;

(ii) එම එක් ප්ලාස්ටික් ඇසුරුමක් සඳහා වැයවන මුදල කොපමණද;

(iii) එම ඇසුරුමක සාමාන්‍යයෙන් ඇසිරිය හැකි එළවළු හෝ පලතුරු කිලෝග්‍රෑම් ගණන කොපමණද;

(iv) එක් ඇසුරුමක ධාරිතාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ඇසුරුම් ක්‍රමය ස්ථාපිත කිරීමේ දී නිසි අධ්‍යයනයක් කර තිබේද;

(ii) එසේ නම්, එම අධ්‍යයන වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ප්ලාස්ටික් ඇසුරුම් මෙරට නිෂ්පාදනය කරන්නේද, නැතහොත් ආනයනය කරන්නේද;

(ii) මෙම ප්ලාස්ටික් ඇසුරුම් නිෂ්පාදනය කරන හෝ ආනයනය කරන ආයතනයේ නම, ලිපිනය, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ප්ලාස්ටික් ඇසුරුම් සැපයීමට අදාළව ක්‍රමවත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළේද;

(iv) එසේ නම්, ඊට ඉදිරිපත් වූ ටෙන්ඩර්කරුවන්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් ඉදිරිපත්කරන ලද මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2012 ජූනි මස 21 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1066/'11

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙරට ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එක් ගම්මානයක සාමාන්‍යයෙන් වාසය කරන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙරට ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) මෙරට සිටින ප්‍රාදේශීය ලේකම්වරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න මෑතකදී ලබාගත් ජනසංගණන සංඛ්‍යාලේඛන ආශ්‍රයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් පළාත, දිස්ත්‍රික්කය, මැතිවරණ කොට්ඨාසය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පිහිටා ඇති ගම්මාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය කොපමණද;

(iii) මීළඟ නිල ජනසංගනනය පැවැත්වීමට නියමිතව ඇති දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1330/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ රෝහල්වලට අවශ්‍ය ඖෂධ වර්ග මිලදීගැනීම සඳහා වර්ෂ 2011 ජනවාරි මස සිට මේ දක්වා කැඳවා ඇති ටෙන්ඩර් සංඛ්‍යාව කොපමණද;

(ii) ඖෂධ සැපයීම සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා පිහිටි රජයේ රෝහල්වල මේ වනවිට අත්‍යවශ්‍ය ඖෂධ වර්ගවල කිසියම් හිඟයක් ඇති වී තිබේද;

(ii) රජයේ රෝහල්වල ඖෂධ හිඟයක් ඇතිවීමට හේතු කවරේද;

(iii) හිඟයක් පවතින ඖෂධ වර්ග කවරේද;

(iv) මෙම තත්ත්වය මගහරවා රජයේ රෝහල්වලට හිඟයකින් තොරව ඖෂධ වර්ග ලබා දීමට කඩිනමින් කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරන වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2041/'11

3\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ සහතික මුද්‍රණය කිරීමේ ටෙන්ඩරය සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ප්‍රසිද්ධ කළ දැන්වීම අනුව අයදුම්පත් ඉදිරිපත් කළ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අවම මිල ගණන් ඉදිරිපත්කර තිබූ ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ටෙන්ඩර් කමිටුවේ සමාජිකයින්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් දරන තනතුර කවරේද;

(ii) මේ වනවිට ටෙන්ඩරය ලබා දී ඇති ආයතනය කවරේද;

(iii) එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ආයතනයට ටෙන්ඩරය ලබා දීමට හේතු කවරේද;

(v) එම ටෙන්ඩරයේ වලංගු කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1751/'11

4\.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂ තුළ රාජ්‍ය අංශයේ උත්පාදනය වූ රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) 2007, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂ තුළදී බිහිවූ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දැනට මෙරට සිටින රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) රාජ්‍ය අංශයේ සේවයේ නියුතු උපාධිධාරියකුට ගෙවනු ලබන සාමාන්‍ය වැටුප කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1817/'11

5\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මො/සි/කෝන්ගස්පිටිය කනිෂ්ඨ විද්‍යාලය ප්‍රධාන මාර්ගයේ සිට කිලෝ මීටර් 12ක් පමණ දුරින් පිහිටි දුෂ්කර පාසලක් බවත්;

(ii) ගොඩනැගිලි පහසුකම් නොලැබීම නිසා එම පාසලේ පංති කාමර තාවකාලිකව තනන ලද ටකරන් මඩුවල පවත්වා ගෙන යන බවත්;

(iii) එම තත්ත්වය සිසු දරුවන්ගේ සහ ගුරුවරුන්ගේ ජීවිතවලට අනතුරුදායක බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත තත්ත්වය යටතේ එම පාසලේ ගුරුවරුන්ගේ හෝ සිසුන්ගේ ජීවිතවලට යම් හානියක් වුවහොත් එහි වගකීම දරනු ලබන අය කවුරුන්ද ;

(ii) පවතින අයහපත් තත්ත්වය මඟහැර මො/සි/කෝන්ගස්පිටිය කනිෂ්ඨ විද්‍යාලයේ පවතින ගොඩනැගිලි අඩුපාඩු සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) වෙන් කර ඇති මුදල කොපමණද;

(v) පාසල් ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2060/’11

6\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි පිරිවෙන් සංඛ්‍යාව හා ඒවායේ දැනට ඉගෙනුම ලබන ශිෂ්‍ය ස්වාමීන්වහන්සේලා/ශිෂ්‍යයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශිෂ්‍ය ස්වාමීන්වහන්සේලාට/ශිෂ්‍යයින්ට මාසිකව යම් ගෙවීමක් කරන්නේද;

(iii) එසේ නම්, එක් අයෙකු සඳහා ගෙවන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් “මෙතෙක් පිරිවෙන් ශිෂ්‍යයන් සඳහා රජයෙන් ලබා දෙන ලද රුපියල් 1,000ක ප්‍රතිපාදනය රුපියල් 2,000 ක් දක්වා වැඩි කරන්නෙමි.” යන පොරොන්දුව මේ වන විට ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ දිනය කවරේද;

(iii) ඒ යටතේ ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වන විට එම පොරොන්දුව ක්‍රියාත්මක නොකරන්නේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1752/’11

7\.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 වර්ෂයේ සිට මේ දක්වා වූ කාල සීමාව තුළ, එක් එක් වර්ෂයේදී,

(i) යුද අධිකරණය හමුවට පමුණුවන ලද ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) යුද හමුදාවේ බ්‍රිගේඩියර් නිලයේ හෝ එම නිලය හා සමතත්ත්වයේ නිලයක සේවය කරන නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ නිලධාරීන් අතරින් යුද අධිකරණය හමුවට පමුණුවන ලද ආරක්ෂක නිලධාරීන්ගේ නම් එම එක් නිලධාරියාට එරෙහිව නැගූ චෝදනාද සමගින් ඉදිරිපත් කරන්නේද;

(iii) එම නිලධාරීන්ට ලබාදුන් දඬුවම්වල කාලසීමාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රටේ පවත්නා අධිකරණ පද්ධතියට යුද අධිකරණය අනුමත කිරීමට සිදුවී තිබේද;

(ii) එසේ නම්, යුද අධිකරණය විසින් ලබාදී ඇති දඬුවම් අවලංගු කිරීමේ හැකියාවක් තිබේද;

(iii) යුද අධිකරණ මඟින් ලබා දුන් තීන්දු ඉවතලීමට බලය ඇති බලධරයා කවරෙක්ද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1818/'11

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බිබිල, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, කොටබෝව මාර්ගයේ එකේ කණුව ප්‍රදේශයේ ඉදිකර ඇති වී අලෙවි මණ්ඩලයට අයත් විශාල ප්‍රමාණයේ වී ගබඩාවක් වර්ෂ විස්සක පමණ කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා ඇති බවත්;

(ii) එම ගබඩාව නැවතත් ප්‍රතිසංස්කරණය කර වී ගබඩා කිරීම සඳහා යොදා ගත හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත ගබඩාව ප්‍රතිසංස්කරණය කරන්නේ නම්, ඊට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) නොඑසේ නම්, වෙනත් කර්මාන්තයක් හෝ මෙහි ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2061/'11

9.

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමික රජයේ සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් වෙනුවෙන් රජය විසින් ක්‍රියාත්මක කරන ප්‍රතිලාභ ලැබිය හැකි රක්ෂණ ක්‍රම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 මහින්ද චින්තනයේ සඳහන් "විශ්‍රාමික රජයේ සේවකයින්ට සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් ඖෂධ සහ වෛද්‍ය ගාස්තු සඳහා වර්ෂයකට රුපියල් 10,000/- ක් වන සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන්නෙමි." යන පොරොන්දුවට අනුව හඳුන්වා දී ඇති රක්ෂණ ක්‍රමය කවරේද;

(ii) ඒ යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ඇති විශ්‍රාමික සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට ප්‍රතිලාභ ලබා ඇති විශ්‍රාමික සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වන විට ප්‍රතිලාභ වශයෙන් ගෙවා ඇති මුදල කොපමණද;

(v) නොඑසේ නම්, එම රක්‍ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා දීම ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ජූනි මස 22 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1069/'11

1\.

ගරු රවී කරුණානායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තෝරාගත් කුඩා සහ මධ්‍ය පරිමාණ මට්ටමේ අපනයනකරුවන්ට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සහාය ලබා දෙන ක්ෂේත්‍ර කවරේද;

(ii) ඉහත දක්වා ඇති ක්ෂේත්‍ර අතරින් හඳුනාගත්, සහාය දැක්වූ ක්ෂේත්‍ර පහක් වෙනුවෙන් අපනයන සංවර්ධන මණ්ඩලය දරන ලද වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවය කරන සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) සේවක මණ්ඩලය වෙන් කර තිබෙන්නේ නිෂ්පාදන පරාසය පදනම් කරගෙනද; නැතහොත් නිෂ්පාදන අපනයනය කරන රට පදනම් කරගෙන ද; එසේ නැත්නම්, අවශ්‍ය අවස්ථාවල අපනයන කරුවන්ට සහාය දීම සඳහා ඔවුන් සංචිතයක් වශයෙන් සිටින්නේද;

(iii) අපනයන සංවර්ධන මණ්ඩලයේ සිටින විශේෂඥයන්ගේ නම් කවරේද;

(iv) ඔවුන් විශේෂඥභාවය ලබා තිබෙන ක්ෂේත්‍ර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1334/'11

2\.

ගරු බුද්ධික පතිරණ මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් දිවයින පුරා පිහිටි කාර්මික විද්‍යාල 38 ක දැනට රජයේ ස්ථිර සේවයේ නියුතු පිළිගැනීමේ නිලධාරී, විදුලි කාර්මික හා වැද්දුම් ශිල්පී යන සේවක පිරිසකට වර්ෂයක පමණ කාලයක සිට වැටුප් නොගෙවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සේවක පිරිසට වැටුප් නොගෙවීමට හේතු කවරේද;

(ii) ඔවුන්ට වැටුප් ගෙවීමට යම්කිසි බාධාවක් පවතී නම්, එය ඉවත් කර කඩිනමින් වැටුප් ගෙවීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2063/'11

3\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ජාත්‍යන්තර මූල්‍ය අංශ ප්‍රධානියා ලෙස අනාවරණය වූ පුද්ගලයාට එරෙහිව මෙරට අධිකරණයක දී නඩු පවරා තිබේද;

(ii) මේ වන විට ඔහුට ලබා දී ඇති දඬුවම් කවරේද;

(iii) එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ජාත්‍යන්තර මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කළ වෙනත් පුද්ගලයින්ට එරෙහිව මෙරට දී නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයින් කවුරුන්ද;

(v) ඔවුන්ට නඩු පවරා ඇති පදනම කවරේද;

(vi) එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ජාත්‍යන්තර මූල්‍ය අංශ ප්‍රධානියාට නඩු පවරා නොතිබේ නම්, ඔහු සිටියදී වෙනත් අයට නඩු පැවරීමටත්, ප්‍රධානියාට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2436/'12

4\.

ගරු ආර්. යෝගරාජන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නියෝජ්‍ය පොලිස්පති තනතුරට මෑතකදී ලබාදුන් උසස්වීම්වලට අදාළව;

(i) අයැදුම්කරුවන්ගේ නම් කවරේද; සහ

(ii) උසස් කරන ලද නිලධාරීන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) සෑම අපේක්ෂකයෙකු සඳහාම ජ්‍යෙෂ්ඨත්වය හා පුද්ගලික වාර්තා මත ලකුණු 70ක් සහ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 30ක් ලබා දී ඇති බව එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම එක් එක් අපේක්ෂකයා ජ්‍යෙෂ්ඨත්වය හා පුද්ගලික වාර්තා පදනම්ව ලබා ගත් ලකුණු සහ ලබාගත් ස්ථාන කවරේද;

(ii) එම සෑම අපේක්ෂකයෙකුම සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණුවල සහ ඉහත (ඇ) (i)හි ලැබූ ලකුණුවල එකතුව මත ලබාගත් ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඈ) (i) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් කවරේද; සහ

(ii) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කළ බලධාරියා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1753/'11

5.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සේවයේ යෙදීමට අවසර ලබාදී ඇති ඉන්දීය ජාතික සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉන්දියානු ජාතිකයන්ගේ වීසා අවශ්‍යතාවන්හි මෙතරම් විශාල වැඩිවීමක් ඇතිවීමට හේතුව කවරේද;

(iii) මෙරටට පැමිණීමේදී ඉන්දියානු ජාතිකයන් හට ලබාදෙන වීසා සඳහා ගාස්තුවක් අය කිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ රැකියාවල නිරතවීමට ශ්‍රමිකයන් 500කට වඩා වැඩි පිරිසකට අවසර දී ඇති වෙනත් රටවල් තිබේද;

(ii) එම විදේශිකයන්ට මෙරට රැකියාවල නිරත වීමට ඉඩ ලබාදීමෙන් ශ්‍රී ලංකාව ලැබූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1819/'11

6.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දිවුලපැලැස්ස මහවැලි ගම්මානයේ ඉදිකරන ලද පානීය ජල ව්‍යාපෘතිය ජලය නොමැති හේතුවෙන් අත්හැර දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජල යෝජනා ක්‍රමය සඳහා වැයකරන ලද මුදල කොපමණද;

(ii) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ජලය ලබාගැනීමේ ශක්‍යතාවය පිළිබඳව අධ්‍යනයක් කරනු ලැබුවේද;

(iii) එම ශක්‍යතා අධ්‍යන වාර්තාවේ ප්‍රතිඵලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දිවුලපැලැස්ස මහවැලි ගම්මානයේ ජල ව්‍යාපෘතිය ඉදිකිරීමේදී අයථා මුදල් පරිහරණයක් සිදු වී ඇති බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඉහත ජල ව්‍යාපෘතිය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2064/'11

7\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදා තූර්ය වාදක මූලස්ථානය පිහිටි ස්ථානය කුමක්ද;

(ii) එය පිහිටි ඉඩමේ ප්‍රමාණය කොපමණද;

(iii) තූර්ය වාදක මූලස්ථානය වෙනත් ස්ථානයක් සඳහා ගෙන යාමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

(v) තූර්ය වාදක මූලස්ථානය දැනට එය පිහිටි ඉඩම යොදා ගැනීමට අපේක්ෂිත කටයුත්ත කවරේද;

(vi) එම ඉඩමේ වර්තමාන වෙළඳපල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තූර්ය වාදක මූලස්ථානය වෙනත් ස්ථානයක් වෙත ගෙන යන්නේ නම්, එම නව ස්ථානයේ ලිපිනය කවරේද;

(ii) එම ස්ථානයේ අයිතිකරුවන් කවුරුන්ද;

(iii) එම ස්ථානය බදු හෝ කුලී පදනම මත ලබා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1754/'11

8\.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල සීමාව තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ රැකියා කිරීමට අවසර ලබාදී ඇති චීන ජාතික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) චීන ජාතිකයන්ගේ වීසා අවශ්‍යතාවල මෙතරම් විශාල වැඩිවීමක් ඇතිවීමට හේතුව කවරේද;

(iii) රටේ මෙතරම් විශාල සේවා වියුක්තිකයන් තිබියදී, විශාල චීන ජාතික ශ්‍රමිකයන් පිරිසක් මෙරට සේවයෙහි සිටීම සාධාරණීකරණය කළ හැකි ආකාරය කවරේද;

(iv) චීන ජාතික ශ්‍රමිකයන් විශාල සංඛ්‍යාවකට මෙරට රැකියා කිරීමට අවසරදීම තුළින්, මෙරටට අහිමිවන ධනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1820/'11

9\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය, බිබුලේවෙල, රුහුණුගම, ගමුඋදා භූමියේ පිහිටි රුපියල් කෝටි ගණනාවක් වටිනා ගොඩනැගිලි සහ දේපළ විනාශවෙමින් පවතින බවත්;

(ii) රජය සතු එම වටිනා දේපල විනාශවීමට ඉඩ හැරීම ජාතික අපරාධයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගොඩනැගිලි සහ භූමිය ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම කුමක්ද;

(iii) එම සැලසුම අනුව කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2065/'11

10.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර මහකනදරා වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එකී ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම පිළිගත් ටෙන්ඩර් පටිපාටියට අනුව ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ටෙන්ඩරය ලබා දුන් ආයතනයේ නම සහ ලිපිනය කවරේද;

(iv) එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහකනදරා වැව ප්‍රතිසංස්කරණය කිරීමේදී අක්‍රමිකතා සිදු වූ බවට ජනාධිපති විමර්ශන අංශය මඟින් හෙළිදරව් කර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ අනුව ඊට චෝදනා ලැබූ නිලධාරීන් කවුරුන්ද;

(iii) එම අවස්ථාවේ දී ඔවුන් දැරූ තනතුරු කවරේද;

(iv) ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

(v) ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති නම්, මේ වන විට ඔවුන් සේවය කරන ස්ථාන කවරේද;

(vi) මේ වන විට ඔවුන් දරන තනතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*1.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සැකසීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් පසුව අධ්‍යාපන ක්‍රමය ප්‍රමාණාත්මකව වර්ධනය වී ඇතත් ඊට සාපේක්ෂව අධ්‍යාපනය ගුණාත්මකව සහ ව්‍යුහාත්මකව වර්ධනය නොවීම නිසා ගුරුවරුන්ටත් සිසු දරු දැරියන් සහ දෙමාපියන්ටත් පීඩාකාරීවන වටපිටාවක් නිර්මාණය වී ඇති හෙයින් ද,

එම කරුණට අදාළව අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විවිධ අකටයුතු හා අසාධාරණකම් මෙන්ම වංචා සහ දූෂණ සිදුවන බවට සමාජ මතයක් නිර්මාණය වී ඇති හෙයින් ද,

සමස්ථ අධ්‍යාපන ක්‍රමයේ සුවිශාල වෙනස්කම් සහ ප්‍රතිසංස්කරණ රැසක් සිදුවිය යුතු බවට පොදු ජන මතයක් ගොඩනැගී ඇති හෙයින් ද,

මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි දක්වා ඇති දැනුම කේන්ද්‍රීය සංවර්ධන උපාය මාර්ගය සැලකිල්ලට ගනිමින්ද,

සමස්ත ලාංකීය ශිෂ්‍ය පරම්පරාවේ අනාගතය නිර්මාණය කිරීමට අදාළ වන ලෙස ළදරු පාසල් අවධියේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා සිසුන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමට අදාළවන පරිදි ජාතික අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීම කල් දැමිය නොහැකි සහ ජාතික ප්‍රමුඛතාව ලැබිය යුතු කරුණක් හෙයින් ද,

(අ) පෙර පාසල්, ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික අධ්‍යාපනයෙහි ඇති විය යුතු ප්‍රමාණාත්මක, ගුණාත්මක සහ ව්‍යුහාත්මක වෙනස්කම් වේ දැයි සොයා බැලීම පිණිසද,

(ආ) ජාතික, ආගමික සහ සංස්කෘතික හර පද්ධතීන් ආරක්ෂා කිරීම සඳහා අධ්‍යාපන ක්‍රමය තුළ ඇති කළ යුතු වෙනස්කම් පිළිබඳව සොයා බැලීම පිණිසද,

(ඇ) පිරිවෙන් අධ්‍යාපනයේ සිදුවිය යුතු වෙනස්කම් පිළිබඳව සොයා බැලීම පිණිසද,

(ඈ) පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේදී නිශ්චිත ක්‍රමවේදයක් තිබේද යන්න සොයා බැලීම පිණිසද,

(ඉ) සියලුම විභාග සහ පරීක්ෂණ ප්‍රතිඵල ඉහළ මට්ටමකට ගෙන ඒම සහ උසස් අධ්‍යාපන සුදුසුකම් නොලබන සිසුන් වෙනුවෙන් අධ්‍යාපන ක්‍රමය තුළ ලබා දිය හැකි විකල්ප ක්‍රියා මාර්ග ඇතිකළ යුතුද යන්න සොයා බැලීම පිණිසද,

(ඊ) විශ්ව විද්‍යාලයට ඇතුල්වීම සඳහා සුදුසුකම් ලැබුවත් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයකට ඇතුළත් නොවී විදේශයන්හි අධ්‍යාපනය ලැබීම පිණිස විදේශ ගතවන සිසුන්ට මෙරට තුළදීම අධ්‍යාපන ඉඩ ප්‍රස්ථා ලබා දිය හැකි ක්‍රමවේදයන් වේදැයි සොයා බැලීම පිණිසද,

(උ) අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මකවීම තුළ ප්‍රාදේශීය, ජාතීන් සහ ආගමික වශයෙන් පවතින විෂමතා ඉවත් කිරීමට ගතයුතු ක්‍රමවේදයන් කවරේදැයි සොයා බැලීම පිණිසද,

(ඌ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේදී මධ්‍යම රජය සහ පළාත් සභා අතර ඇතිවිය යුතු අන්තර් සම්බන්ධතාවන්හි ස්වභාවය පිළිබඳව සොයා බැලීම පිණිසද,

(එ) අධ්‍යාපන ක්‍රියාවලියේදී, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමස්ථ අධ්‍යාපනවේදීන්ගේ වගකීම සහ කාර්යය නිශ්චය කිරීම සඳහා ගතයුතු පියවර කවරේදැයි සොයා බැලීම පිණිසද,

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(2.)

(අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයින් විසිඑක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(ඈ) එහි වාර්තාව එහි පළමු රැස්වීමේ සිට මාස තුනක(03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කෙරෙන එවැනි කාල පරිච්ඡේදයක් තුළ දී පාර්ලිමේන්තුව ඉදිරිපත් කළ යුතුය.

(3.) ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතුය.

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමට ද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද, රැස්වීම් පවත්වාගෙන යෑමට බලය තිබිය යුතු ය.

පා. 37/'10

2.

ගරු රවී කරුණානායක මහතා

ගරු රන්ජන් රාමනායක මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු අර්ජුන රණතුංග මහතා

ගරු නිමල් විජේසිංහ මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු ජේ. ශ්‍රී රංගා මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— රට පුරා පවතින අත්‍යාවශ්‍ය ඖෂධවල උග්‍ර හිඟය පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

අත්‍යාවශ්‍ය ඖෂධවල උග්‍ර හිඟයක් රට පුරා පවතින හෙයින් ද,

මෙම හිඟය සඳහා හේතු ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී හෙළිදරව් කර ඇති හෙයින් ද,

මෙම තත්වය නිවැරදි කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග කඩිනමින් නොගතහොත්, මහත් ව්‍යසනයක් ඇතිවිය හැකි හෙයින් ද,

(අ) මෙම ඖෂධ හිඟය සඳහා හේතු විමසා බැලීම සඳහාත්;

(ආ) මෙම තත්වයෙන් මිදීම සඳහා අවශ්‍ය කෙටි කාලීන ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහාත්;

(ඇ) අනාගතයේ මෙබඳු තත්වයක් යළි ඇතිවීම වැළැක්වීමට ගතයුතු ස්ථිර ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහාත්;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන් ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට ද, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, ලේඛනයක් හෝ වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ එම කාර්ය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු හෝ සහතික කරනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සභය පිණිස අදාළ ක්ෂෙත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට ; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද රැස්වීම් පවත්වාගෙන යෑමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස 6ක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 38/'10

3.

ගරු රවී කරුණානායක මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු ජේ. ශ්‍රී රංගා මහතා

ගරු රන්ජන් රාමනායක මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු අර්ජුන රණතුංග මහතා

ගරු නිමල් විජේසිංහ මහතා,— කොළඹ නගරය හා තදාසන්න ප්‍රදේශවල යළි යළිත් ජල ගැලීම් ඇති වීමට හේතු සොයා බලා වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

පසුගිය දින ගණනාවක් තුළ කොළඹ මහ නගර සහා බල ප්‍රදේශයේ වැඩි කොටසක් සහ කොළඹ දිස්ත්‍රික්කයේ විශාල කොටස් තදබල ජල ගැලීම් වලට ගොදුරු වී ඇති හෙයින් ද,

මෙය, කොළඹ මහ නගර සහා බල ප්‍රදේශය සහ දිස්ත්‍රික්කය තුළ වෙසෙන පුරවැසියන්ගේ ජීවිත වල නිරන්තරයෙන් යළි යළිත් ඇතිවන ලක්ෂණයක් බවට පත්ව ඇති හෙයින් ද,

මේ පිළිබඳ වගකීම ඇත්තවුන් මෙම තත්ත්වය පාලනය කිරීමට කිසිදු ප්‍රයත්නයක් දරා නොමැති හෙයින් ද,

මෙම ජල ගැලීම් යළි යළිත් ඇතිවීම වැළැක්වීම පිණිස කිසිදු ක්‍රියාමාර්ගයක් ගනු ලැබ නොමැති හෙයින් ද,

කාලයත් සමඟ තත්ත්වය වඩ වඩාත් නරක අතට හැරී ඇති හෙයින් ද,

ජල ගැල්ම පහව යාමෙන් පසුව සියළු දෙයම අමතක කර දැමීමේ ප්‍රවණතාවක් ඇති හෙයින් ද,

මෙය ඉතාමත් අසතුටුදායක තත්ත්වයක් වන හෙයින් ද,

(අ) කොළඹ නගරයේ හා ඒ අවටද, එම දිස්ත්‍රික්කයේ ද යළි යළිත් ජල ගැලීම් ඇතිවීමට හේතු විමසා බැලීමට ද;

(ආ) ඉහත කී පරිදි ජල ගැලීම් ඇති වීම වැළැක්වීමට අවශ්‍ය ක්ෂණික හා කෙටි කාලීන ක්‍රියා මාර්ග පිළිබඳව විමසා බැලීමට ද;

(ඇ) මෙම ගැටළුව යළි යළිත් ඇතිවීම ස්ථිරව ම වැළැක්වීමේ ක්‍රම සහ විධි නිර්දේශ කිරීමට ද;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට ද, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ ඒ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු හෝ සහතික කරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ හා ප්‍රවීනයන්ගේ සහාය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද රැස්වීම් පවත්වාගෙන යෑමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස 6ක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 58/'10

4.

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ජේ. ශ්‍රී රංගා මහතා,— මැතිවරණ නීති සමාලෝචනය කිරීම හා සංශෝධන නිර්දේශ කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පසුගිය වර්ෂ ගණනාවක් මුළුල්ලේ විවිධාකාර ප්‍රයත්නයන් දරා ඇති හෙයින්ද,

5 වැනි පාර්ලිමේන්තුව කාලයේදී හා ඉන් අනතුරුව 2006, 6 වැනි පාර්ලිමේන්තුව කාලයේදී ද ඇතුළුව, අවස්ථා ගණනාවකදී මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳව විමසා බැලීම සඳහා විශේෂ කාරක සභා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

මෙම කාරක සභා විසින් අන්තර්වාර වාර්තා ගණනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇති හෙයින් ද,

මෙම කාරක සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති හෙයින් ද,

(අ) මැතිවරණ සම්බන්ධ නීති, විශේෂයෙන්ම ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ පනත, පළාත් පාලන මැතිවරණ පනත, පළාත් සභා මැතිවරණ පනත, පාර්ලිමේන්තු මැතිවරණ පනත සහ ජනාධිපති මැතිවරණ පනත හා සමඟ ඉහත කී පනත්වලට වසර ගණනාවක් පුරා සිදුකරන ලද විවිධ සංශෝධනද ඉහත දක්වා ඇති පනත්වල විධිවිධාන වලට අදාළ කරන ලද විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත්ද සමාලෝචනය කිරීමටත්;

(ආ) මෙම පනත් ප්‍රතිශෝධනය කිරීමට, සංශෝධනය කිරීමට හා ඒකාබද්ධ කිරීමට ඇති අවශ්‍යතාව තක්සේරු කිරීමටත්;

(ඇ) මැතිවරණවලට අදාළව දැනට පවත්නා නීති වලට අවශ්‍ය ප්‍රතිසංස්කරණ සහ සංශෝධන නිර්දේශ කිරීමටත්;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධාන වල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඈ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යැමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 61/'10

5.

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය,— දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය කිරීමට හා එය ක්‍රියාත්මක කිරීම සඳහා තවදුරටත් සංශෝධන අවශ්‍ය වන්නේද යන්න පිළිබඳව වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 2001 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කර සහතික කරන ලද හෙයින් ද;

රාජ්‍ය පරිපාලන සහ අධිකරණ නියෝජිත ආයතන ගණනාවක ස්වාධීනත්වය සහතික කරනු පිණිස වූ වැදගත් විධිවිධාන ගණනාවක් ඉහත කී සංශෝධනයෙහි විධිවිධාන මගින් හඳුන්වාදුන් හා එම විධිවිධානවලට අන්තර්ගත වූ හෙයින් ද;

ඉහත කී සංශෝධන මගින් සාධාරණ හා නිදහස් සමාජයක් සහතික කිරීම චේතනය කරන ලද හෙයින් ද;

දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි විධිවිධාන උල්ලංඝනය වන බව නිරීක්ෂණය කරනු ලැබ ඇති හෙයින් ද;

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීමට ද;

(ආ) එහි විධිවිධාන අනුගමනය කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර නිර්දේශ කිරීමට ද;

(ඇ) තවදුරටත් සංශෝධන අවශ්‍ය වන්නේද යන්න සලකා බැලීමට ද;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතුය.

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට බලය තිබිය යුතුය.

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව පරීක්ෂා කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කරගැනීමට, කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට බලය තිබිය යුතුය.

(ඈ) කාරක සභාවේ සභාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමටද බලය තිබිය යුතුය.

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යෑමට බලය තිබිය යුතුය.

4. කාරක සභාව, සිය පළමුවැනි රැස්වීම් දිනයෙහි සිට එක් වර්ෂයක් හෝ පාර්ලිමේන්තුව ලබා දෙන්නාවූ එවැනි අන් කවර හෝ නැතහොත් දීර්ඝ වූ හෝ කාල සීමාවක් තුළ සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 66/'10

6.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු මංගල සමරවීර මහතා,— රාජ්‍ය මූල්‍යය පිළිබඳ කාරක සභාව,—

තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සභාපතිවරයකුගෙන් සහ සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත වන්නා වූ ද, එසේ වුවද සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන්නා වූ ද, රාජ්‍ය මූල්‍යය පිළිබඳ කාරක සභාව යැයි හැඳින්විය යුතු කාරක සභාවක් වන්නේය.

2. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාව යටතේ ආදායම් එකතු කිරීම ද;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) ව්‍යවස්ථාව යටතේ ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කිරීම ද;

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149(1) ව්‍යවස්ථාව යටතේ, නීතිය ප්‍රකාරව විශේෂිත පරමාර්ථ සඳහා රාජ්‍ය අරමුදල් උපයෝජනය කිරීම ද;

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(1) සහ 150(2) ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය අරමුදල් භාවිතා කිරීම ද;

(ඉ) විසර්ජන පනතේ ඇතුළත් වන විසර්ජනයන් ප්‍රවර්තන වර්ෂය සඳහා ආපසු ගැනීම්, විසර්ජනයන් මාරු කිරීම් සහ අනපේක්ෂිත ශේෂය මාරු කිරීම ද;

(ඊ) ප්‍රවර්තන වර්ෂය සඳහා විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම ද;

(උ) රාජ්‍ය ණය සහ ණය පොලී ගෙවීම ද;

(ඌ) 2003 අංක 2 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ වාර්තා සහ ප්‍රකාශ ද;

පරීක්ෂා කිරීම එකී කාරක සභාවේ කාර්යය වන්නේය.

3. ඉහත 2 ඡේදයෙහි සඳහන් වන කරුණු වලින් පැන නගින කරුණු සම්බන්ධයෙන් කාරක සභාව වරින් වර පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේ ය.

4. අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සභාගත කරනු ලැබීමෙන් පසු සති 6ක් ඇතුළත කාරක සභාව, රජයේ ප්‍රතිපත්ති සීමාවන් ඇතුළත නිසි පරිදි මුදල් වැය කරනු ලැබේ ද යන්න සඳහන් කරමින් වාර්තාවක් ඉදිරිපත් කළ යුත්තේය.

5. අයවැය ඉදිරිපත් කරනු ලැබීමෙන් ඉක්බිතිව විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියවීමෙන් පසු දින 4ක් ඇතුළත කාරක සභාව, සමස්ත ඇස්තමේන්තුගත වියදම් සහ ලැබීම් නිගමනය කිරීමේදී පදනම් වශයෙන් භාවිත කරනු ලබන රාජ්‍ය මූල්‍ය, මූල්‍ය සහ ආර්ථික උපකල්පනයන් පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

පා. 67/'10

7.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු මංගල සමරවීර මහතා,— අධීක්ෂණ ස්ථාවර කාරක සභා,—

(අ) පහත ලැයිස්තුගත කර ඇති පරිදි, තම බල සීමාව යටතට එන විෂයයන්ට අදාළ සියලු පනත් කෙටුම්පත්, යෝජනා, ගිවිසුම්, වාර්තා හා අනෙකුත් කරුණු පරීක්ෂා කිරීමේ බලතල සහ බල සීමාවන් පහත දක්වා ඇති එක් එක් කාරක සභාවට පැවරෙන "අධීක්ෂණ ස්ථාවර කාරක සභා" යනුවෙන් හැඳින්වෙන කාරක සභා පාර්ලිමේන්තුවේ තිබිය යුතු යැයිද,

(ආ) එකී කාරක සභාවල බල සීමාව යටතට එන සියලු පනත් කෙටුම්පත්, යෝජනා, ගිවිසුම්, වාර්තා සහ අනෙකුත් කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් වාර්තා කිරීම සඳහා අදාළ කාරක සභාවලට යොමු කළ යුතු යැයිද,

මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

1. ජාත්‍යන්තර සබඳතා
   ජාත්‍යන්තර වෙළඳාම ඇතුළුව විදේශ රැකියා, ජාත්‍යන්තර සංවිධාන, ජාත්‍යන්තර සම්මේලන සහ ගිවිසුම්, කලාපීය සංවිධාන

2. ජාතික ආරක්ෂාව
   ශ්‍රී ලංකාවේ ආරක්ෂාව ඇතුළුව සන්නද්ධ හමුදා, රහස් තොරතුරු, මහජන නීතිය හා සාමය, පොලිසිය හා ආරක්ෂාව, විදේශීය රටවල් සමඟ සහයෝගීතාව

3. කෘෂිකර්ම සහ ඉඩම්
   වැවිලි කර්මාන්ත, මහවැලි අධිකාරිය, ඉඩම් සහ වාරිමාර්ග ඇතුළුව

4. මානව සම්පත් හා සංස්කෘතිය
අධ්‍යාපනය, පුහුණුව, තරුණ කටයුතු, ක්‍රීඩා, සංස්කෘතිය හා ආගමික කටයුතු ඇතුළුව

5. මානව ජනාවාස හා බල ශක්තිය
නාගරික හා ග්‍රාමීය යටිතල ව්‍යුහයක්, මහා මාර්ග, මාර්ග, දුම්රිය, නැව් කටයුතු, ගුවන් සේවා, තැපැල් සහ විදුලි සංදේශ

6. මානව සුබ සාධනය
සෞඛ්‍යය, සමාජ සුබ සාධනය, දරිද්‍රතාව දුරලීම, අබාධිතයින්, ජ්‍යෙෂ්ඨ පුරවැසි හා ළමා සුබ සාධනය ඇතුළුව

7. අභ්‍යන්තර පරිපාලනය

8. පරිසර හා ස්වාභාවික සම්පත්
ජල කළමනාකරණය, ජලජ සම්පත්, විශේෂිත ආර්ථික කලාපය හා ධීවර කටයුතු ඇතුළුව

9. නෛතික හා කාන්තා කටයුතු
අධිකරණ, මානව හිමිකම්, මාධ්‍ය, කම්කරු, ජාතික ඒකාබද්ධතා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළුව

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 44(ඇ) සහ 45(1) ව්‍යවස්ථා යටතේ අමාත්‍යාංශ වලට පවරා ඇති විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු හා ආයතන, ව්‍යවස්ථාදායක අධීක්ෂණ කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් යෝග්‍ය ස්ථාවර කාරක සභාවට වෙන් කරනු ලබන්නේය.

2 (අ) (i) (අ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන නීති භාවිතය, පරිපාලනය, ක්‍රියාත්මක කිරීම හා ඵලදායී බව; සහ

(ආ) නව හෝ අතිරේක නීති පැනවීමේ අවශ්‍යතාව හෝ යෝග්‍යතාව දැක්විය හැකි තත්ත්වයන් සහ අවස්ථා;

සම්බන්ධයෙන් සිය විශ්ලේෂණ ඇගයීම් කාර්යයේ දී ද; සහ

(ii) නීති හා අවශ්‍ය සහ යෝග්‍ය විය හැකි පරිදි එවැනි අතිරේක නීති සකස්කිරීමේදී සලකා බැලීමේදී හා නීති පැනවීමේදී හෝ වෙනස් කිරීමේදී ද;

පාර්ලිමේන්තුවට සහාය වීම පිණිස (ආ) ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි එකී විවිධ අධීක්ෂණ ස්ථාවර කාරක සභා වලට පොදු අධීක්ෂණ වගකීම් තිබිය යුත්තේය.

(ආ) කාරක සභාවක බල සීමාවට ඇතුළත් වන විෂයයන්ට අදාළ ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති හා වැඩසටහන් පාර්ලිමේන්තුවේ අභිප්‍රායට අනුකූලව ක්‍රියාත්මක වන්නේද සහ ඉටු වන්නේද යන්න හා ඒවා දිගටම පවත්වා ගත යුතුද, සීමා කළ යුතුද නැතහොත් බැහැර කළ යුතුද යන්න තීරණය කරනු පිණිස සෑම ස්ථාවර කාරක සභාවක්ම අඛණ්ඩ පදනමක් මත—

(i) සිය බලසීමාවට ඇතුළත් වන විෂයයන්ට අදාළ ව්‍යවස්ථා සම්පාදනය ව්‍යාපෘති සහ වැඩසටහන් යෙදවුම, පරිපාලනය, ක්‍රියාත්මක කිරීම හා ඵලදායී බව;

(ii) සිය බලසීමාවට ඇතුළත් වන විෂයයන්ට අදාළ ව්‍යවස්ථා සම්පාදන සහ වැඩසටහන් පාලනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම ඇති දෙපාර්තමේන්තු හා ආයතන වල සංවිධානය හා මෙහෙයුම;

(iii) සිය බලසීමාවට ඇතුළත් වන විෂයයන්ට අදාළව නව හෝ අතිරේක ව්‍යවස්ථා පැනවීමේ අවශ්‍යතාව හෝ යෝග්‍යතාව දැක්විය හැකි කවර හෝ තත්ත්වයන් හෝ අවස්ථා (එයට අදාළව පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක් හඳුන්වා දෙනු ලැබ ඇතිව හෝ නැතිව වුවද); සහ

(iv) සිය බල සීමාවට ඇතුළත් වන විෂයයන් පිළිබඳ අනාගත පර්යේෂණ හා පුරෝකථන;

අධීක්ෂණය කළ යුත්තේය.

(ඈ) සෑම කාරක සභාවක්ම විසින් සිය වගකීම් ඉටු කිරීමේදී අවශ්‍ය යැයි හෝ යෝග්‍ය යැයි හෝ එය සලකන පරීක්ෂණ හෝ අධ්‍යයනයන් කවර හෝ අවස්ථාවක සිදු කිරීමට එක් එක් කාරක සභාවට හැකිය.

(ඇ) පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරයෙහි ආරම්භයෙන් පසු සති හයකට නොවැඩි කාලයකදී එක් එක් ස්ථාවර කාරක සභාව, එම පාර්ලිමේන්තුව සඳහා සිය අධීක්ෂණ සැලැසුම සකස් කළ යුත්තේය. එකී සැලසුම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළ යුත්තේය. සිය සැලැස්ම සකස් කිරීමේදී එක් එක් කාරක සභාව, හැකි තාක් දුරට—

(i) එකී ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති, වැඩ සටහන් හෝ නියෝජිතායතන පිළිබඳ සමාලෝචන සිදුකිරීමේදී කාරක සභා අතර උපරිම සම්බන්ධීකරණය සහ සහයෝගය සහතික කිරීමේ අරමුණින් සමාන හෝ සම්බන්ධ ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති, වැඩ සටහන් පිළිබඳ බල සීමාව සහිත අනෙකුත් කාරක සභා හෝ තම බල සීමාවට අයත් නියෝජිතායතන හෝ විමසා බැලිය යුතු අතර එකී සම්බන්ධීකරණය සහ සහයෝගය සහතික කරනු පිණිස ගනු ලැබ ඇති හෝ ගනු ලබන පියවර පැහැදිලි කිරීමක් සිය සැලසුමෙහි අන්තර්ගත කළ යුත්තේය;

(ii) නොපැහැදිලි, අත්තනෝමතික හෝ අර්ථයක් නැති හෝ පුද්ගලයන් මත උග්‍ර මූල්‍ය බර පටවනු ලබන ආණ්ඩුවේ රීති රෙගුලාසි, ව්‍යවස්ථා සහ අධිකරණ තීරණ පිළිබඳව නිශ්චිත ගැටලු සමාලෝචනය කළ යුත්තේය;

(iii) ස්ථිර අය වැය අධිකාරිය හෝ ව්‍යවස්ථාපිත අධිකාරිය හෝ යටතේ ක්‍රියාත්මක වන එකී ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති, වැඩ සටහන් හෝ නියෝජිතායතන පිළිබඳ සමාලෝචන සිය සැලැස්මේ අන්තර්ගත කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුත්තේය; සහ

(iv) සිය බල සීමාවට අයත් සියලු වැදගත් ව්‍යවස්ථා සම්පාදන ව්‍යාපෘති, වැඩසටහන් හෝ නියෝජිතායතන සෑම වසර 10 කට වරක්ම සමාලෝචනයකට භාජන කරන බවට සහතික කිරීමට කටයුතු කළ යුත්තේය.

(ඉ) පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිය ආරම්භයෙන් පසු සති නවයකට නොවැඩි කාලයකදී, කාරක සභා විසින් ඉදිරිපත් කරනු ලැබූ අධීක්ෂණ සැලසුම් සහ එකී අධීක්ෂණ සැලැසුම් වඩාත්ම ඵලදායී ලෙස සම්බන්ධීකරණය සහතික කිරීම සඳහා සහ නැතහොත් මේ අනු ඡේදයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, එමගින් කිරීමට ඉඩ ඇති යම් නිර්දේශ වේ නම් ඒවාද සමගින්, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට වාර්තා කළ යුත්තේය.

3 (අ) කවර හෝ විෂයයක් යම් ස්ථාවර කාරක සභාවකට යොමු කිරීමට පාර්ලිමේන්තුවට හැකිය.

(ආ) අමාත්‍යවරයා යටතේ ඇති විෂයයක්, කර්තව්‍යයක්, දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් පිළිබඳ අධිකාරී බලය ඇති අදාළ අධීක්ෂණ ස්ථාවර කාරක සභාවට යම් කරුණක් යොමු කිරීමට අමාත්‍යවරයාට හැකිය.

4 (අ) මෙම ඡේදයේ විධිවිධාන අනුව එම 1(අ) ඡේදය යටතේ නම් කර ඇති අධීක්ෂණ ස්ථාවර කාරක සභාවක් යටතේ ලැයිස්තු ගත කරන ලද විෂයයකට අදාළ සෑම පනත් කෙටුම්පතක්, නියෝගයක්, යෝජනාවක් හෝ අනෙකුත් කරුණක් කථානායකවරයා එයට යොමු කළ යුත්තේය.

(ආ) 1(අ) ඡේදයේ විධිවිධානයක ඇති විෂය කරුණක් සම්බන්ධයෙන් අධිකාරී බලය ඇති එක් එක් කාරක සභාවට එකී විධිවිධානය සලකා බලා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට හැකිතාක් දුරට හැකිවන ආකාරයට කථානායකවරයා 4(අ) ඡේදය යටතේ කරුණු යොමු කළ යුත්තේය.

(ඇ) කිසියම් කරුණක් යොමුකිරීම සම්බන්ධයෙන් ඉහත (අ) සහ (ආ) ඡේද ක්‍රියාත්මකකිරීමේදී, කථානායකවරයා:—

(i) ප්‍රාථමික බලසීමාව ඇති කාරක සභාවක් නම් කළ යුත්තේය.

(ii) ප්‍රාථමික බලසීමාව ඇති කාරක සභාවේ මතය විමසීම සඳහා කරුණු යොමුකිරීමට පෙර හෝ පසු, එම කරුණු තවත් අතිරේක කාරක සභා එකකට හෝ වැඩි සංඛ්‍යාවකට හෝ යොමු කළ හැකිය.

(iii) යොමුකිරීමක් යෝග්‍ය කාල සීමාවකට යටත් කළ හැකිය; සහ

(iv) යෝග්‍යයැයි හැගෙන පරිදි එබඳු අනෙකුත් විධිවිධාන සකස් කළ හැකිය.

(ඇ) මතයත්, ප්‍රකාශ කරන කාරක සභාවේ වගකීම් ක්ෂේත්‍ර යටතට ගැනෙන කරුණු පමණක් මතයට විෂය විය යුත්තේය.

(ඉ) ප්‍රාථමික බල සීමා කාරක සභාවේදී සලකා බැලිය යුතු වේ නම්, මතය විමසා සිටින කාරක සභාව ඉල්ලා සිටින කාල සීමාව තුළ එය ලබා දීම සඳහා ප්‍රාථමික බල සීමා අධිකරණය අවසන් කාල සීමාවක් නියම කළ යුත්තේය.

5 (අ) සිය බල සීමාව ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීමේදී, එක් එක් කාරක සභාව එකී කාරක සභාව විසින් සලකා බලන ලද එක් එක් විෂයයට අදාළ වාර්තාවක් කථානායකවරයාට ඉදිරිපත් කළ යුත්තේය. එකී වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කථානායකවරයා කටයුතු කළ යුත්තේය.

(ආ) (i) කිසියම් පනත් කෙටුම්පතක් හෝ නියෝගයක් පිළිබඳව කාරක සභාවක ඕනෑම වාර්තාවක් ක්ෂණික සාධාරණීකරණය අනුව යෝග්‍ය වේ නම් ඒ සමග දැක්වෙන යෝජනාවට යම් කෙටුම්පත් සංශෝධනයක් අවශ්‍ය නම් එයින් සමන්විත විය යුත්තේය.

(ii) කෙටුම්පතක් සඳහා වන එබඳු ඕනෑම සංශෝධනයක්, කාරක සභාවේ සභාපතිවරයා හෝ කාරක සභාව විසින් නම් කරනු ලැබූ එහි වෙනත් සාමාජිකයෙකු විසින් ඉදිරිපත් කරනු ලැබූ සංශෝධනයක් ලෙස, එකී පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේදී ස්ථාවර නියෝග 56 යටතේ කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

(iii) නියෝගයක් සඳහා වන එබඳු ඕනෑම සංශෝධනයක්, කාරක සභාවේ සභාපතිවරයා විසින් හෝ කාරක සභාව විසින් නම් කරනු ලැබූ එහි වෙනත් සාමාජිකයෙකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන සංශෝධනයක් ලෙස, කථානායකවරයා විසින් ඉදිරිපත් කරනු ලැබේ.

(ඇ) පාර්ලිමේන්තුව හමුවේ තබන ලද කිසියම් ව්‍යවස්ථාදායක නොවන වාර්තාවක නිර්දේශ, පාර්ලිමේන්තුව විසින් යෝජනාවක් මගින් අනුමත කරනු ලැබිය හැකිය.

6 (අ) එක් එක් කාරක සභාව සිය රැස්වීම් පිළිබඳ දින දර්ශනයක් සකස් කර එය කථානායකවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේය.

(ආ) සෑම කාරක සභාවක්ම මසකට දින දෙකකට නොඅඩු දින ගණනක රැස් විය යුත්තේය. දින දර්ශනය/කාල සටහන කථානායකවරයා විසින් අනුමත කරනු ලැබීමෙන් පසු එක් එක් ස්ථාවර කාරක සභාවේ රැස්වීම් පවත්වනු ලැබිය යුත්තේය.

(ඇ) යම් ස්ථාවර කාරක සභාවක අතිරේක රැස්වීම් පාර්ලිමේන්තුවේ ඉල්ලීම පරිදි හෝ ස්ථාවර කාරක සභාවේ සාමාජිකයන්ගෙන් අඩක් විසින් කරනු ලැබූ ඉල්ලීම පරිදි හෝ කැඳවනු ලැබිය යුත්තේය.

(ඇ) ස්ථාවර කාරක සභාවක් වෙත යොමු කොට ඇති යම් කරුණක ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් එකක සංඛ්‍යාවක් විසින් ලිඛිතව එකී කාරක සභාවෙන් ඉල්ලා සිටිය හැකිය. එවන් ඉල්ලීමක් ලැබී සති දෙකක කාලයක් ඇතුළත එකී කාරක සභාව පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර එකී වාර්තාව පාර්ලිමේන්තුවේ සභාභිමුඛ කරනු ලබන්නේය.

7 සෑම ස්ථාවර කාරක සභාවක්ම පාර්ලිමේන්තු කාලසීමාව තුළ ක්‍රියාත්මක වේ.

8 (අ) පහත දැක්වෙන අය හැර අනෙකුත් සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ස්ථාවර කාරක සභාවන්හි සාමාජිකයින් ලෙස කටයුතු කිරීමට සුදුසුකම් ලබති:

(i) කථානායකවරයා
(ii) නියෝජ්‍ය කථානායකවරයා
(iii) නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා
(iv) අග්‍රාමාත්‍යවරයා
(v) සභානායකවරයා
(vi) විපක්ෂනායකවරයා
(vii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පත් කරනු ලැබ ඇති කැබිනට් අමාත්‍යවරයන්
(viii) සිය අමාත්‍යාංශවල විෂයයන් හා කාර්යයන් කැබිනට් අමාත්‍යවරයකුගේ විෂය පථය යටතට නොගැනෙන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(1) ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන අමාත්‍යවරයන් හෝ 45(4) ව්‍යවස්ථාව යටතේ විෂයයන් හා කාර්යයන් පවරනු ලැබ නොමැති අමාත්‍යවරයන්

(ආ) සුදුසුකම් ඇති සෑම මන්ත්‍රීවරයෙකුම එක් ස්ථාවර කාරක සභාවක සාමාජිකයකු ලෙස කටයුතු කළ යුත්තේය. එම 8(අ)(viii) ඡේදය යටතට නොගැනෙන නියෝජ්‍ය අමාත්‍යවරයන් සහ අමාත්‍යවරයන්, එකී නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ අමාත්‍යවරයා කටයුතු කරන්නේ තම කැබිනට් අමාත්‍යවරයාගේ විෂය පථය යටතට ගැනෙන යම් විෂයයක්, කර්තව්‍යයක්, දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් සම්බන්ධයෙන් ද, එකී විෂය පථයන් සහ ඒ හා සම්බන්ධ කාර්යයන්ට පැවරී ඇති යම් ස්ථාවර කාරක සභාවක කටයුතු නොකළ යුත්තේය.

(ඇ) (i) සුදුසුකම් ඇති මන්ත්‍රීවරයන්ගේ ලේඛනයක් කථානායකවරයා විසින් සකස් කළ යුත්තේය.

(ii) සුදුසුකම් ඇති මන්ත්‍රීවරයන්ගේ ලේඛනයේ සංඛ්‍යාත්මක අගය අනුව එක් එක් කාරක සභාවට අයත් ස්ථානය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වෙත ලබා දෙනු ලැබිය යුත්තේය.

(ඈ) පාර්ලිමේන්තුවේ දේශපාලන පක්ෂවල හෝ ස්වාධීන කණ්ඩායම් වල නායකයින් විසින් එක් එක් ස්ථාවර කාරක සභාවේ සාමාජික නාම යෝජනා කථානායකවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේය. තේරීම් කාරක සභාවේ අදහස් විමසා බලා කථානායකවරයා විසින් එකී නම් පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබිය යුත්තේය.

(ඉ) 8(ඈ) ඡේදය යටතේ නම් කරන ලද ඕනෑම සාමාජිකයකු එකී ස්ථාවර කාරක සභාවෙන් ඉවත් කරන ලෙසට කථානායකවරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක හෝ නායකයකුට හැකිය. එවැනි ඉල්ලීමක් ලැබීමෙන් පසු එය පාර්ලිමේන්තුවට දැනුම්දීමෙන් අනතුරුව කථානායකවරයා අදාළ මන්ත්‍රීවරයා එකී කාරක සභාවෙන් ඉවත් කළ යුත්තේය.

(ඊ) (i) සෑම ස්ථාවර කාරක සභාවක්ම සිය පළමු රැස්වීමේදී සහ සභාපති ධූරය පුරප්පාඩු වූ පසු එළඹෙන පළමු රැස්වීමේදී ස්ථාවර කාරක සභාවේ සභාපතිවරයකු පත් කර ගත යුත්තේය.

(ii) අමාත්‍යවරයෙකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු ස්ථාවර කාරක සභාවක සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට සුදුසුකම් නොලබන්නේය.

(උ) කාරක සභාවේ රැස්වීම් වලට නොකඩවා තුන් වාරයක් සහභාගී නොවන මන්ත්‍රීවරයෙකු එකී කාරක සභාවේ සාමාජිකත්වය හැර ගියා සේ සලකනු ලබන්නේය.

9 අවශ්‍යයැයි හැඟෙන කරුණු පරීක්ෂා කර බලා කාරක සභාවට වාර්තා කිරීම සඳහා, අවශ්‍යයැයි එය සලකන අවස්ථාවලදී සිය සාමාජිකයන්ගෙන් සමන්විත වන අනු කාරක සභා පත් කිරීමට එක් එක් අධීක්ෂණ කාරක සභාවට හැකිය.

10 අධීක්ෂණ කාරක සභාවක් වෙත යොමු කරන ලද කරුණු අදාළ යොමු කිරීමෙන් මාස 3 ක් ඉකුත් වීමට පෙර පාර්ලිමේන්තුව විසින් සැලකිල්ලට භාජනය නොකළ යුත්තේය. එසේ වුවද, යම් නිශ්චිත කරුණක් පිළිබඳව වාර්තා කිරීමට පාර්ලිමේන්තුව විසින් යෝජනාවක් මගින් අදාළ කාල සීමාව දීර්ඝ කරනු ලැබ ඇති අවස්ථාවකදී එකී කාල සීමාව ඉකුත් වීමෙන් පසු පමණක් එකී කරුණ සලකා බලනු ලැබිය යුත්තේය.

11 පනත් කෙටුම්පතක් හෝ පොදු වැදගත්කමක් ඇති වෙනත් කරුණක් හෝ සම්බන්ධයෙන් කටයුතු කරන ස්ථාවර කාරක සභාවකට, එකී පනත් කෙටුම්පත හේතුවෙන් අගතියට පත්වන පාර්ශවයන්, ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් හෝ ඒ පිළිබඳ අත්දැකීම් ඇති පුද්ගලයින් සාක්ෂි සඳහා කැඳවීමට හැකිය.

12. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාවේ සඳහන් පනත් කෙටුම්පතක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරනු ලබන සංශෝධනයක් හැර වෙනත් නීතියක් පැනවීම අධීක්ෂණ ස්ථාවර කාරක සභා වාර්තාවක් විසින් නිර්දේශ කරනු ලබන අවස්ථාවකදී එකී පරමාර්ථ සඳහා වාර්තාවේ විශේෂිතව සඳහන් කරනු ලබන කාරක සභාවේ සභාපතිවරයා හෝ වෙනත් සාමාජිකයකු හෝ විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර, දැනුම් දීමෙන් අනතුරුව, පාර්ලිමේන්තුවේ නියමයකින් තොරව පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී පළමුවැනි වර කියවීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. පනත් කෙටුම්පතේ පිටපත් යෝජනාව සමග ඉදිරිපත් කළ යුතුය. යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් සති හයක් ඇතුළත ඡන්දයක් සඳහා කථානායකවරයා විසින් එම යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේය. එසේ වුවද එකී සති හයක කාල සීමාව විසර්ජන පනත් කෙටුම්පතේ දෙවැනි වර කියවීමේ හෝ කාරක සභා අවස්ථාවේ හෝ තුන්වැනි වර කියවීමේ කාල සීමාව තුළ යෙදෙන්නේ නම්, එකී යෝජනාව පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුත්තේ විසර්ජන පනත් කෙටුම්පත සලකා බැලීම අවසන් වූ පසුවය. එකී යෝජනාව පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබීමෙන් ඉක්බිතිව පනත් කෙටුම් පත පළමුවැනි වර කියවා මුද්‍රණය කිරීම සඳහා නියෝග කරනු ලැබිය යුත්තේය.

එසේ වුවද, එකී පනත් කෙටුම්පත අධීක්ෂණ ස්ථාවර කාරක සභාවේ සාමාජිකයින්ගෙන් 2/3ක සාමාජික සංඛ්‍යාවක් විසින් අනුමත කරනු ලැබිය යුතු අතර එකී සාමාජිකයින්ගේ නම් සමග එය වාර්තා කරනු ලැබිය යුත්තේය.

(ආ) පනත් කෙටුම් පත පළමුවැනි වර කියවා මුද්‍රණය කිරීමට නියෝගය ලබා දීමෙන් අනතුරුව, කථානායකවරයා විසින් එකී පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරනු ලැබිය යුතු අතර, අමාත්‍ය මණ්ඩලය විසින් ඒ පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ලබා දෙන තුරු ඒ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා නොකළ යුත්තේය.

(ඇ) අමාත්‍ය මණ්ඩලය විසින් පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ලබා දෙනු ලැබීමෙන් පසු හෝ පනත් කෙටුම් පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ දින සිට මාස දෙකක කාලයක් ඉකුත් වීමෙන් පසු පනත් කෙටුම් පත දෙවැනි වර කියවීම සඳහා නියම කළ යුත්තේය.

13 (අ) පුද්ගලයින්, ලිපි ලේඛන හා වාර්තා කැඳවීමට සෑම ස්ථාවර කාරක සභාවකටම බලතල තිබෙන අතර, ඔවුන් ඉදිරියේ ගනු ලැබූ සාක්ෂි වල කාර්යය සටහන් සමඟ,

ඔවුන්ගේ අදහස් හා නිරීක්ෂණයන්ද සහිතව එක් එක් කාරක සභාව පාර්ලිමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කළ යුත්තේය.

(ආ) ස්ථාවර කාරක සභාවක සාමාජිකයකුගේ විරෝධතාවයක් හෝ වෙනස් මතයක් එකී කාරක සභාවේ වාර්තාවට ඇමිණිය හැකිය.

14 (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 වැනි ව්‍යවස්ථාවේ දැක්වෙන ව්‍යවස්ථා පැනවීම ස්ථාවර කාරක සභාවක් විසින් නිර්දේශ කරනු ලබන ඕනෑම අවස්ථාවකදී එකී වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් මාස තුනක කාලයක් ඇතුළත අමාත්‍ය මණ්ඩලය ඒ සම්බන්ධයෙන් සිය මතය ඉදිරිපත් කළ යුත්තේය.

(ආ) ස්ථාවර කාරක සභාවක වාර්තාවක් ව්‍යවස්ථා පැනවීම සම්බන්ධ වාර්තාවක් නොවන අවස්ථාවකදී, එකී වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් මාස දෙකක් ඇතුළත අමාත්‍ය මණ්ඩලය සිය මතය ඉදිරිපත් කළ යුත්තේය. එවැනි වාර්තාවක් පාර්ලිමේන්තුව විසින් සලකා බලනු නොලබන්නේය.

15 යම් නීතියක් යටතේ යම් ආයතනයක්, සංගමයක්, නිලධාරියෙකු හෝ පුද්ගලයෙකු විසින් පෞද්ගලිකත්වය හෝ රහස්‍යභාවය ආරක්ෂා කළ යුතු අවස්ථාවකදී, අදාළ ස්ථාවර කාරක සභාව එකී නීතිය ප්‍රකාරව කටයුතු කළ යුත්තේය.

16 (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වැනි ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන මහජන ආරක්ෂාව සම්බන්ධ ඕනෑම නියෝගයක් සම්බන්ධයෙන් වාර්තා කිරීම සඳහා නෛතික හා කාන්තා කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාව වෙත යොමුකොට වාර්තාවක් ලබා ගත යුත්තේය. යම් නියෝගයක ලුහුඬු නාමය වෙනත් කාරක සභාවක බල සීමාව යටතේ එන නිශ්චිත විෂයයක් හා සම්බන්ධ වේ නම්, එම 4(ඇ)(ii) ඡේදය යටතේ කථානායකවරයා එකී නියෝග අදාළ කාරක සභාවට යොමු කළ යුත්තේය.

(ආ) (අ) ඡේදය යටතේ කරනු ලබන සඳහනට 7 ඡේදය අදාළ නොවන්නේය.

17 කථානායකවරයාගේ අනුමතිය ලබා ගැනීමෙන් පසුව, වෙනත් කාරක සභා එකක් හෝ වැඩි ගණනක් සමග සාකච්ඡා පැවැත්වීමට ඕනෑම අධීක්ෂණ ස්ථාවර කාරක සභාවකට හැකිය.

18 කවර හෝ විසර්ජනයන් හෝ වැය නොකරන ලද ශේෂයක් පැවරීම පිළිබඳව, මුදල් අමාත්‍යාංශයේ ලේකම්, අයවැය අධ්‍යක්ෂ සහ අදාළ අමාත්‍යාංශයේ ලේකම් රාජ්‍ය මූල්‍ය කාරක සභාවට වහාම දැනුම් දිය යුත්තේය.

19 බල සීමාව යන්නෙන් ව්‍යවස්ථාදායක අධීක්ෂණ බල සීමාව අදහස් වන අතර අනු ව්‍යවස්ථාවන් සම්බන්ධයෙන් වන බල සීමාවද ඊට ඇතුළත් වේ.

ඕනෑම විසර්ජනයක් හෝ වැය නොකරන ලද ශේෂයක් හෝ මාරු කිරීමේදී අදාළ අමාත්‍යාංශයේ ලේකම් ඒ බැව් වහාම අදාළ අධීක්ෂණ කාරක සභාව වෙත දැනුම් දිය යුත්තේය.

20. 8(අ) හා (ඊ)(ii) ඡේද රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට අදාළ වන්නේය.

පා.106/' 10

8.

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි

ගරු සී. ඒ. සූරියආරච්චි මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු හුනෛයිස් ෆාරූක් මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු වයි. ජී. පද්මසිරි මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ආර්. දුමින්ද සිල්වා මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

ගරු ඒ. එම්. චාමික බුද්ධදාස මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා

ගරු ජානක බණ්ඩාර මහතා

ගරු සරත් කුමාර ගුණරත්න මහතා

ගරු වී. කේ. ඉන්දික මහතා

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා

ගරු පෙරුමාල් රාජදුරයි මහතා

ගරු ලලිත් දිසානායක මහතා

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා

ගරු හේමාල් ගුණසේකර මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු විජය දහනායක මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු ගුණරත්න වීරකෝන් මහතා
ගරු මහින්ද සමරසිංහ මහතා
ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
ගරු සාලින්ද දිසානායක මහතා
ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
ගරු නිමල් විජේසිංහ මහතා
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා
ගරු ජේ. ආර්. පී. සූරියප්පෙරුම මහතා
ගරු තිස්ස කරල්លියද්ද මහතා
ගරු කමලා රණතුංග මෙනෙවිය
ගරු ෆීලික්ස් පෙරේරා මහතා
ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා
ගරු නියෝමාල් පෙරේරා මහතා
ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා
ගරු ජයරත්න හේරත් මහතා
ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මහත්මිය
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු මාලනී ෆොන්සේකා මහත්මිය
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
ගරු සජිත් රෝහන කොඩිතුවක්කු මහතා
ගරු වික්ටර් ඇන්ටනි මහතා
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා
ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා
ගරු දුමින්ද දිසානායක මහතා
ගරු තිලංග සුමතිපාල මහතා
ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු දයාශ්‍රිත තිසේරා මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු සනත් ජයසූරිය මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් ක්‍රියා කිරීම පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව, —

මෙම ගරු සභාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා 2010 නොවැම්බර් මස 29 වැනි දින හා ඊට පෙර දිනයන්හිදී එල්.ටී.ටී.ඊ. ක්‍රියාකාරීන් විසින් ලන්ඩන් නගරයේදී ශ්‍රී ලංකා රජයට හා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට එරෙහිව පවත්වන ලද රැස්වීම්, විරෝධතා ව්‍යාපාර, සාකච්ඡා සඳහා සෘජුව සහ / හෝ වක්‍රව සහභාගී වී ඇති බවට එකී සාකච්ඡා, විරෝධතා සඳහා සෘජුව හෝ වක්‍රව සහ/ හෝ අනුබල දී ඇති සහ අනුග්‍රහ දක්වා ඇති බවට වාර්තා ලැබී ඇති හෙයින්ද,

එකී විරෝධතාවයන් සංවිධානය කිරීමට අදාළ මූලික සාකච්ඡාවන් හා උනන්දු කිරීමේ රැස්වීම් හා ඊට අදාළ දැනුවත් කිරීම් සඳහාද පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා සෘජුව සහභාගී වී ඇති බව වාර්තාවී ඇති හෙයින්ද,

මීට පෙරද පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ එහි හිතවතුන් සමඟ විවිධ ආකාරයේ සම්බන්ධතාවයන් පවත්වාගෙන ගිය බවට කරුණු හෙළිදරව් වී ඇති බැවින්ද,

ලන්ඩනය හා යුරෝපයේ වෙනත් ප්‍රධාන නගරවල එල්.ටී.ටී.ඊ. ක්‍රියාකාරීන් සහ/ හෝ එල්.ටී.ටී.ඊ. ආධාරකරුවන් සමග ඉතා කිට්ටු සම්බන්ධතාවයක් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා පවත්වා ඇති බව හා පවත්වාගෙන යන බවට කරුණු හෙළිදරව් වී ඇති බැවින්ද,

ඉහත කී ක්‍රියාවන් එකකින් හෝ වැඩි ගණනක් තුළින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157අ ව්‍යවස්ථාව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හය වැනි සංශෝධනය හා දිවුරුම පැහැදිලිවම උල්ලංඝනය කර ඇති බව පෙනී යන හෙයින්ද,

ඉහත කී කරුණු සම්බන්ධයෙන් හා ඉහත කී කරුණුවලට අදාළව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතාගේ ක්‍රියා කලාපය පිළිබඳව පරීක්ෂා කර බලා මෙම ගරු සභාවට වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. තවද,—

(අ) එකී කාරක සභාවට සාමාජිකයන් නම් කිරීම හා සභාපතිවරයා පත් කිරීම කථානායකවරයා විසින් කළ යුතු බවත්,

(ආ) එකී කාරක සභාවට ස්වකීය ගණපූරණය නියම කිරීමටත්,

(ඇ) අවශ්‍ය පුද්ගලයින් කැඳවීමට හා අවශ්‍ය ලිපි ලේඛනාදිය ගෙන්වා ගැනීමට සහ

(ඈ) දිවුරුම් පිට සාක්ෂිකරුවන් විභාග කිරීමටත්

කාරක සභාවට බලය තිබිය යුතුය.

3. වරින් වර වාර්තා කිරීමටත්, පාර්ලිමේන්තු සැසිවාරය කල් තබනු ලැබුවත්, රැස්වීම් පවත්වාගෙන යාමටත්, එකී කාරක සභාවට බලය තිබිය යුතුය.

පා.107/'10

9.

ගරු කරු ජයසූරිය මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— එංගලන්තයේ "හීත්‍රෝ" ගුවන් තොටුපළේ පැවති උද්ඝෝෂණ ව්‍යාපාරවලට මෙම ගරු සභාවේ කිසියම් මන්ත්‍රීවරයෙකු සම්බන්ධ වී සිටියේද යන්න සොයා බලා වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2010 දෙසැම්බර් මස 02 වැනි දින ජලම්පාදන හා ජලාපවහන අමාත්‍ය හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුව හමුවේ;

"මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව දිවුරුම් දුන් මන්ත්‍රී කෙනෙක් තහනම් කළ සංවිධානයක් එක්ක නීති විරෝධී කණ්ඩායම් සමග අතිගරු ජනාධිපතිතුමා පැමිණෙන වේලාවට එංගලන්තයේ ගුවන් තොටුපළට ගිහිල්ලා අපේ රටටත්, ඒවාගේම තමන්ගේ දිවුරුම් දීමටත් විරුද්ධව වැඩ කළා නම්, ඒ මන්ත්‍රීතුමාව මේ සභාව විසින් වහාම පරීක්ෂණයකට ලක් කළ යුතුයි"

යනුවෙන් ප්‍රකාශයක් කර ඇති බැවින් ද;

ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා විසින් මතු කරන ලද කරුණු මෙම සභාවේ බරපතළ පරීක්ෂණයකට භාජනය කළ යුතු බැවින් ද;

ඉහත නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි,

(අ) ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා විසින් එල්ල කරන ලද චෝදනාවේ පසුබිමට හේතු වූ කරුණු; සහ

(ආ) එංගලන්තයේ "හීත්‍රෝ" ගුවන් තොටුපළේ පැවති උද්ඝෝෂණ ව්‍යාපාරවලට මෙම ගරු සභාවේ කිසියම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සම්බන්ධ වී සිටියේ ද යන්න සොයා බලා වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතුයැයි යෝජනා කර සිටිමු.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(ඇ) එහි වාර්තාව එහි පළමු රැස්වීමේ සිට මාස තුනක (03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කෙරෙන එවැනි කාල පරිච්ඡේදයක් තුළ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතු ය.

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමටද, යම් ලේඛණයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට

ද ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමටද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද, රැස්වීම් පවත්වාගෙන යෑමටද බලය තිබිය යුතුය.

පා.121/’11

10.

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු රුවන් විජයවර්ධන මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු ඒ. ඩී. චම්පික ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,—

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා 2011 ජනවාරි මස 04 වැනි දින,

“අද වෙලා තිබෙන්නේ මේකයි. 2011 අප්‍රේල් 01 වැනිදා අපි පළාත් පාලන ආයතනවල අලුත් සභාවාරය කැඳවන්න ඕනැ. ඒකට ඇත්තටම මාර්තු මාසයේ ඡන්දය තියන්න වෙනවා.”

යැයි පැවසූ විට පළාත් පාලන ආයතනවල නව කාල සීමා 2011 අප්‍රේල් මස 01 වැනි දින ආරම්භ වීමට නියමිත හෙයින් පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් 2011 මාර්තු මස පැවැත්වෙනු ඇති බව එතුමා සභාවට සහතික වූ හෙයින් ද;

කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සහ දෙහිවල - ගල්කිස්ස මහනගර සභාවල හා කොළොන්නාව නගර සභාවේ ඡන්ද විමසීම් දැන් කල්දමනු ලැබ ඇති හෙයින් හා තවත් මහනගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවල ඡන්දද කල් දමනු ලැබීමට නියමිත බව වාර්තා වී ඇති හෙයින් ද; හා

අමාත්‍යවරයා උවමනාවෙන්ම අසත්‍ය ප්‍රකාශයක් කරමින් සභාව නොමග හැරිය හෙයින් ද;

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයා ලෙස සිය කාර්යයන් ඉටුකිරීම තවදුරටත් කරගෙන යාමට අමාත්‍යවරයා සතු හැකියාව කෙරෙහි සභාවේ විශ්වාසය ගිලිහී ඇති බවට හා අමාත්‍ය මණ්ඩලයේ ධුරයක් හෙබවීම සඳහා ඔහු තවදුරටත් සුදුසු හා යෝග්‍ය තැනැත්තෙකු නොවන බවට මෙම සභාව යෝජනා කරයි.

පා. 125/'11

11.

ගරු රවි කරුණානායක මහතා

ගරු පාලිත රන්ගෙ බණ්ඩාර මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— කුමරන් පද්මනාදන් අත්අඩංගුවේ තබාගෙන ඇත්තේ සහ ඔහුට එරෙහිව චෝදනා ගොනුකිරීමට අදහස් කරන්නේ කුමන නෛතික ප්‍රතිපාදන යටතේද යන්න සහ අනෙක් කරුණු සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2009 අගෝස්තු 7 වැනි දින ශ්‍රී ලංකා රජයේ නිවේදනය ප්‍රකාරව, ෂන්මුගම් කුමාරන් ධර්මලිංගම් හෙවත් සෙල්වරාසා පත්මනාදන් හෙවත් කුමාරන් පත්මනාදන් හෙවත් "කේ.පී." නමින් වඩාත් ප්‍රකට පුද්ගලයා, දැනට වසරකට වැඩි කාලයක් රජයේ අත් අඩංගුවේ පසුවන හෙයින් ද,

ආයුධ ජාවාරම සහ සාපරාධී කුමන්ත්‍රණය කිරීම ඇතුළුව විවිධ චෝදනා සඳහා "කේ.පී." ජාත්‍යන්තර පොලිසියේ වඩාත් අවශ්‍ය පුද්ගල ලැයිස්තුවේ සිටින අයෙකු හෙයින් ද,

හිටපු ඉන්දීය අග්‍රාමාත්‍ය රාජීව් ගාන්ධි මහතා 1991 දී ඝාතනය කිරීම සම්බන්ධයෙන් සහ ත්‍රස්තවාදී පනත සහ ඉන්දීය පුපුරණ ද්‍රව්‍ය පනත උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ ඉන්දීය ආයතනයන්ට ද ඔහු අවශ්‍ය පුද්ගලයෙකුහෙයින් ද,

ශ්‍රී මහා බෝධියට සහ දළදා මාළිගාවට එල්ලවූ ප්‍රහාර ඇතුළුව ශ්‍රී ලංකාවේ සිදුවූ ත්‍රස්ත ප්‍රහාර කිහිපයකට ඍජුව හා වක්‍රව යන දෙයාකාරයෙන්ම ඔහු සම්බන්ධ වී ඇතැයි පැවසෙන හෙයින් ද,

ඔහු දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (එල්.ටී.ටී.ඊ) වෙනුවෙන් ආයුධ මිල දී ගත් තැනැත්තා වූ හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ආයුධ ප්‍රතිසම්පාදන, සැපයුම් දාම සහ මුදල් විශුද්ධිකරණ මෙහෙයුම්වල නිරත වූ ඔහු එහි ගෝලීය කාර්යාල ජාලයක් පවත්වාගෙන ගිය හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයට අවි ආයුධ නැව් මගින් ප්‍රවාහනය කිරීමේ නියැලුණු නැව් සමාගමක් ඔහු විසින් මෙහෙයවූ බව හෙළිවී ඇති හෙයින් ද,

ශ්‍රී ලංකාවේ බැංකු මංකොල්ල කිහිපයක් ඔහු විසින් මෙහෙයවූයේ යැයි ද පැවසෙන හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයට අවි තොග සම්පාදනය කිරීමේ ඔහු නියැළී ඇති හෙයින් ද,

එල්.ටී.ටී.ඊ. සංවිධානයට අයත් නැව් 19ක් සහ රන් රිදී තොග ඇතුළු අති විශාල වත්කම් සම්භාරයක් ඔහු පාලනය කරන්නේ යැයි පැවසෙන හෙයින් ද, 2009 ජූලි 21 වැනි දින එල්.ටී.ටී.ඊ. සංවිධානය නිකුත් කළ නිවේදනයකින් ඔහු එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නායකයා බව ප්‍රකාශ කළ හෙයින් ද,

අහිංසක ජනයා ඝාතනය කරමින් එල්.ටී.ටී.ඊ. සංවිධානය දරුණු මිලේච්ඡ ක්‍රියා සිදු කළ බව එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයක සඳහන් වන හෙයින් ද, එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාකාරකම්

සඳහා මූල්‍යාධාර ලබාදීම සඳහා ජාත්‍යන්තරව මුදල් එකතු කළ පුද්ගලයා "කේ.පී." බව රජය පවසන හෙයින් ද,

පහත දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අ) "කේ.පී." අත් අඩංගුවේ රඳවා තබාගෙන ඇත්තේ කුමන නෛතික ප්‍රතිපාදන යටතේද;

(ආ) "කේ.පී." ට එරෙහිව චෝදනා ගොනු කිරීමට අදහස් කරන්නේද, එසේ නම්, —

(i) ඔහුට නඩු පවරනුයේ කුමන නීතිය යටතේද;

(ii) චෝදනා පත්‍රයේ අන්තර්ගත කරන වැරදි කවරේද;

(iii) ඔහුට එරෙහිව චෝදනා ගොනුකිරීමට අදහස් කරනුයේ කවදාද; සහ

(iv) එම චෝදනා ගොනු කරනුයේ කවර අධිකරණයේද;

(ඇ) ඔහු වෙනත් රටකට බාරදිය යුතු බවට ඉල්ලීම් ඉදිරිපත් වී තිබේද, එසේ නම්, එබඳු ඉල්ලීම් කර ඇත්තේ කවර රටවල්ද සහ ඔහු වෙනත් රටකට බාරදීම සඳහා යෝජනා වී තිබේද;

(ඈ) රන් රිදී තොග සහ නැව් කෙරෙහි විශේෂ අවධානය සහිතව, "කේ.පී." සන්තකයේ තිබූ එල්.ටී.ටී.ඊ. වත්කම්වල ඉරණම සහ පිහිටීම;

(ඉ) රටේ නීතිය යටතේ ඔහුට එරෙහිව කටයුතු නොකර "කේ.පී." රඳවාගෙන සිටීමෙන්, කිසියම් නිලධාරියෙකු හෝ නිලධාරීහු ද්‍රෝහී හැසිරීම සහ රාජකාරිය පැහැර හැරීම සම්බන්ධයෙන් වරදකරුවන් වන්නේද යන ප්‍රශ්නය පිළිබඳව ද විශේෂ කාරක සභාව සිය අවධානය යොමු කළ යුතුය.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යෑමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා.135/'11

12.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු අනෝමා ගමගේ මහත්මිය

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු රුවන් විජයවර්ධන මහතා

ගරු රෝසි සේනානායක මහත්මිය

ගරු දයාසිරි ජයසේකර මහතා,— හෙජින් ගිවිසුම් මත ලංකා ඛනිජතෙල් සංස්ථාවට සිදුවූ අවාසිය හා අලාභය සහ එම ගිවිසුම් සඳහා වගකිව යුතු පුද්ගලයින්ට විරුද්ධව ගත යුතු පියවර පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ කළමනාකාරීත්වයේ පූර්ණ අකාර්යක්ෂමතාවයේ ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවට එරෙහිව ලබා දී ඇති අධිකරණ තීරණයක් ප්‍රකාරව ඇමරිකානු ඩොලර් මිලියන 160 ක මුදලක් ගෙවීමට ඇති හෙයින් ද,

සංස්ථාවට එරෙහිව තීන්දු වුවහොත් පිළිවෙළින් ඇමරිකානු ඩොලර් මිලියන 60ක් හා ඇමරිකානු ඩොලර් මිලියන 200ක් සංස්ථාව විසින් ගෙවිය යුතු නඩු දෙකක් මේ වන විට විභාග වෙමින් පවතින හෙයින් ද,

නිසි සැලසුමකින් හා සොයාබැලීමකින් තොරව මෙම හෙජින් ගිවිසුම්වලට එළඹෙන ලද්දේ හුදු අකාර්යක්ෂමතාවය හේතුවෙන්ද, නැතහොත් වංකභාවය හේතුවෙන්ද යන්න පැහැදිලි නැති හෙයින්ද,

(අ) ලංකා ඛනිජ තෙල් සංස්ථාවට මුළුමනින්ම අවාසිදායක වන එවන් හෙජින් ගිවිසුම්වලට එළැඹෙන ලද්දේ කෙසේද;

(ආ) එම ගිවිසුම් පිළිබඳව වගකිව යුතු සංස්ථා නිලධාරින් කවුරුන්ද;

(ඇ) හෙජින් ගිවිසුම් හේතුවෙන් සංස්ථාවට සිදුවූ මුළු පාඩුව කොපමණද;

(ඈ) ඉදිරියේදී එවන් සිදුවීම් ඇතිවීම වැළැක්වීම සඳහා ගත යුතු පියවර කවරේද;

(ඉ) හෙජින් ගිවිසුම් පිළිබඳව වගකිව යුතු පුද්ගලයින්ට එරෙහිව ගත යුතු පියවර කවරේද; හා

(ඊ) ප්‍රස්තුත කරුණට යම් සම්බන්ධතාවයක් හෝ අදාළත්වයක් ඇතැයි කාරක සභාව තීරණය කරනු ලබන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව ද,

පරීක්ෂා කර බලා වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(2) (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය,

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුන ද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

(3) එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට,

පාර්ලිමේන්තුව හෝ එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඈ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඇ) කාරක සභාවේ සභාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතුය.

(4) සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින්වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා.136/'11

13.

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු වසන්ත අලුවිහාරේ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා,— ලංකා ඛනිජතෙල් සංස්ථාව විසින් බාල තත්ත්වයේ පෙට්‍රල් ආනයනය කරන ලද්දේ කවර ආකාරයෙන්ද යන්න, සංස්ථාවට සිදුවූ සම්පූර්ණ අලාභය සහ ගැටලුවට හේතුවූ ආනයනයන් සඳහා වගකිව යුතු පුද්ගලයන්ට විරුද්ධව ගත යුතු පියවර පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

මෑත අතීතයේදි ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පරිපාලනය සම්පූර්ණයෙන්ම දුර්වලව පැවති බව පෙනී ගොස් ඇති හෙයින්ද,

සංස්ථාව තත්ත්වයෙන් බාල ඛනිජ තෙල් ආනයනය කර ඇති බව දැන් හෙළිදරව් වී ඇති හෙයින් ද,

මෙම තත්ත්වයෙන් බාල ඛනිජ තෙල් නිසා වාහන දහස් ගණනකට හානි සිදුවී ඇති අතර, ඇතැම් වාහනවලට අලුත්වැඩියා කිරීමට නොහැකි තරමටම හානි සිදුවී ඇති හෙයින් ද,

ඉන්ධන පිරවුම්හල් ගණනාවක සවිකර ඇති පෙට්‍රල් පොම්ප ගණනාවකටද හානි සිදුවී ඇති හෙයින් ද,

සංස්ථාවේ මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් මිනිය නොහැකි තරමේ මූල්‍යමය පාඩු සිදුවී ඇති හෙයින් ද,

බලධාරීන් දැනටමත් වරද පැටවීමට තැනැත්තෙකු සොයාගෙන ඇති හෙයින් ද,

තත්ත්වයෙන් බාල ඛනිජ තෙල් සත්‍ය වශයෙන්ම ආනයනය කළ බව අමාත්‍යවරයා පිළිගෙන ඇති හෙයින් ද,

මෙම නින්දා සහගත ප්‍රතිඵලය සම්බන්ධයෙන් රජය පරස්පර විරෝධී ප්‍රකාශ ගණනාවක් කර ඇති හෙයින් ද,

(අ) මෙම ඛනිජ තෙල් තොගය ඇණවුම් කිරීමේදී ටෙන්ඩර් පටිපාටි අනුගමනය නොකිරීමට හේතු කවරේද;

(ආ) සංස්ථාව විසින් තත්ත්වයෙන් බාල ඛනිජ තෙල් සත්‍ය වශයෙන්ම ආනයනය කරනු ලැබුවේද;

(ඇ) එම ආනයනයන් කරන ලද්දේ කවර රටකින්ද;

(ඈ) එම ආනයනයන්හි සම්පූර්ණ පිරිවැය කොපමණද;

(ඉ) එබඳු ආනයනයන් හේතුවෙන් සංස්ථාවට සිදුවූ මුළු අලාභය කොපමණද;

(ඊ) එබඳු ආනයනයන් වැළැක්වීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමට හේතු කවරේද;

(උ) පැමිණි තොග තත්ත්වයෙන් බාල බව හෙළිදරව් වූයේ නම්, ඒවා ප්‍රතික්ෂේප කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීමට හේතු කවරේද;

(ඌ) ආනයනය කරන ලද තොග තත්ත්වයෙන් බාල බව දැන සිටියදීත්, ඒවා රටේ පිරවුම්හල් ගණනාවකට බෙදාහරිනු ලැබීමට හේතු කවරේද;

(එ) ආනයනය කරන ලද තොග තත්ත්වයෙන් බාල බව හෙළිදරව්වීමෙන් පසුව එම තොග සඳහා ගෙවීම් කිරීමට හේතු කවරේද;

(ඒ) නියත වශයෙන්ම පෙට්‍රල් හිඟයක් ඇති විය හැකිව තිබූ බව ජනතාවට දැනුම් නොදීමට හේතු කවරේද;

(ඓ) එබඳු ආනයනයන් සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් කවුරුන්ද;

(ඔ) ඉදිරියේදී එබඳු සිදුවීම් වැළැක්වීමට ගත යුතු පියවර කවරේද;

(ඕ) මෙම ආනයනයන් සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ග කවරේද; සහ

(ඖ) ප්‍රස්තුත කරුණුවලට සම්බන්ධ හෙයින් විමසා බැලීම යෝග්‍ය යැයි කාරක සභාවට හැඟෙන අන් කවර හෝ කරුණු,

පරීක්ෂා කර බැලීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(2) (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය,

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුන ද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

(3) එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතුය.

(4) සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 137/'11

14.

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා

ගරු වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා

ගරු ඩිව් ගුණසේකර මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු පෙරුමාල් රාජදුරයි මහතා

ගරු රාජීව විජේසිංහ මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ශ්‍රී ලංකාවේ ජනතාව එකම දේශයක ජනතාවක් ලෙස සවිබල ගැන්වීම පිණිස දේශපාලන හා ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග නිර්දේශකර වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

රටෙහි සහ එහි වැසියන්ගේ ආර්ථික, සාමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා ජාතියක් ලෙස එකමුතු වීමට සහ කටයුතු කිරීමට ශ්‍රී ලාංකික ජනතාවට අද්විතීය අවස්ථාවක් උදාවී ඇති හෙයින්ද,

මෙම කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ ජනතාවගේ සමගිය ප්‍රවර්ධනය කිරීමට සහ ඔවුන්ගේ ආර්ථික, සමාජයීය සහ දේශපාලන සංවර්ධනය සඳහා තීරණ ගැනීමට ඔවුන් සවිබල ගැන්වීම සඳහා පියවර ගැනීම කාලෝචිත හෙයින්ද,

පූර්වෝක්ත කරුණු සඳහා හැකියාව ලබා දීමට ගතයුතු පියවරවල ස්වභාවය හා විෂය පථය නිර්ණය කිරීම සඳහා වඩාත් සුදුසුකම් ඇත්තේ ජනතාවගෙන් තේරී පත්වූ නියෝජිතයන්ගේ කමිටුවක්වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශේෂ කාරක සභාවකට හෙයින්ද,

(අ) ශ්‍රී ලංකාවේ ජනතාවගේ සමගිය ප්‍රවර්ධනය කිරීම සඳහාත්,

(ආ) එකම දේශයක ජනතාවක් ලෙස ඔවුන් තවදුරටත් සවිබල ගැන්වීම සඳහාත්, සහ

(ඇ) ඔවුන්ගේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා තීරණ ගැනීම සහ ක්‍රියාමාර්ගවල නියැළීමට ඔවුනට හැකියාව ලබා දීම සඳහාත් වූ,

ශ්‍රී ලංකාවේ ජනතාවට යෝග්‍ය හා පිළිගතහැකි විසඳුමක් සඳහා වූ දේශපාලන හා ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග මෙම ගරු සභාවට මාස 06ක් ඇතුළත නිර්දේශ කිරීමට පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති, කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුනද, කාරක සභාව සාමාජිකයින් තිස් එක් (31) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එකී කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියමකර ගැනීමටත්;

(ආ) එය අවශ්‍ය යැයි සලකන ඕනෑම පුද්ගලයෙකු හෝ ලේඛනයක් කැඳවීමත්;

(ඇ) එසේ කැඳවනු ලබන ඕනෑම පුද්ගලයෙකු දිවුරුම් හෝ ප්‍රතිඥා මත ප්‍රශ්න කිරීමටත්;

(ඇ) කලින් කල පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද, සිය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමටත්;

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමටත්;

බලය තිබිය යුතු ය.

පා.149/’11

15.

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු නිර්මල කොතලාවල මහතා

ගරු මොහමඩ් අස්ලම් මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු ඩබ්ලිව්. බී. ඒකනායක මහතා

ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු රුවන් රණතුංග මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු සරණ ගුණවර්ධන මහතා

ගරු ජගත් බාලසූරිය මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු වයි. ජී. පද්මසිරි මහතා

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු පවිත්‍රා දේවී වන්නිආරච්චි මහත්මිය

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා

ගරු නිමල් විජේසිංහ මහතා

ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු අචල ජාගොඩගේ මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු සරත් කුමාර ගුණරත්න මහතා

ගරු තිස්ස කරල්ලියද්ද මහතා

ගරු හේමාල් ගුණසේකර මහතා

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු කනක හේරත් මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා

ගරු වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු වික්ටර් ඇන්ටනි මහතා

ගරු කමලා රණතුංග මෙනෙවිය

ගරු සිරිපාල ගමලත් මහතා

ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු පියසේන ගමගේ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු ගාමිණී විජිත් විජිතමුණි ද සොයිසා මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු ජේ. ආර්. පී. සූරියප්පෙරුම මහතා

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා

ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා

ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා

ගරු ඒ. එම්. චාමික බුද්ධදාස මහතා

ගරු ෆීලික්ස් පෙරේරා මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු එම්. බී. ෆාරුක් මහතා

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හිටපු අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මහතාට එරෙහිව බලය අයථා භාවිතය පිළිබඳවත්, විෂමාචාරය සහ/හෝ අවකල් ක්‍රියාව පිළිබඳවත් වූ චෝදනා පරීක්ෂාකර වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

එවැනි චෝදනාවලට අනුව ඔහු අධිකරණය අපකීර්තියට පත්කොට ඇති බව සඳහන් වන බැවින්ද,

අධිකරණයේ ස්වාධීනත්වය හා නීතියේ රීතිය ආරක්ෂා කිරීමට හා පවත්වාගෙන යෑමට ඔහු අපොහොසත්වූ බැවින්ද,

පහත සඳහන් කරුණු විමර්ශනයට ලක්කොට වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු බවට මේ පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අ) වැල්ලවාය හිටපු මහේස්ත්‍රාත් ජනක බණ්ඩාර මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ ඉල්ලා අස්වීම ඉදිරිපත් කිරීම පිණිස ඔහුට බලපෑම් එල්ල කරනු ලැබුවේද යන වග,

(ආ) කොළඹ, හිටපු අතිරේක මහේස්ත්‍රාත් හිරාන් ඒකනායක මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය ද්වේෂ සහගත ලෙස අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඇ) හිටපු මහේස්ත්‍රාත් සුනිල් ලෝරන්ස් ද කොස්තා මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඈ) මාතර හිටපු අතිරේක දිස්ත්‍රික් විනිශ්චයකාර අනුර බණ්ඩාර මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඉ) මාළිගාකන්ද හිටපු මහේස්ත්‍රාත් ඩී. එම්. සිරිවර්ධන මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඊ) මීගමුව හිටපු දිස්ත්‍රික් විනිශ්චයකාර පාලිත බණ්ඩාරනායක මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(උ) නුවරඑළිය හිටපු දිස්ත්‍රික් විනිශ්චයකාර ප්‍රභාත් ද සිල්වා මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඌ) කැබිතිගොල්ලෑව හිටපු මහේස්ත්‍රාත් ඩී. එම්. ටී. බී. දිසානායක මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(එ) කොළඹ, හිටපු අතිරේක මහේස්ත්‍රාත් හැරල්ඩ් විජේසිරි ලියනගේ මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඒ) මොරවක හිටපු මහේස්ත්‍රාත් කේ. ඩී. ඩී. කේ. ද ආබෘ මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඔ) බලපිටිය, හිටපු මහේස්ත්‍රාත් වයි. එල්. ධර්මසේන මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ඕ) මහනුවර, හිටපු අතිරේක මහේස්ත්‍රාත් නන්දන වීරසිංහ මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ක) කන්තලේ හිටපු මහේස්ත්‍රාත් ඒ. එම්. ඩී. එස්. දික්කපිටිය මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ග) ඇල්පිටිය හිටපු දිස්ත්‍රික් විනිශ්චයකාර ජී. ඩී. කුලතිලක මහතාගේ සේවය අත්හිටුවීමට තුඩුදුන් කරුණු සහ ඔහුගේ සේවය අත්හිටුවනු ලැබුවේද යන වග;

(ච) ඉහත සඳහන් අවස්ථාවලට අමතර වශයෙන් අධිකරණ සේවයේ නිලධාරීන්ගේ සේවාවන් ද්වේෂසහගත ලෙස අවසන් කරනු ලැබූ අවස්ථාවන්;

(ජ) කොළඹ 7, විජේවර්ධන මාවතේ අංක 129 දරන ස්ථානයේ පිහිටි අග්‍රවිනිශ්චයකාර නිල නිවසේ පවත්වා ගෙන යමින් තිබූ විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ භාරකරු වශයෙන් අධිකරණය ඉදිරියේ චෝදනා ගණනාවක් එල්ලවී තිබූ රෝහණ කුමාර නමැති පුද්ගලයකුට ගරු සරත් එන්. සිල්වා මහතා විසින් පත්වීමක් ලබා දුන්නේද යන වග;

(ට) ගරු සරත් එන්. සිල්වා මහතා ගරු අධ්‍යක්ෂවරයෙකු වශයෙන් සේවය කරනු ලබන බෞද්ධ ගුවන්විදුලි සේවාව ස්ථාපනය කරනු ලැබීමට තුඩුදුන් කරුණු සහ ද බුඩිස්ට් රූපවාහිනී නාලිකාව (The Buddhist TV Channel) ආරම්භ කිරීමට රුපියල් මිලියන 65ක ප්‍රදානයක් ලබා දුන් මුහුන්තන් කානගී පෙත්සම්කරු වශයෙන් පෙනී සිටි සී. බී. එන්. චන්ද්‍රිකා (CBN Sat) නඩුවේ තීරණයට අදාළ කරුණු;

(ඩ) පාර්ලිමේන්තුව නවීකරණය කිරීම, ප්‍රජාතන්ත්‍රවාදය සහ සංවර්ධනය පිළිබඳ ලෝක බැංකු/එජාස වැ‍යා. (World Bank/ UNDP) ආධාර ව්‍යාපෘතියේදී ගරු සරත් එන්. සිල්වා මහතා විසින් ඉටු කරන ලද කාර්යභාරයට අදාළ කරුණු;

(න) අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් ගරු සරත් එන්. සිල්වා මහතා සේවය කරන ලද කාල සීමාව ඇතුළත ඔහුගේ ද්වේශසහගත ක්‍රියා හේතුවෙන් වෙනත් කිසියම් පුද්ගලයන්ට අගතියක්ද සිදුවී ඇත්ද යන වග.

(2) (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකවරයා විසින් නම් කළයුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95හි විධි විධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයන් තිස්එක් දෙනෙකුට (31) නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

(3) එකී කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමටද,

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමටද, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමටද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමටද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වා ගෙන යාමටද

බලය තිබිය යුතුය.

පා. 150/'11

16.

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු පී. හැරිසන් මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු අනෝමා ගමගේ මහත්මිය

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා

ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු රවී කරුණානායක මහතා,— 2011 දෙසැම්බර් මස 1 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව මගින් අවධානයට ලක්කර තිබෙන රජයට අයත් ව්‍යාපාරවල පාඩු පිළිබඳව පරීක්ෂාකර ඒවාට වගකිව යුතු අයට එරෙහිව ගත යුතු පියවර හා ඒවා නිවැරදි කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශකර වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තාව එම කාරක සභාවේ සභාපති හා මානව සම්පත් අමාත්‍ය ගරු ඩීව් ගුණසේකර මහතා විසින් 2011 දෙසැම්බර් මස 1 වැනි දින ඉදිරිපත් කරන ලද හෙයින්ද;

රජයට අයත් පාඩු ලබන ආයතන සහ ව්‍යාපාර ගණනාවක් එම වාර්තාව මගින් අවධානයට ලක්කර ඇති හෙයින්ද;

එම ආයතන අතර වඩාත් කැපී පෙනෙන්නේ පහත සඳහන් ආයතන හෙයින්ද;

1. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල
2. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය
3. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව
4. ශ්‍රී ලංකන් ගුවන් සේවය
5. සීමාසහිත මිහින් ලංකා සමාගම
6. ශ්‍රී ලංකා වරාය අධිකාරිය
7. මාර්ග සංවර්ධන අධිකාරිය සහ

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය බංකොලොත්භාවයට පත් වී ශ්‍රී ලංකා රජය විසින් එම තත්ත්වයෙන් මුදවා ගත යුතුව පවතින බවද හෙළිදරව් වී ඇති හෙයින්ද;

මෙම පාඩු ශ්‍රී ලංකාවේ මූල්‍ය තත්ත්වය තද බල ලෙස පිරිහීමට හේතුවන හෙයින්ද;

මෙම ආයතන පවත්වාගෙන යාමේ හා ඒවා පත්ව ඇති තත්ත්වයෙන් මුදවා ගැනීමේ පිරිවැය අවසානයේදී දැරීමට සිදුවන්නේ මහජනතාවට වන හෙයින් සහ

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව කෙරෙහි පැවරී ඇති බලතල, එය වාර්තා ඉදිරිපත් කිරීමට පමණක් සීමා කරන අතර තමන් හෙළිදරව් කරගන්නා ලද කරුණු සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීමේ භූමිකාවක් එය සතුව නොමැති හෙයින් ද;

(අ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේ පිළිබිඹු කෙරෙන මෙම ආයතනවල, විශේෂයෙන්ම මෙහි ලැයිස්තුගතකර ඇති ආයතනවල කටයුතු සොයාබලා ඒවා පාඩු ලැබීමට හේතු නිශ්චය කිරීම සඳහා ද;

(ආ) යම් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් මෙම ආයතනවල කළමනාකරණය සඳහා වගකිව යුතු ද යන්න සහ වංචා සහගත ක්‍රියාකාරකම්වලට සම්බන්ධව සිටී ද යන්න නිශ්චය කිරීම සඳහා ද;

(ඇ) මෙම පාඩු දිගින් දිගටම සිදුවීම වැළැක්වීම සඳහා ද;

(ඈ) වගකිව යුත්තන්ට දඬුවම් කිරීම පිණිස මුල් අවස්ථාවේදී ගතයුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා ද;

(ඉ) මෙම පාඩු පියවා ගැනීම සඳහා ගත යුතු පියවර තීරණය කිරීම සඳහා; සහ

(ඊ) පාර්ලිමේන්තු අයවැය කාර්යාංශයක් ස්ථාපනය කිරීම ඇතුළුව, වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය අතිරේක නීති කවරේද යන්න නිශ්චය කිරීම සඳහා ද;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මෙම කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එම කාරක සභාවට—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමටද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමටද, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමටද, එබඳු තැනැත්තෙකුගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපි ලේඛන, පොතක්, ලේඛනයක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමටද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව පරීක්ෂා කිරීම මගින් සත්‍ය අසත්‍යතාව විමසීමෙන් හෝ අන්‍යාකාරයකින් තහවුරු කරගැනීමටද, කාරක සභාවේ සභාපතිවරයා හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරන ලද තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ හෝ ප්‍රතිඥා දීමට සලස්වනු ලැබූ සාක්ෂිකරුවන් පරීක්ෂා කිරීමටද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කලට අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතු ය.

4. කාරක සභාව, එහි පළමු රැස්වීමේ සිට එක් වර්ෂයක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් නියම කෙරෙන වෙනත් හෝ වැඩිමනත් කාලයක් තුළ සිය වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.

පා. 156/'12

17.

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු මංගල සමරවීර මහතා

ගරු පී. හැරිසන් මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— 2011 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල සම්බන්ධ ගැටලු පරීක්ෂා කර බලා ඒවා නිරාකරණය කර ගැනීමට අවශ්‍ය ප්‍රතිකර්ම නිර්දේශ කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2011 අධ්‍යයන වර්ෂය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම බරපතළ ගැටලු ඇති කොට ඇති හෙයින්ද;

විවිධ පාර්ශ්ව විසින් පරස්පර විරෝධී ප්‍රකාශ සිදු කරමින් ඇති හෙයින්ද;

ගැටලු ඇති වී ඇත්තේ තාක්ෂණික දෝෂ හේතුවෙන් බව සමහර පාර්ශ්ව ප්‍රකාශ කරන හෙයින්ද;

ප්‍රතිඵල නිකුත් කිරීමේදී ඇතිවූ අනවශ්‍ය හදිසිය සම්බන්ධයෙන් තවත් සමහර අය චෝදනා කරන හෙයින්ද;

අදාළ නිලධාරීන්ගේ අකාර්යක්ෂමභාවය නිසා ගැටලු මතුවී ඇතැයි තවත් සමහරු චෝදනා කරන හෙයින්ද;

විභාග කොමසාරිස්වරයා ස්වකීය ධුරයෙන් මුදා හැර ඇති හෙයින්ද;

මෙම කාරණය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට ජනාධිපතිවරයා තමා විසින්ම කොමිසමක් පත් කර ඇති හෙයින්ද;

සමස්ත ශිෂ්‍ය පරම්පරාවකම අනාගතය විපතට පත් කර ඇති හෙයින්ද;

අධ්‍යාපන පද්ධතිය පිළිබඳ විශ්වාසය දැඩිලෙස බිඳවැටීමට මෙය හේතු වී ඇති හෙයින්ද;

අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සහතික පිළිගැනීම සම්බන්ධයෙන් සැක මතුව ඇති හෙයින්ද;

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම සභාව යෝජනා සම්මත කරයි:—

(අ) Z ලකුණු ක්‍රමය සහ එය ක්‍රියාත්මක කරන ආකාරය පරීක්ෂා කිරීමට;

(ආ) මෙම ගැටලුවට පාදක වූ හේතු පරීක්ෂා කිරීමට;

(ඇ) 2011 වර්ෂය සඳහා වූ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල පිළිබඳ ගැටලු නිරාකරණය කර ප්‍රතිකර්ම නිර්දේශ කිරීමට;

(ඈ) එවැනි ගැටලු අනාගතයේදී ඇති වීම වළකාලීම සඳහා ගත යුතු පියවර නිර්දේශ කිරීමට; සහ

(ඉ) කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරන්නා වූ වෙනත් ප්‍රතිකර්ම නිර්දේශ කිරීමට

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළයුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95හි විධි විධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයන් විසිඑක් දෙනෙකුට (21) නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමටද;

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකු කැඳවීමටද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමටද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යැයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමටද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව පරීක්ෂා කිරීම මගින් සත්‍ය අසත්‍යතාව විමසීමෙන් හෝ අන්‍යාකාරයකින් තහවුරු කරගැනීමටද, කාරක සභාවේ සභාපතිවරයා හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරන ලද තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ හෝ ප්‍රතිඥා දීමට සලස්වනු ලැබූ සාක්ෂිකරුවන් පරීක්ෂා කිරීමටද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමටද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වා ගෙන යාමටද

බලය තිබිය යුතුය.

4. සිය පළමු රැස්වීම් වාරයේ සිට වසරක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් අවසර ලබා දෙන එවැනි වෙනත් හෝ වැඩිදුර කාලයක් ඇතුළත කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 157/'12

18.

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු කරු ජයසූරිය මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු මංගල සමරවීර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය

ගරු අනෝමා ගමගේ මහත්මිය

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු වසන්ත අලුවිහාරේ මහතා

ගරු පාලිත රන්ගෙ බණ්ඩාර මහතා

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු අර්ජුන රණතුංග මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු දුනේෂ් ගන්කන්ද මහතා

ගරු රෝසි සේනානායක මහත්මිය

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,—

මේ රටේ රැකියා විරහිත උපාධිධාරීන් අද වන විට 40,000කට වැඩි ප්‍රමාණයක් සිටින හෙයින් ද;

මෙම රැකියා විරහිත උපාධිධාරීන් සඳහා රජයේ රැකියා ලබා දීමේදී විධිමත් සහ සාධාරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොවන හෙයින්ද;

රජය විසින් රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා සැපයීමේදී දේශපාලන හිතවත්කම්, පවුල් සම්බන්ධතා, වෙනත් ඥාති සම්බන්ධකම් මත මෙකී පිරිසට රැකියා ලබා දීම සඳහා කටයුතු කරගෙන යනු ලබන හෙයින් ද;

"දේශපාලන ලැයිස්තු" මගින්, රැකියා විරහිත උපාධිධාරීන් සඳහා රජයේ රැකියා ලබා දීම අසාධාරණ, අවිධිමත් සහ රජයේ රැකියාවලට බඳවා ගැනීමේ පිළිගත් පරිපාටිය සහමුලින්ම උල්ලංඝනය කරනු ලැබ ඇති හෙයින් ද;

දේශපාලන පක්ෂපාතීත්වය සලකා රජයේ රැකියා ලබාදීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් කඩවී ඇති හෙයින් ද;

රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්මයන්හි 27(2)(අ) ව්‍යවස්ථාව මගින් මූලික අයිතිවාසිකම් සැබෑ ලෙස ක්‍රියාත්මක කිරීමේ වගකීම රජය වෙත භාර කර ඇති හෙයින් ද;

මෙසේ රැකියා ලබා දීමට හේතු වූ කරුණු කාරණා සම්බන්ධයෙන් සාධාරණ කරුණු දැක්වීමක් කිරීමට අදාළ අමාත්‍යවරයා අපොහොසත් වී ඇති හෙයින් ද;

රැකියා විරහිත උපාධිධාරීන්ට මෙසේ සැලකීම, මේ රටේ තරුණ සම්පත නිකරුණේ දේශපාලනඥයින් පසුපස යන පිරිසක් බවට පත් කිරීමේ මූලික අරමුණ ඇතිව ක්‍රියාත්මක වන්නක් බවට සැලකිය හැකි හෙයින් ද;

රාජ්‍ය සේවයට සීමිත තරග විභාගවලින් රාජ්‍ය නිලධාරීන් බඳවා ගැනීමේදී තරග විභාග ප්‍රතිඵල ප්‍රසිද්ධ නොකරමින් සම්මුඛ පරීක්ෂණ මගින් ඔවුන් බඳවාගෙන පසුව ප්‍රතිඵල නිකුත් කිරීම මගින් රාජ්‍ය සේවයට බඳවා ගැනීම පිළිබඳව කිසිදු විනිවිදභාවයක් නොමැතිවීමෙන් රටේ අති බහුතරයකින් යුත් උගත් තරුණ පරපුරට අසාධාරණයක් වන හෙයින්; සහ

රාජ්‍ය නිලධාරීන්ගේ පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, පිළිබඳව ඇති ස්වාධීන රාජ්‍ය ආයතනය වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්වාධීන ලෙස ක්‍රියාත්මක කරවීමට ඇති ඉඩකඩ අහුරා ඇති හෙයින් ද;

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා කෙරෙහි සභාවේ විශ්වාසය භංගවී ඇති බව මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*